

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකාව

හතලිස් දෙවන වාර්ෂික වාර්තාව

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு

இலங்கை

நாற்பத்தி இரண்டாவது வருடாந்த அறிக்கை

UNIVERSITY GRANTS COMMISSION

SRI LANKA

FORTY SECOND ANNUAL REPORT

2020



විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකාව

හතලිස් දෙවන වාර්ෂික වාර්තාව

2020

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



දැක්ම

වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් / ලෝකයක් සඳහා දැනුමෙන් නායකත්වය සැපයීම



මෙහෙවර

සමාජ, පාරිසරික සහ මුල්‍යමය වශයෙන් ඉලක්ක ජය ගැනීමට උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් බිහිකිරීමට, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශක්තිමත් සම්බන්ධීකරණ පද්ධතියක් තුළින් ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ, ගුණාත්මක ඉගැන්වීම් සහ කර්මාන්ත කටයුතුවල නියැලීමට සහ උසස් තත්ත්වයේ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට පහසුකම් සලසාදීමට අවශ්‍ය කළමනාකරණය සහ යහපාලනය ඇති කිරීම.



අරමුණු

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට ප්‍රවේශය සමානව වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසියෙකු සඳහා අවශ්‍ය යැයි සැලකෙන සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙනුම් කටයුතු වල නියැලීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුලින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතින්වල විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක මානව සම්පත්, විශිෂ්ඨ පහසුකම් සහ කිරසාර/හරිත සංකල්ප හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රමිතිය සහතික කිරීම.
- ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායි පාර්ශවකරුවන්ගේ සබඳතා හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතවල පාලනය සහ කලමනාකරණය ශක්තිමත් කිරීම.

සභාපතිතුමාගේ පණිවුඩය



2020 වර්ෂයේ දී, කොමිෂන් සභාව විසින් ඇතැම් ප්‍රධාන කර්තව්‍යයන් අනාකූලනය කරනු පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන ඇති අතර සියලුම ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් පසුබිම ස්ථාපනය කරන ලදී. මෙම වෙනස්කම් ජනාධිපති කාර්ය සාධක බලකාය සහ උසස් අධ්‍යාපනය පිළිබඳ අණු මණ්ඩලයේ මැදිහත් වීමෙන් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරමින් පවති. තවද මෙම ප්‍රතිසංස්කරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිසංස්කරණය කිරීමේ 2020-2022 ක්‍රමෝපාය සැලසුම හා සමගාමී වන අතර රජයේ නව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබා දෙනු ලබයි.

උපක්‍රම 9කින් සමස්ථ උසස් අධ්‍යාපන කේෂ්ත්‍රය ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 50කට යටත් කර ඉතාමත් සරල පසුබිමක සියලුම කාර්යයන් වසර 5ක් තුළ නිමා කිරීමට සැලසුම් සකස් කර ඇත.

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල සඳහා 2019/2020 අධ්‍යයන වර්ෂය යටතේ බඳවා ගත් සිසුන් ප්‍රමාණය 10,027කින් ඉහළ නැංවිය. එය මෙතෙක් අධ්‍යයන වර්ෂයකදී විශ්වවිද්‍යාල ප්‍රවේශයේ සිදු වූ වැඩිම ඉහළ නැංවීම වේ. තව ද ලාංකීය සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ඇති අවස්ථා තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලට අනුයුක්තව 'දන්ත වෛද්‍ය පීඨයක්' සහ 'නාගරික හා ජලජ ජෛවසම්පත් පීඨයක්' ස්ථාපනය කරන ලදී. මෙම වසර සඳහා නව පාඨමාලා 16 ක් අලුතෙන් හඳුන්වා දීමට ද කටයුතු කරන ලදී. මීට සමගාමීව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 500ක් බඳවා ගැනීම සිදු කරනු ලැබූ අතර මෙය සෑම ඉදිරි වර්ෂ තුනකදීම අඛන්ඩව සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2) 2020 වර්ෂය තුල විවෘත විශ්වවිද්‍යාලය සඳහා සිසුන් 10,000 ක් ඇතුළත් කර ගන්නා ලද අතර ඉදිරි සෑම වර්ෂයකම ඒ අයුරින් සිසුන් ඇතුලත් කර ගැනීමට පියවර ගැනීම. විවෘත විශ්වවිද්‍යාලයට තාක්ෂණික පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කර පරිසණක පහසුකම් ලබා දීම. පාඨමාලා ගාස්තුව හා ඇතුලත් වීමේ ගාස්තුව ණය මුදලක් වශයෙන් ලබා දීමට කටයුතු කිරීම.

3) 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ සිසුන් සඳහා සහනදායී ණය පහසුකම් යටතේ මහජන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ලැප්ටොප් පරිසණක ලබා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

4) විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පවතින බොහෝ ගැටළු නිරාකරනය කරනු වස් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා පියවර ගැනීම.

5) හෙද විශ්වවිද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික හා පසුබිම සකසා අවසන් කොට ඇත. ඊට සමගාමීව විෂයමාලා සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරයි.

6) ගුරු පුහුණු විශ්වවිද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ලේඛන සකසා අවසන් කිරීම.

7) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය ලෙස ස්ථාපනය කිරීම සහ ඊට අදාළ නව පාඨමාලා බොහොමයක් හඳුන්වා දීම.

8) වව්නියා මණ්ඩපය විශ්වවිද්‍යාලයක් ලෙස පරිවර්තනය කිරීමට අවශ්‍ය නෛතික ලේඛන හා ආර්ථික පසුබිම සකසා අවසන් කිරීම. එම විශ්වවිද්‍යාලය මේ වසරේ අගෝස්තු මස 01 වන දා ආරම්භ කිරීමට නියමිතය.

9) පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය, පර්යේෂණ විශ්වවිද්‍යාලයක් ලෙස පරිවර්තනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

10) මානව හා සමාජ විද්‍යා, කලා හා සෞන්දර්ය පීඨ වල ඉගෙනුම ලබන සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහල නැංවීම උදෙසා රුපියල් මිලියන 400ක් වැය කොට අදාල විශ්වවිද්‍යාලයන් හී

තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශ හා පරිසණක විද්‍යාගාර පිහිටුවා එතුළින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යනායතනය (UCSC) මඟින් පිරිනමන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරීමට අවකාශය සැලසීම. එමඟින් රැකියා වෙළඳපොළට පිවිසීමට අවස්ථාව උදාවේ.

11) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යයනායතනය (UCSC) හා එකතුව නවක සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ හැදෑරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.
12) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යයනායතනය (UCSC) හා එකතුව නවක සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ හැදෑරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.
13) පුරවර විශ්වවිද්‍යාල (City Universities) පිහිටුවීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය අවසන් කොට එම ව්‍යාපෘතියෙහි ඉදිරි සැලසුම් සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීම.
14) මුළු විශ්වවිද්‍යාල පද්ධතියේම මානව සම්පත් කළමනාකරණය එක පද්ධතියකට ගෙන ඒම.
15) ශ්‍රී ලංකාවේ පළමු වතාවට සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල දේශන/ වැඩ මුළු හා විභාග මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීම.

පුළුල් සහභාගීත්වය සහ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් ඒ සඳහා පහසුකම් සැලසීමට දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍ය පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. ඒ අනුව නව පාඨමාලා හඳුන්වා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් නවක විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කර දීමට කටයුතු කරන ලදී.

විද්‍යාර්ථීන් ආචාර්ය උපාධි සඳහා විදේශ විශ්වවිද්‍යාලයන්හි හා හින්න ආචාර්ය උපාධි වැඩසටහන්වල ලියාපදිංචි වීමේ උනන්දුව ඉහළ නැංවීම පිණිස පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය ඉහළ නංවන ලදී. මෙය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය විෂය පථයට අයත් උසස් අධ්‍යාපන ආයතනවල (HEIs) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථීර සාමාජිකයින්ට ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීමට හැකියාව ලැබෙන පරිදි ඔවුන්ට මූල්‍ය ආධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ පරමාර්ථය වනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා සියළුම විෂයන්වලට සම්බන්ධ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීමට මූල්‍යමය වශයෙන් සහාය වීම යි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

පටුන

		පිටු අංකය
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	i
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය	ii
	පටුන	iv
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව[UGC]	
	හැඳින්වීම	vi
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය	vi
	විධායක සාරාංශය	vii
	වගු ලැයිස්තුව	xxvii
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන	xxviii
01	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය	1
02	විශ්වවිද්‍යාල කළමනාකරණය	2
03	ආයතන	7
04	විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම	9
05	අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම	19
06	මූල්‍ය පරිපාලනය	33
07	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව	39
08	මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය	41
09	යටිතල පහසුකම් සංවර්ධනය	44
10	තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු(QAC)	46
11	තොරතුරු තාක්ෂණ සහාය	48
12	නීති කටයුතු	49
13	විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)	52
14	මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු	52
15	ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්	53
16	ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය	55
17	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම	58
18	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	62
19	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	64
20	2020 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි	66
21	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020	69
22	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020	85
23	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020	94

24 තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව 2020..... 106

25 ඇමුණුම්

I. 2020 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක සංඛ්‍යාව 128

II. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තේරුණු ශිෂ්‍ය සංඛ්‍යාවන්
දිස්ත්‍රික් සහ අධ්‍යයන පාඨමාලාවන් හි වර්ගීකරණය (නව සහ පැරණි විෂය නිර්දේශය)..... 129

III. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයනන පාඨමාලාවන් සඳහා තේරුණු ශිෂ්‍ය සංඛ්‍යාවන්
දීප ව්‍යාප්ත සහ දිස්ත්‍රික් කුසලතාවන් හි වර්ගීකරණය (නව සහ පැරණි විෂය නිර්දේශය)..... 134

IV. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය හා විශේෂ ප්‍රවේශයන් යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව..... 144

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC)

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මග පෙන්වීම හා සම්බන්ධීකරණය සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 දෙසැම්බර් 22 වන දින අංක 16 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් අතරට උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතනවලට මුදල් වෙන් කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය හා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සියලුම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය වීම අයත් වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 15ක්, පශ්චාත් උපාධි ආයතන 10ක්, ආයතන 9ක් හා 1ක් මධ්‍යස්ථානයක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
4. උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලනය නියාමනය කිරීම.
5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරී සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2020 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. සමාලෝචිත වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගිත්වය හා පර්යේෂණ සහයෝගිත්වය යන ක්ෂේත්‍රයන් යටතේ සාරාංශ කර ඇත.

2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලැස්ම සමඟ 2020 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, 2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි දක්වා ඇති ඉලක්ක, අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදි.

<u>2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කළ අතර 2019 අගෝස්තු මාසයේදී පැවැත්වුණු අ.පො.ස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2020 මාර්තු මාසයේ දී අපේක්ෂකයින්ගෙන් 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවන ලදී .ඒ අනුව, සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කර ඇති අතර, කඩඉම් ලකුණු 2020 ඔක්තෝබර් මාසයේ දී නිකුත් කරන ලදී. කෙසේ වෙතත් රටේ පවතින කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම සිදු කරමින් පවතින අතර එය 2021 දී අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ, 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ප්‍රධාන තොරතුරු පහත දැක්වේ.

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සංඛ්‍යාව	**181,144**
2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත සංඛ්‍යාව	**34, 161 ***
2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව	
1. සාමාන්‍ය ප්‍රවේශය යටතේ	**40,111****
2. විශේෂ බඳවා ගැනීම්, විශේෂ විධිවිධාන යටතේ - සන්නද්ධ සේවා, පොලිස් සේවය විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස්	**22**

සටහන : (*)අතිරේක ප්‍රවේශය ද ඇතුළුව

(**)අතිරේක බඳවා ගැනීම් සහ විශේෂ විධිවිධාන හැර - (අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන්, විෂය පරිහානිර කටයුතු සඳහා විශිෂ්ඨතාවයක් ඇති සිසුන් සහ ගුරුවරුන් ඇතුළත් කර ගැනීම තවමත් අවසන් කර නොමැත.)

විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීමේ අරමුණින් 2020 වර්ෂයේ දී 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නව අධ්‍යයන පාඨමාලා දෙකක් පහත පරිදි හඳුන්වා දෙන ලදී.

අංකය	පාඨමාලාවේ නම	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	රුහුණ විශ්වවිද්‍යාලය	50
2	මානව සම්පත් සංවර්ධනය	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	65

ඊට අමතරව, 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා පහත දැක්වෙන දැනට පවත්නා අධ්‍යයන පාඨමාලා වෙනත් විශ්වවිද්‍යාලවලට ද හඳුන්වා දෙන ලදී;

අංකය	පාඨමාලාවේ නම	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	වෛද්‍ය විද්‍යාව	මොරටුව විශ්වවිද්‍යාලය	60
2	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල	50
3	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල	100
4	පරිවර්තන අධ්‍යයනය	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	25
	එකතුව		**235**

අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය

උසස් අධ්‍යාපනයට පුළුල් සහභාගීත්වයක් සහ සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින්, දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍යකරණය කරන ලද පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. මෙම ප්‍රයත්නයට සහාය දැක්වීම සඳහා, 2020 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලදී;

- නව පීඨ හතරක් (04)
- නව අධ්‍යයනාංශ විසි හතක් (27)
- නව උපාධි වැඩසටහන් එකොළහක් (11)
- නව විශේෂවේදී උපාධි එකොළහක් (11)
- නව පශ්චාත් උපාධි වැඩසටහන් තිස් තුනක් (33)

තවද සිසුන්ට වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දීම සඳහා, රටේ වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව දැනුම හා කුසලතා හඳුන්වා දෙමින් පවත්නා උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව 2020 වර්ෂයේ දී අධ්‍යයනාංශ නාම වෙනස් කිරීම් 03 ක් සහ ප්‍රථම උපාධි පාඨමාලාවල නම් වෙනස් කිරීම් 101 ක් යෝජනා කරන ලදී.

2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාවර කමිටු 20 ක් සහ වෙනත් 1ක් කමිටුවක් ක්‍රියාත්මක වූ අතර එමඟින් විවිධ විෂය ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයට අදාළ කරුණු පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය (PTF) සහ උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) සමඟ පැවැත්වූ විවිධ රැස්වීම්වලදී

අධ්‍යයන වැඩසටහන් සහ ඇගයීම් පැවැත්වීමේ විකල්ප ක්‍රමවල වැදගත්කම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාකච්ඡා කරන ලදී . මෙම සාකච්ඡා මත පදනම්ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අනුගමනය කළ යුතු විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් භාවිතා කිරීම පිළිබඳව මාර්ගෝපදේශ සකස් කර ඇත. වැඩසටහන් ඉදිරිපත් කිරීමේ සහ ඇගයීමේ මෙම විකල්ප ක්‍රම ගෝලීය වශයෙන් අනුගමනය කර ඇති අතර කෝවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ මුහුණට මුහුණලා දේශන පැවැත්වීමට සහ සංවෘත ග්‍රන්ථ ලිඛිත විභාග පැවැත්වීමට ඇති නොහැකියාව හේතුවෙන් මෙම ප්‍රවණතාව සැලකිය යුතු ලෙස ප්‍රවලිත වෙමින් පවතී.

ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයේ ක්‍රියාකාරී සැලසුම් කමිටුවේ (සාමාජිකයින් 8 දෙනෙකුගේ) සහභාගීත්වයෙන් වැඩමුළුවක් 2020 අගෝස්තු 14 සහ 15 යන දින දෙකේදී පවත්වනු ලැබීය . මෙහි ප්‍රතිඵලය වූයේ පවත්නා ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයේ ඉම්ලකුණු පුළුල් ලෙස සංශෝධනය කිරීමයි.

‘ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය’, 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ‘ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)’ නමින් විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම සඳහා 2020.10.28 දිනැති 2199/12 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නියෝගයක් නිකුත් කරන ලදී.

මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉල්ලීම මත, රු.මිලියන 59,041 ක් 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද අතර එය භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද. මෙයට පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 49,497 ක් සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.මි. 9,545 ක් අයත් වේ. 2020 වර්ෂය අවසන් වන විට, වෙන් කරන ලද අරමුදල්වලින් 99% ක් සහ 100% ක් පිළිවෙලින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා යොදවා ඇති අතර, එය 99% ක එනම් රු.මි.59,002 ක ඒකාබද්ධ උපයෝජනයකි.

භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති යහ කළමනාකරණ පිළිවෙත් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලු වැදගත් අංශ අධීක්ෂණය කිරීමේ අරමුණින් 2020 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. තවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නිසි පාලනයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන් හි අභ්‍යන්තර විගණන අංශ සමඟ නිතිපතා සම්බන්ධීකරණය විය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල කටයුතු කළමනාකරණය

විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලය ද ඇතුළුව 2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සේවක සංඛ්‍යාව 325 ක් විය. 2020 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවය කළ කාර්ය මණ්ඩලය 255 කි. 2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ නව පත්වීම් 03 ක් ලබා දී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් 19 දෙනෙකුගේ සේවයේ ස්ථිර කර ඇත.

කොන්ත්‍රාත්තුව අවසන් වීම හේතුවෙන් එක් සේවකයෙකුගේ සේවය අවසන් වූ අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ එක් සේවකයෙකුව සේවයෙන් පහ කර ඇත.

2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ එක් අභ්‍යන්තර මාරුවීමක් පමණක් වාර්තා විය .කොමිෂන් සභා වක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් පස් දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

2020 වර්ෂයේ දී, පද්ධතිය තුළ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරුවීම් ලබා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයෙන් ඉවත් වූ පුද්ගලයින් ගණන දෙදෙනෙකි. සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලා අස්වීම් දෙකක් (02), විශ්‍රාම ගැන්වීම් තුනක් (03) සහ විශ්‍රාම යාමට පෙර ලබා ගන්නා නිවාඩු දෙකක් ලබා දීම සිදු කරන ලදී.

විශ්වවිද්‍යාල පද්ධතියට ඔවුන් විසින් සිදු කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවකයින් පස් දෙනෙකු (5) ඇගයීමට ලක් වූ අතර ඔවුන්ට මුදල් ප්‍රදානයන් පිරිනමන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා සහ වැඩ කරන දැනුම වැඩි දියුණු කිරීම සඳහා බොහෝ අවස්ථාවන් සලසා දෙන ලදී. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ, විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 01 ක් සහ විධායක නොවන කාර්ය මණ්ඩල සාමාජිකයන් 20 ක් දේශීයව පවත්වන ලද කෙටි කාලීන පුහුණු හා සංවර්ධන වැඩමුළු සඳහා සහභාගී වූහ.

2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා ආකර්ශනීය හා සාධාරණ ගාස්තුවකට පුද්ගලික ශිණුමෙන්ම පවුල් ආවරණයක් ලබා ගැනීමේ විකල්පය සමඟ සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් 2020 දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 956 ක් අනුමත කරන ලදී. අලුතින් පිහිටුවන ලද ගම්පහ වික්‍රමරාච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM) සඳහා සේවක තනතුරු 272 ක් අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් සිදු කිරීමට පැවරී ඇති වගකීම යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 දී පරිපාලන ශ්‍රේණියේ පත්වීම් 17 ක් සිදු කරන ලදී. මීට අමතරව, වසර තුළදී වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් 21 ක් සහ උසස්වීම් 17 ක් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 139 ක් සඳහා ද පහසුකම් සලසන ලදී.

2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 540 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබූ අතර එම කටයුතු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාවට නැංවේ.

සංශෝධිත 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පවරා ඇති බලතල, රාජකාරි හා කාර්යයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේ දී කොමිෂන් සභා වක්‍රලේඛ 16 ක් සහ ආයතන වක්‍රලේඛ ලිපි 7 ක් නිකුත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යයාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් මෙම වක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහාය සහ මූල්‍යාධාර ලබා දීම

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් තරුණ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය,මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළේය. මෙම කටයුතු මූලික වශයෙන් පර්යේෂණ හා ජාත්‍යන්තර සහයෝගීතා අංශය (DRIC) හරහා සිදු කරන ලද අතර ඒවා පහත පරිදි වේ;

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථීර සේවයේ නිරත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි .මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ සියළුම අංශයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීමයි.

ප්‍රදානයේ මුළු වටිනාකම විෂය, අධ්‍යයන වැඩසටහනේ ස්වභාවය සහ වැඩසටහන පවත්වන රට අනුව වෙනස් වේ. 2020 දී ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා අයදුම්පත් 17 ක් සහ රුපියල් මිලියන 67 ක අයවැයක් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙ හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කරන ලදී.
- ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් උසුලන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒකාබද්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණඩල සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒකාබද්ධ/ භින්න ආචාර්ය උපාධි වැඩසටහනක් දියත් කළේය

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (PhD) සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සම අනුග්‍රාහක ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර තිබේ.
- රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

උසස් අධ්‍යාපන ආයතනයන් හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

2020 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු .මිලියන.9545 ක මුදලක් වෙන් කරන ලදී .2020 වසර අවසන් වන විට රු .මිලියන.9545ක් වන මුළු මුදල, භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 34 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති යෝජනා 16ක් පමණි. රේඛීය අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 16 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. 2020 වර්ෂයේ දී, භෞතිකව වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන 9ක් වන අතර විශ්වවිද්‍යාළ පද්ධතිය තුළ වටිනාකම රු.මිලියන 30,865ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 91ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9521ක් වන ව්‍යාපෘති 21ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත. විස්තර පහත දැක්වේ.

පහත දැක්වෙන්නේ 2020 වර්ෂය තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් ය.

- ප්‍රධාන පුස්තකාලයේ දීර්ඝ කිරීමට යෝජිත කොටස - පේරාදෙණිය විශ්වවිද්‍යාලය - රු.මි.252.6
- පරිගණක මධ්‍යස්ථානය, ඉංජිනේරු ගණිතය සහ ඉංජිනේරු කළමනාකරණය අධ්‍යයනාංශ සඳහා වන ගොඩනැඟිල්ල - පේරාදෙණිය විශ්වවිද්‍යාලය - රු.මි. 294.2
- කාර්ය මණ්ඩල නිල නිවාස - අබේරත්න මාවත, බොරලැස්ගමුව - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- රු.මි.122.3
- තාක්ෂණ පීඨය සඳහා වන ගොඩනැගිල්ල - වැඩ අංශ පරිපාලන සහ ශාස්ත්‍රීය ගොඩනැගිල්ල - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - රු.මි. 3,073.0

පහත දැක්වෙන්නේ 2020 වර්ෂය තුළ ආරම්භ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘතීන් ය.

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ සහ සේවා සඳහා වන බහුකාර්ය ගොඩනැගිල්ල - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - රු.මි.1,183.9
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය සඳහා වන බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - රු.මි.1,598.4
- ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා වන ගොඩනැගිලි ඉදිකිරීම අදියර -II - යාපනය විශ්වවිද්‍යාලය - රු.මි.645.0
- වෛද්‍ය පීඨය සඳහා වන අතුරු වෛද්‍ය සායනික ගොඩනැගිල්ල අදියර -I - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය -රු.මි.1,013.9
- යෝජිත තාක්ෂණ පීඨය - II කොටස - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - රු.මි.1,685.0

තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී .විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා /පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ .

පහත දැක්වෙන්නේ 2020 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.
- මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම
    - පිරිස් අංශය සඳහා රක්ෂණ කළමනාකරණ පද්ධතිය
    - පිරිස් අංශය සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතිය
    - වාහන වෙන්කිරීමේ පද්ධතිය
    - උසස්වීම් සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවීමේ පද්ධතිය
    - මාර්ගගත ප්‍රේරණ පුහුණු වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය

විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම

2020 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මුළු මුදල වූ රු.මිලියන 2125 ක් විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලෙස වෙන් කර / ලබාගෙන සහ ගෙවීම් සිදු කර ඇත. ඒ අනුව, රු.මි.1,420 ක් මහපොළ ශිෂ්‍යත්ව වශයෙන් හා රු.මි.705 ක් ශිෂ්‍යාධාර ලෙස ලබා දෙන ලදී.

කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කටයුතු සහ සහාය

2020 දී කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් 2019 - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛනවලට අදාළ වැදගත් ප්‍රකාශන / වාර්තා හතරක් ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 'විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන්වල උපාධි අපේක්ෂකයෙකු සඳහා වන ඒකක පුනරාවර්තන පිරිවැය විශ්ලේෂණය - 2019' කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද අතර විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල නේවාසිකාගාර, ශිෂ්‍යත්ව, ලියාපදිංචි ගාස්තු සහ ආපනශාලා පහසුකම් පිළිබඳ තොරතුරු සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කටයුතු

කොවිඩ් 19 වසංගත තත්ත්වය ඇති වීමත් සමඟ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට 2020 වර්ෂය වඩාත් අභියෝගාත්මක එකක් බවට පත්විය. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයාව 2020 සැප්තැම්බර් මාසයේදී වෙනස් කරන ලදී .එහෙයින්, තත්ත්ව ආරක්ෂණය පිළිබඳ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ස්ථාවර කමිටුවේ (SC) සභාපතිවරයා සහ සාමාජිකයින් විසින් තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය මග පෙන්වීම සහ සහාය ලබා දෙන ලදී .ඒ අනුව පහත සඳහන් කටයුතු සිදු කර ඇත;

- 2020 තුන්වන කාර්තුව (Q3) වන විට CQA 14/15 ක් ලබා, කාර්ය සාධන ලකුණු කාඩ්පතේ 75% කට වඩා වැඩි අගයක් ලබා ඇති අතර ඒ අනුව, එය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ඉලක්කය ඉක්මවා ඇත.
- 2020 අවසන් වන විට CQA වලින් 93% ක් හා කාර්ය සාධන ලකුණු කාඩ්පතෙන් 75% කට වඩා ලබාගෙන ඇත. එනම්, 2021 වර්ෂය සඳහා AHEAD විසින් නියම කරන ලද ඉලක්කය සපුරා ඇත. (75% දී CQA ලකුණු වලින් 80% ක්)
- 2020 පළමු කාර්තුව අවසන් වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාල 12 ක් (2019 දී 8 ක් සහ 2020 දී 4 ක්) වෙත ගොස් අධීක්ෂණය කර ඇත.

2019 වර්ෂයට අදාළ ආයතනික සමාලෝචන කිරීමට ඉතිරිව තිබූ විශ්වවිද්‍යාල තුන වෙත ගොස් එම කටයුතු 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී අවසන් කර ඇත .2020 ආයතනික සමාලෝචන සඳහා විශ්වවිද්‍යාල දෙකකින් ස්වයං ඇගයීම් වාර්තා (SER) ලැබී ඇත .කොවිඩ්- 19 හේතුවෙන් අනෙකුත් විශ්වවිද්‍යාල අධීක්ෂණය කිරීමට යාම 2021 වර්ෂය දක්වා කල් තබන ලදී.

- 2020 දෙසැම්බර් වන විට වැඩසටහන් සමාලෝචන 32 ක් සඳහා වන සමාලෝචන වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් ලැබී ඇත. 2019 දී ආරම්භ කරන ලද සියලුම අධ්‍යයන වැඩසටහන් 41 (වෛද්‍ය, පශු වෛද්‍ය විද්‍යාව, දන්ත වෛද්‍ය විද්‍යාව, සම සෞඛ්‍ය විද්‍යාව, ආහාර විද්‍යාව, සත්ත්ව විද්‍යාව හා කෘෂිකර්මය) සඳහා වන වැඩසටහන් සමාලෝචන 2020 වසරේ දී අවසන් කරන ලද අතර සමාලෝචන වාර්තා ද සකස් කර අවසන් කරන ලදී. 2020 වසරේ දී විද්‍යා, ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ භූ නිර්මාණවේදය පිළිබඳ වැඩසටහන් සමාලෝචන 59 ක් සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලැබී ඇත.
- ***පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය සඳහා අත්පොතක්*** සංවර්ධනය කිරීම AHEAD ව්‍යාපෘතියේ සහාය ඇතිව ආරම්භ කරන ලද අතර එය 2021 වැඩසටහන් සමාලෝචන සඳහා යොදා ගැනීමට නියමිතය.
- 2020 දී ආයතනික හා වැඩසටහන් සමාලෝචකයින් හා ස්වයං ඇගයීම් වාර්තා ලේඛකයින් සඳහා තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් වෙනම වැඩමුළු දෙකක් පවත්වන ලදී. වැඩසටහන් සමාලෝචන සඳහා වන නව සමාලෝචකයින් වෙනුවෙන් Zoom තාක්ෂණය ඔස්සේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනට විද්වතුන් 112 ක් සහභාගී වූ අතර ඉන් 83 දෙනෙකු වැඩසටහන් සමාලෝචකයින් වීමට සුදුසුකම් ලැබුහ.

2020 වර්ෂය තුළ විෂය ඉම් ලකුණු ප්‍රකාශන සංවර්ධනය කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත .මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන් සඳහා වන විෂය ඉම් ලකුණු පිළිබඳ වැඩමුළුවක් 2020 මාර්තු 11 වන දින පැවැත්වූ අතර ඉතිහාසය, සිංහල, භූගෝල විද්‍යාව, ජන සන්නිවේදනය, ඉංග්‍රීසි සහ දර්ශනය යන විෂය කමිටු සඳහා නාමයෝජනා ලබා ගන්නා ලදී .මෙම නාමයෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටු විසින් අනුමත කළ යුතුය .ඉංග්‍රීසි හා සමාජ විද්‍යාව සඳහා වන ඉම් ලකුණු කමිටු සඳහා අනුමැතිය හිමි වී ඇත.

2020 දී, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් යෝජනා 233 ක් (සංශෝධිත හා නැවත සංශෝධිත යෝජනා ඇතුළුව) ඇගයීමට ලක් කරන ලද අතර එය ප්‍රථම උපාධි යෝජනා 94 කින් සහ පශ්චාත් උපාධි යෝජනා 98 කින් සමන්විත විය. නව පීඨයක් පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා 04 ක් සහ නව අධ්‍යයනාංශ පිහිටුවීම සඳහා ඉදිරිපත් කළ යෝජනා 29 ක් ඇගයීමට ලක් කරන ලදී.

එබැවින්, තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව නව බාහිර උපාධි වැඩසටහන් අනුමත කිරීම සඳහා වන අයදුම්පත සංශෝධනය කරන ලදී .සංශෝධිත අයදුම්පත, නව පූර්ණ කාලීන උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි සුදුසුකම් අනුමත කිරීම සඳහා භාවිතා කරන ක්‍රමයට සමාන වන අතර යෝජිත සුදුසුකම් SLQF 2015 අවශ්‍යතාවන්ට අනුකූලද යන්න තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවට ද සහතික වනු ඇත.

2020 කාලය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ක්‍රියාත්මක කර ඇති අනෙකුත් කටයුතුවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමන උපාධි වැඩසටහන් වල ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ මට්ටම් පිළිබඳව සහ මහජනතාව සිදුකරන විමසීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සැපයීම;
- විශ්වවිද්‍යාලවල තත්ත්ව ආරක්ෂණ කටයුතුවල දී සිසුන්ගේ සහභාගිත්වය; සහ
- පොදු අධ්‍යයන දින දර්ශනයක් පවත්වා ගැනීමට සහාය වීම සම්බන්ධ ක්‍රියාකාරකම්

ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය (GEE), ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන වල නවකවදය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී පුරුෂ සමාජභාවමයට ගරු කරමින් කටයුතු කරන ඉගෙනීම් පරිසරයක් නිර්මාණය කිරීමේ ආයතනික හැකියාව සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පීඩාවන්ගෙන් හා වෙනස් කොට සැලකීමකින් තොරව තම වැඩ කටයුතු කරගෙන යාමට ඉඩ සලසන, ස්ත්‍රී පුරුෂ සමාජභාවමය පිළිබඳ සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතීන් සහ විශ්වවිද්‍යාල පරිසරයන් ඇති කිරීමට පහසුකම් සැලසීම මගින් විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. ඒ අනුව, පහත දැක්වෙන්නේ ඉහත කාරණාව සාක්ෂාත් කර ගැනීම උදෙසා 2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්ය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය (www.ugc.ac.lk/sgbv/), නවකවදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය (www.ugc.ac.lk/rag) සහ ඇමතුම් මධ්‍යස්ථානය (+94 112 123 700) හා නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය ඇතුළත් කොමිෂන් සභාවේ මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
- නවක වදයට ගොදුරු වූවන්ට සහන සැලසීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල (HEIs) නවක වදය සම්බන්ධ අනිසි හැසිරීම් වැළැක්වීම සඳහා නියාමන යාන්ත්‍රණයක් සැපයීමට කමිටුවක් පත් කිරීම.

- ශිෂ්‍ය විනය සඳහා ස්ථාවර කමිටුවක් (SCSD) පිහිටුවීමට මූලික පියවර ගන්නා ලදී. මෙම ස්ථාවර කමිටුවේ පරමාර්ථය වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් නවක වදය තුරන් කිරීමයි.
- නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ එහි සමාජ හා නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම පිළිබඳව දැනුවත් කිරීමට ඊට අදාළ තොරතුරු ලේඛන මුද්‍රණය කර, 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගන්නා නවක සිසුන් වෙත යැවීම.
- කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020 "ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාල/ මණ්ඩප/ආයතනවලට නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සිදු කරන පැමිණිලි" නිකුත් කරන ලදී.
- "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක් සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම සඳහා මැදිහත්වීම් සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම / යෝජනා කිරීම" යුනිසෙෆ් හි මූල්‍ය සහයෝගය ඇතිව අදියර දෙකකින් (02) සිදු කරන ලදී.

රාජ්‍ය අධ්‍යාපනයට කොවිඩ් -19 හේතුවෙන් එල්ල වූ බලපෑම

දළ බඳවා ගැනීමේ අනුපාතය, සේවා නියුක්තිය, දැනුම් ආර්ථිකයක් සඳහා උපාධිධාරීන්ගේ සංයුතිය, ගුණාත්මකභාවය හා අදාළත්වය, උපාධිධාරීන් සමත්ව විශ්වවිද්‍යාලයෙන් පිට වන වයස, පර්යේෂණ හා නවෝත්පාදන සඳහා විශ්වවිද්‍යාල ලබා දෙන දායකත්වය වැනි ප්‍රධාන දර්ශකයන්ට අනුව ශ්‍රී ලංකාව සම කාලීන රාජ්‍යයන්ට වඩා බොහෝ පසුපසින් සිටින අතර සැලකිය යුතු ප්‍රතිසංස්කරණ සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. විශ්වවිද්‍යාලවල ඉගැන්වීම සහ ඉගෙනීම, විභාග පැවැත්වීම, පර්යේෂණ හා සංවර්ධනය සහ විශ්වවිද්‍යාලවලට සිදු කරන නව බඳවා ගැනීම් සඳහා කොවිඩ් -19 වසංගතය සැලකිය යුතු ලෙස බලපෑමක් එල්ල කර ඇති අතර එම බලපෑම අවම කිරීම සඳහා තවදුරටත් හදිසි ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

මෙම තත්ත්වයට පිළියම් යෙදීම සඳහා, වර්තමාන තත්ත්වය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක්, අතීත වාර්තා සමාලෝචනය, ප්‍රතිපත්ති නිර්දේශ, තෝරාගත් රටවල් කිහිපයක් ගෙන ඇති සාර්ථක ක්‍රියාමාර්ග, තීරණාත්මක ගැටළු සහ අවහිරතා පිළිබඳව අවධානය යොමු කළ අතර උසස් අධ්‍යාපනයට කොවිඩ් -19 වසංගතය නිසා එල්ල වන බලපෑම අවම කිරීම සඳහා පමණක් නොව ඇති ගරු ජනාධිපතිවරයාගේ සහ ශ්‍රී ලංකා රජයේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව ප්‍රතිපත්ති අත්‍යවශ්‍යතාවයන්ට අනුකූලව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නවීකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නිර්දේශයන් සපයන ලදී.

අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම් සහ නිර්දේශයන් පහත දැක්වේ.

කෝවිඩ් -19 හේතුවෙන් එල්ල වූ බලපෑම හා එය අවම කිරීමට විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ගත් පියවරයන්

කොවිඩ් -19 හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා දැමීමට සිදු වූ විට, ආයතනික, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ අධ්‍යයන අභියෝග කිහිපයක් තිබියදීත්, ප්‍රමාදයන් අවම කර ගත හැකි වන පරිදි සෑම

විශ්වවිද්‍යාලයක්ම පාහේ මාර්ගගත / දුරස්ථ ක්‍රමවේදය හරහා හැකි තරම් සහය ලබා දීමට පියවර ගන්නා ලදී. කලා හා මානව ශාස්ත්‍ර පීඨවල සිසුන් ද ඇතුළුව බොහෝ සිසුන් අධ්‍යයන වැඩසටහන, භාෂා මාධ්‍ය නොසලකා අන්තර්ජාලය හරහා ඉගෙනීමට මහත් උනන්දුවක් හා කැමැත්තක් දක්වා ඇති බව සිත්ගන්නා කරුණකි. එමෙන්ම මාර්ගගත/ දුරස්ථ ඉගෙනීම සඳහා සිසුන්ගේ සහභාගීත්වය අපේක්ෂා කළ මට්ටම ඉක්මවා ගොස් තිබුණි.

සැපයුම් හා කාර්ය පටිපාටික කරුණු කිහිපයක් හේතුවෙන් කිසිදු විශ්වවිද්‍යාලයක් විසින් සමාසික විභාග අවසන් කර නොතිබූ බැවින් බලපෑමට ලක් වූ කාල පරිච්ඡේදය තුළදී, මාර්ගගත / දුරස්ථ තක්සේරුකරණ ක්‍රමවේදයන් භාවිතා කිරීම සහ වාචික පරීක්ෂණ පැවැත්වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

සමහර තීරණාත්මක අභියෝග ජය ගැනීම සඳහා පහත සඳහන් නිර්දේශ ලබා දී ඇත.

- සියළුම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තුළ නිසි පරිදි ස්ථාපිත ඉගෙනුම් කළමනාකරණ පද්ධති, 24/365 ක්‍රියාත්මක මාර්ගගත සේවාව සඳහා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, සෑම පීඨයකම විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානයක් සහ සුදුසුකම් ලත් තාක්ෂණික කාර්ය මණ්ඩලයක් ඇති බවට සහතික වීම.

- ඉගෙනුම් කළමනාකරණ පද්ධති, අධ්‍යාපන ක්‍රියාවලියේ කොටසක් බවට පත් කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන ආයතන තුළ විධිමත් ප්‍රතිපත්ති සහතික කිරීම සහ මිශ්‍ර / මාර්ගගත ඉගැන්වීම් මෙන්ම පාඨමාලා සංවර්ධනයට ගැලපෙන පරිදි අවශ්‍ය විෂයමාලා සංශෝධන සමඟ ඉගෙනුම් කළමනාකරණ පද්ධති තුළ මාර්ගගත පාඨමාලා ආරම්භ කිරීමට කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීම.

- මාර්ගගත / දුරස්ථ ඉගෙනීම සඳහා අධ්‍යාපන පාඨමාලා සැලසුම් කිරීම නිර්මාණාත්මක ක්‍රියාවලියක් වන අතර එසේ පාඨමාලා ඉගැන්වීමට ගුරුවරුන් තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ කිරීමට යොදා ගන්නා නව්‍ය භාවිතයන් මත එම නිර්මාණාත්මක බව රඳා පවතින බැවින් මාර්ගගත භාවිතයේ සියලු හැකියාවන් හඳුනා ගැනීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම.

- මිශ්‍ර / මාර්ගගත ඉගෙනීමේ සාර්ථකත්වය රඳා පවතින්නේ සිසුන්ට ඒ සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව මත ය. එබැවින්, පිටත සිට ඉගෙනුම් කළමනාකරණ පද්ධති සමඟ ප්‍රවේශ වීමට / අන්තර් ක්‍රියා කිරීමට සිසුන්ට ලැප්ටොප් පරිගණක / ටැබ් / ස්මාර්ට් දුරකථන වැනි ඔවුන්ගේම පුද්ගලික පරිගණක උපාංග භාවිතා කිරීමට හැකි විය යුතුය. උසස් අධ්‍යාපන ආයතන හා සම්බන්ධ වන සියලුම සිසුන්ට ඔවුන්ගේ අභිමතය පරිදි ලැප්ටොප් පරිගණකයක් සහ ස්මාර්ට් ජංගම උපාංගයක් (ටැබ් / දුරකථන) ලබා ගැනීමට පහසුකම් සැපයිය යුතුය. සිසුන් විවිධ මූල්‍ය පසුබිම් තුළින් පැමිණෙන හෙයින්, අධ්‍යයන කටයුතු සඳහා සිසුන්ට මෙම පුද්ගලික උපාංග මිලදී ගැනීමට පහසුකම් සපයන අධ්‍යාපන ණය පහසුකමක් ඇති කිරීම වැදගත් වේ. එමෙන්ම, විශේෂ බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත පැකේජ සමඟ අන්තර්ජාල ප්‍රවේශ පිරිවැය අවම කළ හැකිය.

- සිසුන් සහ ගුරුවරුන් අතර මිශ්‍ර / මාර්ගගත අන්තර් සබඳතාවය සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම සහිත මාර්ගගත සහයෝගිතා වැඩ පරිසරය ඉතා වැදගත්ය. උදාහරණයක් ලෙස, Google Classroom, Meet, Microsoft Team සහ වෙනත් මෙවලම්, සහ Zoom තාක්ෂණය ඔස්සේ සම්මන්ත්‍රණ පැවැත්වීම දැක්විය හැකිය. උසස් අධ්‍යාපන ආයතන විසින් අධ්‍යයන කටයුතු සඳහා මෙම පහසුකම් භාවිතා කිරීමට ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට සහාය විය යුතුය.

- විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා විද්‍යුත් පුස්තකාල පහසුකම් සහ අනෙකුත් ශිෂ්‍ය සේවා ඒකාබද්ධ කිරීමෙන්, පියවල අථත්‍ය ඉගෙනුම් පරිසරයක් (VLEs) දක්වා ඉගෙනුම් කළමනාකරණ පද්ධති පුළුල් කළ හැකිය.

- ඉ-ඉගෙනුම්, ඉ-ඉගැන්වීම් සහ ඉ-ඇගයීම් සඳහා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) විසින් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඇතුළත් කළ යුතුය. ඒ අනුව, මිශ්‍ර / මාර්ගගත ඉගැන්වීමේ ක්‍රම භාවිතා කරමින් අධ්‍යාපනය පුළුල් කිරීම හේතුවෙන් ඇතිවිය හැකි තත්ත්ව ආරක්ෂණ ගැටළුවලට විසඳුම් ලබා දෙන අතරම එය ඒකාකාර ප්‍රමිතියක් පවත්වා ගෙන යාමට පහසුකම් සපයනු ඇත.

- ස්ථාපිත වලංගු මාර්ගෝපදේශයක්, උසස් තාක්ෂණයන් භාවිතය සහ මාර්ගගත ඉගැන්වීම් සම්බන්ධයෙන් පවතින හොඳම ජාත්‍යන්තර භාවිතයන් ආදිය සමඟ අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සංශෝධනය කරමින් හැකි සෑම පාඨමාලාවක් තුළම ආකෘති / සාරාංශ ඇගයීම් ක්‍රියාත්මක කිරීමට ඉගෙනුම් කළමනාකරණ පද්ධති තුළ ඇති පහසුකම් භාවිතා කිරීමට ගුරුවරුන් දිරිමත් කළ යුතුය.

- මාර්ගගත ඇගයීම් / විභාගය අතරතුර සිදුවිය හැකි අක්‍රමිකතා වළක්වා ගැනීමට පියවර ගැනීම වැදගත් වේ. සිසුන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇගයීම්වලට සම්බන්ධ වන විට රවනා සොරකම් කිරීම් පාලනය කිරීම සඳහා වැදගත් වන මෘදුකාංග මෙවලම් / පැකේජ සහ ලොක්ඩවුන් බ්‍රවුසර උසස් අධ්‍යාපන ආයතන විසින් ලබා ගත යුතුය.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් කඩිනමින් ඇතුළත් කර ගැනීම

අ.පොෂ. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමෙන් පසු, වර්තමාන ශිෂ්‍ය තෝරා ගැනීමේ ක්‍රමය සහ වෙනත් පරිපාලන හා අධ්‍යයන හේතූන් මත ශිෂ්‍යයෙකු රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට වසරකට වැඩි කාලයක් බලා සිටිය යුතුය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතුව නිසි පරිදි සංවර්ධනය කළ මාර්ගගත අයදුම්පත් සැකසුම් පද්ධතියක් තිබියදීත්, තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට සාමාන්‍යයෙන් ප්‍රතිඵල නිකුත් කළ දින සිය මාස හයක පමණ කාලයක් ගත වේ. කෝවිඩ් -19 බලපෑම හේතුවෙන් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. මෙම ප්‍රමාදයට බලපාන ප්‍රධාන හේතු ලෙස: (අ) පාසල් අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර පාසල් විදුහල්පතිවරුන්ගේ අනුමැතිය ලබා ගත යුතු බැවින් පාසල් වසා දැමීම හේතුවෙන් අදාළ සිසුන් විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම; (ආ) අ.පොෂ.(උසස් පෙළ) විභාගය සඳහා ශිෂ්‍ය බාණ්ඩ දෙකක් විෂය නිර්දේශ දෙකක් යටතේ පෙනී සිටීම නිසා සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව තිබූ ගැටළුව සහ ප්‍රතිඵල සංඛ්‍යාවල එකහතාවය;(ඇ) පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය ප්‍රතිඵල නිකුත් වන තෙක් බලා සිටීමට සිදු වීමේ අවශ්‍යතාවය; (ඈ) අයදුම්පත් 100,000 කට අධික සංඛ්‍යාවක් හදිසියේ ගලා ඒම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රවේශ අංශයේ ඇති වන සම්පත් සීමාවන්; සහ (ඉ) කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් ඇතුළු විවිධ විශ්වවිද්‍යාලවලට අදාළ ගැටළු හේතුවෙන් සිසුන් සැබවින්ම විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර අධ්‍යයන කටයුතු ආරම්භ කරන විට තවත් ප්‍රමාදයන් සිදු වීම දැක්විය හැකිය.

රාජ්‍ය නොවන අංශයට සිසුන් ඇතුළත් කර ගැනීම බෙහෙවින් වෙනස් වේ. සුපුරුදු රටාව නම් වසරකට දෙවරක් සිසුන් ඇතුළත් කර ගැනීමයි: එනම් පළමුව, අ.පොෂ. (උසස් පෙළ) ප්‍රතිඵල නිකුත් වූ විගසම හා දෙවනුව රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් වූ පසුව වශයෙනි. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් බඳවා ගැනීමේ නිර්ණායකයන් අ.පොෂ. (උසස්

පෙළ) වැඩසටහන මත රඳා නොපවතින අතර එය උපාධි පාඨමාලාවට සහ එය අනුබද්ධ විදේශීය විශ්වවිද්‍යාලයට අනුව විශේෂිත වේ.

කෙසේ වෙතත්, කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ වඩාත් තීරණාත්මක කොට්ඨාශය වන්නේ රජය විසින් හඳුන්වා දී ඇති 'පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය' (IFSLS) සහ 'මගේ අනාගත ණය යෝජනා ක්‍රමය' හරහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වන ශිෂ්‍ය කණ්ඩායම් ය. මෙම සිසුන් තෝරා ගනු ලබන්නේ රජයේ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසුව ය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රජයේ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ දී යම් ප්‍රමාදයක් සිදු වුවහොත් එය මෙම කාණ්ඩය යටතේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයට අහිතකර ලෙස බලපානු ඇත. එම ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් සිසුන් 5,000 ක් පමණ වේ.

මෙම ප්‍රමාදයන්ට අදාළ ගැටළු අධ්‍යයනය කර ඇති අතර ඒවා අවම කිරීම සඳහා වන නිර්දේශ පහත පරිදි වේ.

- වර්තමානයේ විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරාගැනීමේ නිර්ණායකයන්ට අනුව බොහෝමයක් පාඨමාලා සඳහා කුසලතා පදනම මත 40% ක් සහ දිස්ත්‍රික් පදනම මත 55% ක් බඳවා ගන්නා බැවින්, විභාග ප්‍රතිඵල වෙනස් වීමේ බලපෑම, තෝරාගත් සිසුන්ගේ ලැයිස්තුවට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එහෙයින් විශ්වවිද්‍යාලවලට සිසුන් තේරීම් ක්‍රියාවලිය සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් වන තෙක් රැඳී සිටීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිදු වේ. මේ අනුව, විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම කඩිනමින් ආරම්භ කිරීම සඳහා නැවත සමීක්ෂණ ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

- අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල සත්‍යාපනය කිරීමේ අවශ්‍යතාවයක් ද පවතී. වර්තමානයේ කාලය ගතවන කඩදාසි මත පදනම් වූ සන්නිවේදනයකට යොමුවීමකින් තොරව අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල වහාම තහවුරු කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැන් විභාග දෙපාර්තමේන්තුව සමඟ සබැඳි සම්බන්ධතාවයක් ඇති කිරීමට පියවර ගෙන තිබේ.

- වර්තමානයේ දී විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීම සඳහා සිදු කෙරෙන අයදුම්පත් ලබා ගැනීම සහ අයදුම්පත් අතින් පරීක්ෂා කිරීම සඳහා බොහෝ කාලයක් ගත වේ. අයදුම්පත් කැඳවීම සහ පරීක්ෂා කිරීම සඳහා සංවර්ධනය කරන ලද නව පද්ධතියක් ස්ථාපනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ වන විට කටයුතු කරමින් සිටින අතර, එමඟින් අතින් සිදු කරන බොහෝ පියවරයන් ස්වයංක්‍රීයව කිරීමට සකස් ඇති අතර දැනට පවතින පද්ධතියට වඩා දියුණු බැවින් වැඩි නිසා අයදුම්පත් වේගයෙන් සැකසීමට එය මග පාදයි.

- වර්තමානයේ දී, සාමාන්‍ය බඳවා ගැනීම් යටතේ සිසුන් තෝරා ගැනීම සහ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වගකීම වේ. සිසුන් ලියාපදිංචි නොවීම හේතුවෙන් ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා සෑම වසරකම පුරප්පාඩු පිරවීමේ වට 8 සිට 10 දක්වා ක්‍රියාත්මක කරන අතර සමහර පාඨමාලා සඳහා මේ වෙනුවෙන් මාස 3 සිට 4 දක්වා ගත වේ. පළමු තේරීමෙන් පසුව අවසාන ලැයිස්තුව විශ්වවිද්‍යාල වෙත යැවීමට පෙර මෙය සිදු වේ. පළමු වට දෙකෙන් පසු මෙසේ ලියාපදිංචි වන නව සිසුන් සංඛ්‍යාව කුඩා ප්‍රමාණයක් වන බැවින් සමස්ත දිවයිනේම කුසලතා පදනම මත එම පුරප්පාඩු පිරවීම විශ්වවිද්‍යාල වෙත භාර දීමට යෝජනා කර ඇත. මේ සඳහා දැනට පවතින විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුය.

- මෙම අවහිරතා මධ්‍යයයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රවේශ අංශය, සිසුන් තෝරා ගැනීමේ කාල සීමාව තුළ සතියේ දින 7ම, බොහෝ පැය ගණනක් සේවය කරමින් විශාල වැඩ කොටසක් සිදු කරයි. මෙම පද්ධතිමය හා ක්‍රියාවලි අවහිරතා නිරාකරණය වන තෙක්, අවම වශයෙන් තාවකාලික පියවරක් ලෙස විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමේ ප්‍රමාදය අවම කිරීමට වැඩි කාර්ය මණ්ඩලයක් හා අවකාශය පවතින ස්ථානයක් වෙන් කිරීම අවශ්‍ය වේ.

- මෙම පොරොත්තු කාලය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා, දැනුම ලබා දීමට සහ විශ්වවිද්‍යාල පාඨමාලා ඵලදායී ලෙස හැදෑරීමට සහ සේවා නියුක්තියට අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය කිරීමට මාර්ගගත ක්‍රමය / තොරතුරු තාක්ෂණය සාර්ථකව භාවිතා කළ හැකිය. මේ සඳහා නව විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන් වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේ සිට පෙර -විශ්වවිද්‍යාල මාර්ගගත ඉංග්‍රීසි භාෂා වැඩසටහනක් සංවිධානය කරනු ලැබේ. අනාගතයේ දී, මෙම වැඩසටහන යෝජිත අතථ්‍ය විශ්වවිද්‍යාලය හරහා ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර, උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන සියලු දෙනාට පාඨමාලාව හැදෑරීමට පහසුකම් සපයයි.

- තවද, බොහෝ පාඨමාලාවල විෂය අන්තර්ගතයෙන් අවම වශයෙන් 30% ක්වත් ඉගැන්වීමට මාර්ගගත ක්‍රමය / තොරතුරු තාක්ෂණ පහසුකම් භාවිතා කළ හැකි අතර අනෙක් පාඨමාලාවල එය 80% දක්වා ඉහළ මට්ටමකින් සිදු කළ හැකිය. එබැවින් පාඨමාලාවක් හැදෑරීමට ගතවන කාලය අඩු කළ හැකි අතර භෞතික සම්පත් ද අවම කර ගත හැකිය. මාර්ගගත ක්‍රමය ඔස්සේ පාඨමාලා කිහිපයක්ම හැදෑරීමට හැකි නිසා භෞතිකව අධ්‍යයන සැසි ආරම්භ කිරීමට පෙර, නවක සිසුන්ට මාර්ගගතව / දුරස්ථ පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීමෙන් පොරොත්තු කාලය ඵලදායී ලෙස භාවිතා කිරීමට උසස් අධ්‍යාපන ආයතන හට මෙම ක්‍රමවේදය භාවිතා කළ හැකිය.

කොවිඩ් - 19 තත්ත්වයෙන් ඔබ්බට යමින් සිදු කළ උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

කොවිඩ් -19 තත්ත්වයෙන් ඔබ්බට වූ ප්‍රතිසංස්කරණ හා තෘතීයික අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා පුළුල් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සිදු කරන නිරන්තර ගවේෂණයන් සම්බන්ධයෙන් සැලකීමේදී, ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපන ආයතන වර්ග තුනකින්, එනම් (අ) රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන (ආ) උපාධි හා පශ්චාත් උපාධි පර්යේෂණ විශ්වවිද්‍යාල සහ (ඇ) රාජ්‍ය නොවන වෘත්තීය හා වෘත්තීමය ආයතනවලින් සමන්විත ගෝලීය වශයෙන් පිළිගත් ත්‍රි-පාර්ශවීය පද්ධතියක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය මූලික වෙනස්වීම් සිදු කළ යුතු බව හඳුනා ගන්නා ලදී.

මෙම ආයතන ත්‍රිත්වය / උප අංශ තුළ සහ ඒවා අතර වඩාත් නම්‍යශීලී බව සහ සංචලතාව සැපයීම; මනාව විග්‍රහ කරන ලද විවිධ අධ්‍යාපන ක්‍රම, පුහුණුව සහ වෘත්තීය මාර්ග ඉදිරිපත් කිරීම; ලබා දෙන පුහුණු වර්ගවල ප්‍රමිතීන්, ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම;පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම; ආදායම් උත්පාදනය හා බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීම ආදිය තුළින් තෘතීයික අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා මෙම පරිවර්තනය සිදු කළ යුතුය. එබැවින් ඉහත අරමුණු ඉටු කර ගැනීම සහතික කිරීම සඳහා පහත සඳහන් අරමුණු සහ උපාය මාර්ග යෝජනා කරනු ලැබේ.

ඒ අනුව, මෙම වාර්තාව මඟින් නිශ්චිත අරමුණු යටතේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම සඳහා නිර්දේශ මාලාවක් යෝජනා කරයි. එක් එක් අරමුණු යටතේ වැදගත් නිර්දේශ කිහිපයක් මෙහි ඉදිරිපත් කෙරේ.

සුදුසු නීති සම්පාදනයකින් උසස් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම

දශක හතරකට පෙර විශ්වවිද්‍යාල හයකට වඩා අඩු සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කරන විට බලාත්මක කරන ලද 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සමඟ කඩිනම් ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කිරීම ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතියට අවශ්‍ය වේ. වර්තමාන විශ්වවිද්‍යාල පද්ධතිය, ශක්තිමත් ආයතනික ස්වයං පාලනයක් සහ දැඩි මධ්‍යම පාලනයක් මඟින් සංලක්ෂිත වන අතර එමඟින් අපේක්ෂා කරන වගවීම හෝ ක්‍රියාකාරිත්වය නොලැබේ. එබැවින් පවත්නා විශ්වවිද්‍යාල පනත හා ඒ සමඟ ඇති රෙගුලාසි නිසි පරිදි සංශෝධනය කළ යුතුය.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායී, නියාමන හා පහසුකම් සපයන අංශයක් බවට පත් කිරීම සහ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කිරීම;
- මෙහෙවර වෙනකොට දැක්වීම පහසු කිරීම සඳහා ස්ථාපිත විශ්වවිද්‍යාලවලට වැඩි ස්වාධීනත්වයක් ලබා දීම; සහ
- ස්ථාපිත විශ්වවිද්‍යාල, නගර විශ්වවිද්‍යාලවලට අනුබද්ධිතව විශ්වවිද්‍යාල විද්‍යායතන / මණ්ඩප පිහිටුවීම තුළින් සහ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය සඳහා නව විශ්වවිද්‍යාලයක් පිහිටුවීම මඟින් විශ්වවිද්‍යාල ප්‍රවේශය පුළුල් කිරීම.

පාලනය ප්‍රතිසංස්කරණය කිරීමෙන් උසස් අධ්‍යාපන ආයතනවල කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම

උසස් අධ්‍යාපනය තුළ යහපාලනය වැදගත් වන අතර වගවීම හා විනිවිදභාවය සමඟින්, පුළුල් රාමුවක් ඔස්සේ පාලනය ක්‍රියාත්මක කිරීම තුළින් විශ්වවිද්‍යාලයකට දිගු කාලීන තිරසාරබව ලභා කර ගැනීමට අවකාශය සලසයි. මේ සම්බන්ධයෙන්, පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන අංශයේ පාලනය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.ඒ අනුව;

- සියළුම පරිපාලන, නියාමන කාර්යයන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව සිදු කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රතිව්‍යුහගත කිරීම;
- රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පාලනය කිරීමට, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන කවුන්සිලය / අධිකාරිය (NSHEC /A) නමින් නව නියාමන මණ්ඩලයක් පිහිටුවීම;
- රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිඵල පදනම් වූ සහ වැඩිදියුණු කළ කාර්ය සාධනය සහ වගවීම සහිත ආයතන බවත් පත් කිරීමට අරමුදල් වෙන් කිරීම සඳහා සුදුසු ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම;
- උපායමාර්ගික කළමනාකරණ ප්‍රවේශයක් අනුගමනය කිරීම සඳහා සියලුම විශ්වවිද්‍යාලවල ආයතනික යාන්ත්‍රණ පවතින බව සහතික කිරීම;
- සංසන්දනාත්මක වාසියක් නොමැති විශ්වවිද්‍යාලවල ඇති සියලුම මූලික නොවන සහායක සේවාවන් ඉවත් කිරීම සහ ඒ වෙනුවට එවැනි සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය භාවිතා කිරීම.

මාර්ගගත අධ්‍යාපනය තුළින් අගනා ප්‍රතිඵල ලබාදෙන ඉගැන්වීමේ සහ ඉගෙනීමේ අත්දැකීම් ලබා දීමට තාක්ෂණික අංගයන්ගෙන් සමන්විත කරවීම

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නවීකරණය කිරීම, රටේ සංවර්ධනයට බාධාවක් වී ඇති ගැටළු කිහිපයක් විසඳීම සඳහා පවතින වැදගත් අවශ්‍යතාවකි. නව විශ්වවිද්‍යාල ඉදිකිරීම හෝ පුළුල් කිරීම මඟින් උසස් අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම වැඩි කළ නොහැකි අතර ඒ වෙනුවට ඉගෙනීමට කැමති

සැමට අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ලබා දීමේදී දුරස්ථ අධ්‍යාපනය සහ මාර්ගගත ඉගෙනීම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මාර්ගගත අධ්‍යාපනය ඵලදායී වීමට නම් අත්‍යවශ්‍ය අංග තුනක් ක්‍රියාත්මක විය යුතුය. එනම් තාක්ෂණික අවශ්‍යතා, ඉගෙනුම් සම්පත් සහ ඉගෙනුම් සහාය යන අංග අත්‍යාවශයෙන්ම පැවතිය යුතුය. ශ්‍රී ලංකාවේ මාර්ගගත ඉගෙනුම් අවස්ථා ශක්තිමත් කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රධාන නිර්දේශ පහත දැක්වේ.

- අන්තර්ජාලය හරහා පාඨමාලා පිරිනැමීමට සහ සිසුන්ට ඉගෙනුම් කළමණාකරණ පද්ධති හා සම්බන්ධ වීමට ප්‍රමාණවත් අන්තර්ජාල සම්බන්ධතාවයක් ලබා දීමට මැදිහත්වීම් සැලසුම් කිරීම සහ එම කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි සියලුම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අවශ්‍යතා සැපයීම සඳහා ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ විෂය පථය හා ධාරිතාව පුළුල් කිරීම.
- ජාතික විවෘත අධ්‍යාපන සම්පත් (OER) ප්‍රතිපත්තියක් සකස් කිරීමෙන් බහු මාදිලි ඉගෙනුම් සම්පත් සහිත ජාතික ගබඩාවක් පිහිටුවීම සඳහා ජාතික ව්‍යාපෘතියක් දියත් කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල විසින් සකස් කරන ලද පාඨමාලා ශ්‍රී ලාංකික සිසුන්ට ලබා දීමටත්, ශ්‍රී ලාංකික ශාස්ත්‍රඥයින් විසින් සකස් කරන ලද පාඨමාලා ගෝලීය සිසුන්ට ලබා දීමටත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සාකච්ඡා ආරම්භ කිරීම.
- දුරස්ථ ප්‍රදේශවල සිටින සිසුන් සමඟ සම්බන්ධ වීම සඳහා වෙබ් සම්මන්ත්‍රණ පද්ධති සඳහා වන පහසුකම් පුළුල් කිරීම සහ සිසුන් සමඟ සම්බන්ධ වීමට සමාජ ජාල මෙවලම් භාවිතා කිරීමට දිරිමත් කිරීම.

උසස් අධ්‍යාපනයේ අදාළත්වය වැඩි දියුණු කිරීම

අදාළත්වය යනු අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් අවශ්‍යතාවයකි. වෙනස්වන ලෝකයක, අදාළ අධ්‍යාපනය ලෙස පෙර සලකනු ලැබූ දේ, අද පුද්ගලයින්ගේ, කර්මාන්තවල සහ සමාජයේ අවශ්‍යතාවන්ට අදාළ නොවිය හැකිය. සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සමාලෝචනය, ඇගයීම සහ වැඩිදියුණු කිරීම කේන්ද්‍ර කරගත් ක්‍රියාවලීන්ගේ රාමුවක් සමඟ උසස් අධ්‍යාපනයේ අදාළත්වය ක්‍රියාත්මක කළ හැකිය. වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාව තුළ උසස් අධ්‍යාපනයේ අදාළත්වය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ කිහිපයක් පහත දැක්වේ.

- නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් මත පදනම්ව ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් සහ ඉගෙනුම් ප්‍රවේශයන් සහ ප්‍රතිඵල පාදක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට ඉගෙනුම් තක්සේරු ක්‍රම ඒකාබද්ධ කිරීම.
- නවීන අධ්‍යාපන තාක්ෂණයන් භාවිතා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාලවල අධ්‍යයන හා කළමනාකරණ කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය කිරීම සඳහා ජාතික උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම.
- විදේශීය පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීමට සහ ඉගැන්වීමේ නවීන ක්‍රම පිළිබඳව අත්දැකීම් ලබා ගැනීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම සහ කාර්ය මණ්ඩල හිඟය මහඟරවා ගැනීම සඳහා ප්‍රමුඛ විෂයයන් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව පුළුල් කිරීම.
- සේවායෝජකයින්ට සහ කර්මාන්තයට අවශ්‍ය දැනුම, කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට විෂයමාලා ප්‍රතිසංස්කරණ සහතික කිරීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.
- තත්ත්ව ආරක්ෂණය සහ නියාමන මැදිහත්වීම් තුළින් බාහිර උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය හා අදාළත්වය වැඩි දියුණු කිරීම.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවාවන් පුළුල් කිරීම

සිසුන් විශාල සංඛ්‍යාවක් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීමට අවශ්‍ය පරිපූර්ණ ආකෘතිය, පද්ධතිය සහ ව්‍යුහය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (OUSL) සතු වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කලාපීය හා අධ්‍යයන මධ්‍යස්ථාන ජාලය, රටේ විවිධ ප්‍රදේශවල විසිරී සිටින සිසුන්ට සාර්ථකව හා පහසුවෙන් ඒ සඳහා ලහා වීමට උපකාර වේ. මෑත කාලයේ දී, ඩිජිටල්කරණය කරන ලද විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීම සඳහා තාක්ෂණයෙන් මෙහෙයවන බොහෝ මුල පිරීම්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉදිරි පස් වසර තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙ හි ශිෂ්‍ය ජනගහනය 100,000 දක්වා වැඩි කිරීම සඳහා පහත සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

- පවත්නා සහ නව අධ්‍යයන වැඩසටහන් මෙන්ම සිසුන් විශාල සංඛ්‍යාවක් බඳවා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කලාපීය හා අධ්‍යයන මධ්‍යස්ථාන, යටිතල පහසුකම් සහ මානව සම්පත් සමඟ සංවර්ධනය කිරීම.
- සිසුන්ට රැකියා අවස්ථා ලබා ගැනීමට හැකිවන පරිදි සහ විවිධාංගීකරණය වූ සුදුසුකම් සහ අත්දැකීම් ඇති සිසුන්ට සුදුසු නව අන්තර් විෂය හා අන්තර් පීඨ වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- මධ්‍යම විශ්වවිද්‍යාලයට වගවෙමින්, අධ්‍යයන වැඩසටහන් ස්වාධීනව පරිපාලනය කිරීමට මධ්‍යස්ථානවලට හැකි වන පරිදි ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

රටේ ජාතික සංවර්ධනයට හා වර්ධනයට සහාය වීම සඳහා විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) නොවන උපාධිධාරීන්ගේ නිපුණතා සහ කුසලතා වැඩි දියුණු කිරීම

නිරන්තරයෙන් වෙනස්වන ශ්‍රම බලකායක් තුළ කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා හා කුසලතා රාශියක් ඇති උපාධිධාරීන් බිහි කිරීමට හැකි වීම, උසස් අධ්‍යාපන ආයතනයන් හි අධ්‍යයන වැඩසටහන්වල පැවතිය යුතු වැදගත් අවශ්‍යතාවකි. ඒ අනුව, වේගයෙන් වෙනස් වන ලෝකයේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය නොවන උපාධිධාරීන්ගේ නිපුණතා සහ කුසලතා වැඩි කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් නිර්දේශ කරනු ලැබේ.

- විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය නොවන වැඩසටහන්වල උපාධි අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ සුදුසුකමක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.
- සියලුම විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය නොවන පීඨවල තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම තුළින් සිසුන්ට නවීන පහසුකම් අත්විඳීමට සැලැස්වීම.
- සියලුම විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය නොවන පීඨවල තොරතුරු තාක්ෂණ සේවා ඒකක / අධ්‍යයනාංශ පිහිටුවීම.

උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි කිරීම සඳහා අතථ්‍ය විශ්වවිද්‍යාලයක් පිහිටුවීම

කොවිඩ් -19 වසංගතයෙන් පැන නගින ධනාත්මක අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, සැපයුම් ඉල්ලුම් පරතරය පියවා ගැනීමට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කිරීමෙන්ම කළ නොහැකි හෙයින් අධ්‍යාපනයට "අතථ්‍ය" ප්‍රවේශයක් ලබා දීම ක්‍රියාවට නැංවීම සිදු කළ යුතු අතර ඒ අනුව, පවත්නා විශ්වවිද්‍යාල හවුල්කාරිත්ව ආකෘතියකට සම්බන්ධ කර ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ අතථ්‍ය විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කෙරේ. මෙම විශ්වවිද්‍යාලයේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය:

- අධ්‍යයනාංශ හා පීඨ සාම්ප්‍රදායික ආකෘතියක් නොතිබීම, අවම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හා හවුල්කාර ආයතනවලින් සම්පත් ලබා ගැනීමේ හැකියාව ලබා ගැනීම.
- හවුල්කාර ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් යුත් අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීම සහ පාඨමාලා කණ්ඩායම් විසින් සකස් කරන ලද පාඨමාලා මොඩියුල සහ එක් එක් මොඩියුලවල අධ්‍යයන සම්භාර වෙනුවෙන් සහතික ප්‍රදානය කිරීම.
- නම්‍යශීලී ප්‍රවේශය සහ ඉවත්වීමේ මූලධර්මය මත පූර්ව අවශ්‍යතා නොමැතිව, සිසුන්ට තම අභිමතය පරිදි පාඨමාලා මොඩියුල නිදහසේ තෝරා ගැනීමට ඉඩ දීම.
- රට තුළ සහ පිටත පිළිගත් පාඨමාලා පිරිනමන විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන විවිධ අධ්‍යයන වැඩසටහන් අතර අධ්‍යයන සම්භාර මාරු කිරීම් සහ නිදහස් කිරීම් වලට ඉඩ දීම.
- ශ්‍රී ලංකාව සහ විදේශයන්හි හොඳම මානව සම්පත් සංචිත කර බෙදා ගැනීම සහ වෙනත් ආයතනවල පවත්නා යටිතල පහසුකම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම.

උසස් අධ්‍යාපන රාජ්‍ය නොවන අංශය පුළුල් කිරීම

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ශ්‍රී ලංකාවේ සිසුන්ට උසස් අධ්‍යාපනය හැදෑරීමට බොහෝ අවස්ථාවන් නිර්මාණය කර දී තිබේ. කෙසේ වෙතත්, මෙම අංශයට නිසි ව්‍යවස්ථාදායක උපස්ථ සහ අධීක්ෂණ පද්ධතියක් නොමැති බැවින් එහි වර්ධනය හා විශ්වසනීයත්වය පිළිබඳව විවිධ අංශවලින් ප්‍රශ්න කිරීම සිදු කර ඇත. මේ සම්බන්ධයෙන්, අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් වනුයේ අධීක්ෂණය හා වගවීමේ ව්‍යුහය සමඟ නිසි ව්‍යවස්ථාදායක සහාය ඇතිව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පුළුල් කිරීමයි. තවද, විදේශයන්හි අධ්‍යාපනය ලබා නැවත පැමිණෙන සිසුන්ට, සුරක්ෂිත පරිසරයක් තුළ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව නිර්මාණය කළ යුතුය.

පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන හා තාක්ෂණ හුවමාරුව ප්‍රවර්ධනය කිරීම

අද වන විට පශ්චාත් කාර්මික දැනුම් ආර්ථිකය මඟින් ආර්ථික වර්ධනය, නවෝත්පාදන සහ දේශීය පර්යේෂණ ධාරිතාව අතර සමීප සහසම්බන්ධය පෙන්නුම් කරයි.එවැනි ආර්ථික වශයෙන් අදාළ නවෝත්පාදනයන්හි වඩාත් ඵලදායී ධාවකය වන්නේ විශ්වවිද්‍යාලය පදනම් කරගත් පර්යේෂණ වේ.

බොහෝ ඉහළ පෙළේ ආසියානු විශ්වවිද්‍යාල මෙම ගෝලීය ප්‍රවණතාවයට අනුකූලව ඉගැන්වීමේ විශ්වවිද්‍යාල සිට පර්යේෂණ විශ්වවිද්‍යාල බවට පරිවර්තනය වී ඇත. උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නවෝත්පාදන මූලික අංග බවට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට පරමාදර්ශී වෙනසක් අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන තුළ පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන හා තාක්ෂණික හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්දේශිත, වැදගත් උපාය මාර්ග කිහිපයක් පහත දැක්වේ.

- ශක්තිමත් විභවතාවයකින් යුත් නව අදහස් වලට ප්‍රතිචාර දැක්වීමට සහ පර්යේෂණ සඳහා නව අරමුදල් අවස්ථා ඇති කිරීමට නම්‍යශීලී යාන්ත්‍රණයක් සකස් කිරීම හා ගෝලීය කුසලතා ආකර්ශනය කර ගැනීම, රට තුළ ඉහළ සුදුසුකම් ලත් හා නිපුණතා කුසලතා සංචිතයක් ගොඩනැගීම සඳහා ක්‍රියා පටිපාටි සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ නව නිපැයුම් හා සේවාවන් බවට පරිවර්තනය කළ හැකි අධ්‍යයන හා පර්යේෂණ විශිෂ්ටත්වයට හේතු වන ඒකාබද්ධ, අන්තර් විෂය හා බහුකාර්ය ප්‍රවේශයන්ගේ වටිනාකම් දාමයක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- සියළුම පාර්ශවකරුවන් සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සහ ලාභදායී ක්‍රියාවලියක් ලෙස විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර නවෝත්පාදන සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සහ

බුද්ධිමය දේපළ හා රැකියා අවස්ථා නිර්මාණය කිරීම මෙන්ම ධාරිතා වර්ධනය කිරීමේ නිරත වීම් ද ඊට ඇතුළත් කිරීම.

- ගෝලීය දැක්මක් සහිත පර්යේෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථාන විශ්වවිද්‍යාල තුළ ඇති කිරීම, ඉහළම ප්‍රමිතීන්ට අනුකූල වීම සහ ගෝලීය පිළිගැනීමක් සහිත අති නවීන පර්යේෂණ සිදු කිරීම හා එමඟින් මෙම ආයතන සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ගෝලීය වශයෙන් තරඟකාරී මට්ටමක පවතිනු ඇත.
- විශිෂ්ඨත්වයෙන් යුතු ගුණාත්මක පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ සහයෝගීතාවයෙන් පර්යේෂණ සඳහා අරමුදල් රැස් කිරීම සහ ජාත්‍යන්තර ප්‍රදාන සඳහා තරඟ කිරීමේ හැකියාව වර්ධනය කිරීම සහ ආධාර මඟින් පර්යේෂණ අරමුදල් වැඩි දියුණු කිරීම.
- පවත්නා පරතරයන් පියවා ගැනීම සඳහා සහ බුද්ධිමය දේපල උත්පාදනය, නවෝත්පාදන සහ වාණිජකරණයට තුඩු දෙන පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ඇති බාධක ඉවත් කිරීම.

උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය සහතික කිරීම

තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සංකල්පය, දශක දෙකකට පමණ පෙර ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දෙන ලදී. තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සිලය (QAAC) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිහිටුවන ලද්දේ, ගුණාත්මකභාවය පිළිබඳ අවම ප්‍රමිතීන්ට අනුකූලද යන්න තහවුරු කිරීමට අමතරව, ගුණාත්මකභාවය සහතික කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය සහ එම සංකල්පය වෙත සමීප කරලීම කෙරෙහි අවධානය යොමු කිරීමට ය. 'ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සඳහා තත්ත්ව ආරක්ෂණ අත්පොත සහ විෂය ඉම් ලකුණු ප්‍රකාශ, ප්‍රතිපත්ති සංග්‍රහය සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය වැනි ප්‍රධාන විමර්ශන ලේඛන ප්‍රකාශයට පත් කර ඇති අතර තත්ත්ව ආරක්ෂණ වැඩසටහන් සමාලෝචන සහ ආයතනික සමාලෝචන දැන් සියලුම විශ්වවිද්‍යාලවල සාමාන්‍ය පදිරි සිදු කරයි. කෙසේ වෙතත්, රාජ්‍ය විශ්වවිද්‍යාල ආවරණය කිරීම සඳහා පමණක් නොව සමස්ත උසස් අධ්‍යාපන අංශය ද ආවරණය කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීම කළ යුතුය. මේ සඳහා ප්‍රධාන නිර්දේශයන් කිහිපයක් පහත දැක්වේ.

- රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන් හි සියලුම අධ්‍යයන වැඩසටහන් සහ ක්‍රියාවලීන්ගේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය බලතල සහිත ස්වාධීන තත්ත්ව ආරක්ෂණ ආයතනයක් පිහිටුවීම.
- තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් කැපවීමට, විශ්වවිද්‍යාලවල ස්ථිර සේවක සංඛ්‍යාවෙන්, පූර්ණ කාලීන අධ්‍යයන මණ්ඩල තනතුරු ඇති කිරීම.
- රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සමකාලීන දින දර්ශනයක් හඳුන්වා දීම තුළින් අන්තර් අධ්‍යයනාංශ, අන්තර් පීඨ, අන්තර් විශ්වවිද්‍යාල සහ ජාත්‍යන්තර සහයෝගීතා උපාධි වැඩසටහන් සඳහා පහසුකම් සැපයීමට මෙන්ම ප්‍රමාදයන් වළක්වා ගැනීමට පහසුකම් සැලසෙනු ඇත.
- බාහිර සමාලෝචනවල අවුරුදු 5 ක නිත්‍ය චක්‍රයක් සහතික කිරීම සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ දැනුවත් අරමුදල් තීරණ සඳහා බාහිර තත්ත්ව සහතික (EQA) ප්‍රතිඵල භාවිතා කිරීම.
- දේශීය විශ්වවිද්‍යාල සහ ඉහළ පෙළේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අතර සහයෝගිතා හවුල්කාරිත්වයක් ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ජාත්‍යන්තර ආයතනවලින් ප්‍රතීතනය ලබා ගැනීමෙන් සහ විදේශීය ආයතන සමඟ තත්ත්ව ආරක්ෂණය සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමේ ගිවිසුම් මඟින් අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

- විශ්වවිද්‍යාල තොරතුරු පද්ධති ඩිජිටල්කරණය කිරීම සහ විශ්වවිද්‍යාල සහ තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතිතන ආයතනවල අවශ්‍යතා සපුරාලන කළමනාකරණ තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල දිරිමත් කිරීම සහ සහාය දීම.

වගු ලැයිස්තුව

වගුව		පිටු අංකය
වගුව 4.1	සාමාන්‍ය විධිවිධාන අනුව නව හා පැරණි විෂය නිර්දේශය යටතේ තෝරාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	12-14
වගුව 4.2	2019/2020 වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා	15
වගුව 4.3.(අ)	අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම	15
වගුව 4.3.(ආ)	විෂය පරිහානිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	16-18
වගුව 5.1	ස්ථාවර කමිටු සහ වෙනත් කමිටු විසින් 2020 දී පවත්වන ලද රැස්වීම්	19
වගුව 5.2.1	2020 වර්ෂයේ අනුමත කරන ලද පීඨ	20
වගුව 5.2.2	2020 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශ	20-21
වගුව 5.2.3	2020 වර්ෂයේ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා	22
වගුව 5.2.4	2020 වර්ෂයේ අනුමත කරන ලද විශේෂවේදී උපාධි පාඨමාලා	22-23
වගුව 5.2.5	2020 වර්ෂයේ අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන්	23-25
වගුව 5.3.2	2020 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශවල නම වෙනස් කිරීම්	25
වගුව 6.1	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම - 2019/2020	33
වගුව 6.3.1	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම	34
වගුව 6.3.2	අයවැය යෝජනා - 2020	35
වගුව 6.3.3.1	වර්ෂය තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති	36
වගුව 6.3.3.2	වර්ෂය තුළ ආරම්භ කළ යටිතල පහසුකම් ව්‍යාපෘති	36
වගුව 6.3.3.3	අයවැය යෝජනාවෙන් වෙන් කර ඇති අරමුදල් වාර්ෂික ප්‍රතිපාදනවලට ඇතුළත් කර ඇත	36-37
වගුව 6.3.3.4	විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම - 2020	38
වගුව 7.1	2020 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක සංඛ්‍යාව	39
වගුව 7.2	පුනුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව	40
වගුව 8.1.1	2020 දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව	41
වගුව 8.1.2	විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල අනුමත සේවක සංඛ්‍යා තොරතුරු	41-42
වගුව 8.1.3	අළුතින් පිහිටුවන ලද ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM) සඳහා අනුමත කරන ලද නව සේවක සංඛ්‍යා	42
වගුව 8.2	2020 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා පත් කිරීම්	43
වගුව 8.3.1	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් - 2020	43
වගුව 8.3.2	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් -2020	44
වගුව 9.1	නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති	45
වගුව 17.1.1	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015-2019 දක්වා ප්‍රදානය කළ පශ්චත් උපාධි ප්‍රදාන	59
වගුව 17.2	2020 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද අවබෝධතා ගිවිසුම් / ගිවිසුම්	61
වගුව 18.2	විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය	62-63
වගුව 19.1	මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය	65
වගුව 20.1	2020 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ	67
වගුව 20.2	2020 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි	67-68

අ.වි - අභ්‍යන්තර විගණක
නි.ලේ. – නියෝජ්‍ය ලේකම්
නි.ගා.– නියෝජ්‍ය ගණකාධිකාරි
ජ්‍යෙ.ස.ලේ. – ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම
ජ්‍යෙ .ස.ගා. – ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරි
ජ්‍යෙ.ස.අ.වි. – ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ස.ලේ. – සහකාර ලේකම
ස.අ.ස. – සහකාර අභ්‍යන්තර විගණක
ස.ගා. – සහකාර ගණකාධිකාරි
ම.ස.නි. – මහජන සම්බන්ධතා නිලධාරි
මා.ස. – මානව සම්පත්
ය.ප.ස.අ. – යටිතල පහසුකම් සංවර්ධන අංශය
ක.ආ.ක. – කන්ත්ව ආරක්ෂණ කවුන්සිලය
නී. හා ප්‍ර. – නීති හා ප්‍රලේඛණ
ප.සහ ජා.ස.අ.– පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගිතා අංශය
සැ.භා.න. – සැපයුම් හා නඩත්තු
මා.ස.ස.ඒ. - මානව සම්පත් සංවර්ධන ඒකකය
ව.අ.ඇ. – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
වි.සේ.අ.මි.– විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය
ස්. ප්‍ර. සා. අක් - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සංධාරණක්වය පිළිබඳ ඒක්ක්‍රය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ස්ථාවර කමිටු

සභාපති

උප සභාපති

ලේකම්

අතිරේක ලේකම් / මානව සම්පත්

අතිරේක ලේකම් / අධ්‍යයන

අතිරේක ලේකම්/ නීති හා ප්‍රලේඛණ

අධ්‍යක්ෂ ය.ප.ස.අ

ගණකාධිකාරි

නියෝජ්‍ය ලේකම්/ ස.ගා.

සංඛ්‍යාලේඛ

අධ්‍යක්ෂ / සභාවේ ආරක්ෂණ කවුන්සිලය

අධ්‍යක්ෂ / ස. පු. කා. සේ

ප්‍රධාන ඉංජිනේරු විගණක

ඉංජිනේරු විගණක

අධ්‍යක්ෂ මා.ස.ස.ඒ

නි.ලේ

අධ්‍යක්ෂ සැපයුම්

නියෝජ්‍ය ලේකම්

ඩෙප් ඉංජිනේරු

විගණන කළමනාකාරී

ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි

පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු කොමිෂන් සභාව 2020 වර්ෂයේ දී පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය;

සභාපති — **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග**
බී.ඒ.ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය); එම්.ඒ.ආර්ථික විද්‍යාව (කොළඹ); එම්.එස්.සී. ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාව (සාගා, ජපානය); පී.එච්.ඩී (කගෝෂිමා, ජපානය)

උප සභාපති — **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ**
පී.එච්.ඩී.(එ.රා.),බී.එස්.සී(ගෞරව), වරලත් රසායනඥ, වරලත් විද්‍යාඥ, රාජකීය රසායන විද්‍යා සංගමයේ සාමාජික, එෆ්එල්කෙමිසී (Flchemc)

කොමිෂන් සභාවේ සාමාජිකයන් — **මහාචාර්ය පූජ්‍ය කේ. මහින්ද සංඛාරඛිත හිමි**
බී.ඒ. (ගෞරව) (ශ්‍රී.ල) පී.එච්.ඩී, එම්.ඒ.(දිල්ලි)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. කේ. ඩබ්ලිව්. ජයවර්ධන
බී.ඒ ස්.සී ඉංජිනේරු (ගෞරව)(මොරටුව), එම්.එස්.සී.ඉදිකිරීම් (ලොෆ්බරෝ, එ.රා.), පී.එච්.ඩී. ඉදිකිරීම් කළමනාකරණය (ලොෆ්බරෝ, එ.රා.), වරලත් ඉංජිනේරු, එෆ්.අයි.එෆ්. (ශ්‍රී.ල) එම්.එස්.එස්.ඊ.(ශ්‍රී.ල), Int.PEng (ශ්‍රී.ල), එම්.එස්.එස්.ඊ.(ශ්‍රී.ල), එෆ්.අයි.පී.එම්.(ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස්.(ශ්‍රී.ල), ජී.එස්.එල්.අයි.ඩී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ති අරසරත්නම්
බී.එස්.සී, එම්.එස්.සී, පී.එච්.ඩී.(ජෛව රසායන විද්‍යාව)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා
බී.ඒ.,එම්.ඒ.(කොළඹ), එම්.එස්.සී.සහ පී.එච්.ඩී.(එඩින්බරෝ, එ.රා.)

පාලිත කුමාරසිංහ මහතා (ජනාධිපති නීතිඥ)

භාණ්ඩාගාර නියෝජිත

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා
බී.ඒ. (ගෞරව)(කොළඹ),1991, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව(කයිරෝ), 1997, එම්.ඒ.(සංවර්ධන අධ්‍යයන), නෙදර්ලන්තය, 2002

ලේකම් — **ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර**
බී.එස්.සී.(ගෞරව), එම්.බී.ඒ.(කොළඹ), පී.එච්.ඩී.(වුහාන්)

2. විශ්වවිද්‍යාල කළමනාකරණය

2.1 කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති
අති උතුම් පූජ්‍ය ආචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ

උප කුලපති
මහාචාර්ය වන්දිකා එන් විජයරත්න

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
කේ.ඒ.එස්.එඩිවඩ් මයා

2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කේ. එම්. ද සිල්වා

උප කුලපති
මහාචාර්ය යූ.බී. දිසානායක

නියෝජ්‍ය උප කුලපති
මහාචාර්ය එස්. එච්. පී. පරාක්‍රම කරුණාරත්න (2020.12.15 දින දක්වා)

ලේඛකාධිකාරී
ආර්. වී. එස්. පී. රාජපක්ෂ මයා (වැඩ බලන) 2020.10.25 දින දක්වා)
ආර්. වී. එස්. පී. රාජපක්ෂ මයා (2020.10.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

2.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති
ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එස්.එල්.ඩබ්ලිව්. ලියනගේ (වැඩ බලන) (2020.01.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.09.08 දක්වා පත් කරන ලදී)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එස්.එල්.ඩබ්ලිව්. ලියනගේ (2020.09.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

ලේඛකාධිකාරී

ජී.බ්‍රිටෝ මහතා (2020.11.28 දින විශ්‍රාම ගන්නා ලදී)
ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.ඒ.බී.වැලිවිට (2020.11.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

2.4 කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති

අග්‍රමහා සද්ධම්මජෝතික ධජ, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, උපාධ්‍යාය ධුරන්දර, මහෝපාද්‍යාය, පණ්ඩිත, අති පූජ්‍ය වැලමිටියාව ධර්මකීර්ති ශ්‍රී කුසලදම්ම හිමි

උප කුලපති

මහාචාර්ය ඩී එම්.සේමසිංහ (2020.03.18 දින දක්වා)
මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න (වැඩ බලන) (2020.03.19 සිට ක්‍රියාත්මක වන පරිදි 2020.05.14 දින දක්වා පත් කරන ලදී)
මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ (වැඩ බලන) (2020.05.15 සිට ක්‍රියාත්මක වන පරිදි 2020.08.27 දින දක්වා පත් කරන ලදී)
මහාචාර්ය නිලන්ති ද සිල්වා (2020.08.28 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

නියෝජ්‍ය උපකුලපති

මහාචාර්ය එල්. සෙනෙවිරත්න (2020.05.14 දින දක්වා)

ලේඛකාධිකාරී

ඩබ්ලිව්.එම් කරුණාරත්න මයා

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති

විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා

උප කුලපති

මහාචාර්ය කේ.කේ.සී.කේ.පෙරේරා (2020.08.16) දක්වා
මහාචාර්ය පී.කේ.එස්. මහානාම (වැඩ බලන) (2020.08.17 සිට ක්‍රියාත්මක වන පරිදි 2020.09.06 දින දක්වා පත් කරන ලදී)
මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන (2020.09.07 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

නියෝජ්‍ය උපකුලපති

මහාචාර්ය පී. කේ. එස්. මහානාම

ලේඛකාධිකාරී

ඩබ්ලිව්.එම්.ඩී.පී.මඩවල හුලුගල්ල මිය

කේ.සී.එස්.පෙරේරා මිය (වැඩ බලන) (ඩබ්ලිව්.එම්.ඩී.පී.මඩවල හුළුගල්ල මිය සප්ත වාර්ෂික නිවාඩු අවසන්ව පැමිණෙන තෙක් 2020.09.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

2.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස්. පද්මනාදන්

නිසි බලධාරියා
මහාචාර්ය කන්දස්වාමි (2020.08.06 දක්වා)

උප කුලපති
මහාචාර්ය කන්දස්වාමි (වැඩ බලන) (2020.08.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.08.27 දක්වා පත් කරන ලදී)
මහාචාර්ය එස් ශ්‍රීසත්කුනරාජා (2020.08.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
විශ්වනාදන් කණ්ඩීපන් මයා

2.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය ආචාර්ය අකුරෙටියේ නන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී.අමරසේන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය ඊ. පී. එස්. වන්දන

ලේඛකාධිකාරී
පී.එස්.කළුගම මිය

2.8 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය වී.විවේකානන්දරාජා

උප කුලපති
මහාචාර්ය ෆ්ලේවියන් වාල්මස් රාගල්

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත
ලේඛකාධිකාරී
ඒ.පහිරදන් මයා

2.9 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය අවි. එම්. ඉෂාක්

උප කුලපති
මහාචාර්ය එම්.එම්.එම්. නජීම්

ලේඛකාධිකාරී
එච්. අබ්දුල් සද්දාර් මයා

2.10 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ඒ.ආර්. ආරියරත්න (2020.02.09 දක්වා)
පූජ්‍ය ඊතලවැටුනවැවේ ඥානතිල හිමි (2020.02.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි)

උප කුලපති
ආචාර්ය බී.ඒ. කරුණාරත්න

ලේඛකාධිකාරී
ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා

2.11 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර හිමි

උප කුලපති
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත (2020.05.18 දක්වා)
මහාචාර්ය ඩබ්ලිව්.කේ.ඒ.සී.ගනනපාල (වැඩබලන) 2020.05.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.11.02 දක්වා පත් කරන ලදී)
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ.රත්නායක (2020.11.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී

ලේඛකාධිකාරී
වී.ඩී.කිත්සිරි මයා (2020.03.30 දක්වා)
කමල් ගුණවර්ධන මයා (වැඩ බලන) (2020.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

2.12 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
දේශබන්දු මහාචාර්ය කේ. ටී. ද සිල්වා

උප කුලපති
මහාචාර්ය ඊ.එම්.පි. ඒකනායක (2020.05.21 දක්වා)
ආචාර්ය සංජීව බෝවත්ත (වැඩ බලන)(2020.05.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.09.07 දක්වා පත් කරන ලදී.)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.යූ.කේ.ජයසිංහ (2020.09.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. ඒ.ඩී.චිත්‍රානන්ද මයා

2.13 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති
ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රත්නපල ධම්මරක්කිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමි

උප කුලපති
මහාචාර්ය ජේ.එල්.රත්නසේකර (වැඩබලන)(2020.01.28 සිට ක්‍රියාත්මක වන පරිදි 2020.11.03 දක්වා පත් කරන ලදී.)
මහාචාර්ය ජේ.එල්.රත්නසේකර (2020.11.04 දින සිට පත් කරන ලදී.)

ලේඛකාධිකාරී
එම්.එෆ්. හිබතුල් කරීම් මයා
ඒ.ජේ.එම්.ඩී.එන්.බී. නාවෙල (වැඩබලන) (එම්.එෆ්. හිබතුල් කරීම් මයා වැඩ භාරගන්නා තෙක් 2020.07.26 දක්වා)

2.14 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කොල්වින් ගුණරත්න (2020.03.08 දක්වා)
මහාචාර්ය ධම්මික ඒ තන්ත්‍රිසොද (2020.09.15 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ.ආරියදුරෙ

නියෝජ්‍ය උප කුලපති
ආචාර්ය ඒ පී මදුරප්පෙරුම

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එල්.වී.ජයසේන මිය
පී. කේ. සෙනෙවිරත්න මයා (වැඩබලන) (2020.08.01 සිට ක්‍රියාත්මක වන පරිදි 2020.10.31 දක්වා පත් කරන ලදී)

2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කුලපති
සම්මානිත මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි

නිසි බලධාරියා
සම්මානිත මහාචාර්ය ඩබ්ලිව්.එම් අබයරත්න බණ්ඩාර (2020.10.12 දක්වා)

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) රොහන පී. මහලියනාරච්චි (2020.10.13 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.)

ලේඛකාධිකාරී
බී.එම්.දයාවංස මයා

3. ආයතන

3.1 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව (2020.11.08 දක්වා)
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව (වැඩ බලන) (2020.11.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

3.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.එම්.ගාමිණී අධිකාරී

3.3 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය අජන්ත ධර්මසිරි

3.4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.ජානක ද සිල්වා (2020.03.31 දක්වා)
මහාචාර්ය සේනක රාජපක්ෂ (2020.04.01 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

3.5 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි

3.6 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ පිටවල

3.7 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය එච්.එස්. රඹුක්වැල්ල

3.8 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය ජේ.එම්. ආනන්ද ජයවික්‍රම

3.9 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය පී.ඒ.පරණගම

3.10 මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ

අභාවප්‍රාප්ත මහාචාර්ය ජේ.ඒ.එස්.කේ.ජයකොඩි (2020.07.27 දක්වා)

කමනි මාතොටආරච්චි (වැඩ බලන)(2020.07.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

3.11 කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය

අධ්‍යක්ෂ

මහාචාර්ය කේ.පී.හේවාගමගේ

3.12 ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

නිසි බලධාරියා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.ඒ.ලියනගේ

3.13 ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ

ප්‍රසන්න රණවීර මයා (2020.02.23 දක්වා)

ආචාර්ය රුවන් ගමගේ (වැඩබලන) (2020.02.24 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

3.14 තොරතුරු තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

නිසි බලධාරියා

ආචාර්ය නවරත්නගේ සුනිල් ජයන්ත නවරත්න (2020.01.01 සිට ක්‍රියාත්මක කරන පරිදි 2020.06.30 දක්වා පත් කරන ලදී)

මහාචාර්ය එස්.එම්.ඒ.නානයක්කාර (2020.07.01 සිට ක්‍රියාත්මක කරන පරිදි 2020.09.30 දක්වා පත් කරන ලදී)
ආචාර්ය සී.එස්.ලෙවන්ගමගේ (2020.10.01 සිට ක්‍රියාත්මක කරන පරිදි පත්කරන ලදී)

3.15 පෙව රසායන අණුක පෙවවේද හා පෙව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

3.16 මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ
මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි (2020.04.30 දක්වා)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.ඒ.ලියනගේ (වැඩබලන)(2020.05.01 සිට ක්‍රියාත්මක වන පත් කරන ලදී)

3.17 සෞන්දර්යය අධ්‍යයන පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය අම්මාන්කිලි මුරුගත්ස් මිය (වැඩබලන)

3.18 කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්.සුතර්සන් (2020.06.08 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

3.19 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජයන්ත ජයවර්ධන (2020.03.31 දක්වා)
මහාචාර්ය වසන්ත ගුණතුංග (වැඩබලන) (2020.04.01 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

4. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කළ අතර 2019 අගෝස්තු මාසයේදී පැවැත්වුණු අ.පො.ස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2020 මාර්තු මාසයේ දී අපේක්ෂකයින්ගෙන් 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවන ලදී .ඒ අනුව, සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කර ඇති අතර, කඩඉම් ලකුණු 2020 ඔක්තෝබර් මාසයේ දී නිකුත් කරන ලදී. කෙසේ වෙතත් රටේ පවතින කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම සිදු කරමින් පවතින අතර එය 2021 දී අවසන් කිරීමට නියමිතය.

4.1 <u>*සාමාන්‍ය විධිවිධාන*</u> යටතේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2019 අගෝස්තු මාසයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමට පහත සඳහන් ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී.

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2019 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස.උසස් පෙළ විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව සිදු කිරීම.

2. [*කලා, කලා (SP), කලා(SAB), සන්නිවේදන අධ්‍යයන, සාමය හා ගැටුම් නිරාකරණය, ඉස්ලාම් අධ්‍යයන, අරාබි භාෂාව සහ ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) සහ සමාජ විෘනවේදය*] වැනි කලා පාඨමාලා සඳහා දී ඇති දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයේ දී යම් දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාවට වඩා අඩු නොවිය යුතුය යන කොන්දේසියට යටත්ව දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිසුන් ඇතුළත් කිරීම් සිදු කරන ලදි.

3. ඉහත 1.1.2 හි සඳහන් පාඨමාලා හැරුණු විට අනෙකුත් සියලුම පාඨමාලා සඳහා ද්විත්ව නිර්ණායක මත ඇතුළත් කිරීම් සිදු කරන ලදි:

    - දීප ව්‍යාප්ත කුසලතා පදනම
    - දිස්ත්‍රික් කුසලතා පදනම

4. යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇති මුළු ස්ථානවලින් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

5. ඉතිරි 60% න් 55%ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දීප ව්‍යාප්ත කුසලතා පදනම් මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්න සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ .ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55%ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

6. එක් එක් පාඨමාලාවේ පවතින 5%ක් දක්වා වූ ඉතිරි ස්ථාන සිසුන් අතර බෙදා හැරීමේදී, අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇති පහත දැක්වෙන දිස්ත්‍රික්ක 16 සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16 හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ;

1. නුවරඑළිය	9. මඩකලපුව
2. හම්බන්තොට	10. අම්පාර
3. යාපනය	11. පුත්තලම
4. කිලිනොච්චිය	12. අනුරාධපුරය
5. මන්නාරම	13. පොලොන්නරුව
6. මුලතිව්	14. බදුල්ල
7. වව්නියා	15. මොණරාගල
8. ත්‍රිකුණාමලය	16. රත්නපුර

7. තවද, කලා හැර වෙනත් පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී, කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඕනෑම දිස්ත්‍රික්කයකට වෙන් කර ඇති දිස්ත්‍රික් පංගු ප්‍රමාණය, 1993/1994 හෝ 2002/2003, අධ්‍යයන වර්ෂයන්වල දී එම එක් එක් පාඨමාලාව සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට වෙන් කර තිබූ දිස්ත්‍රික් පංගු ප්‍රමාණයේ උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදු කෙරිණි.

8. 2019 අ.පොෂ (උසස් පෙළ) විභාගය විෂය නිර්දේශ දෙකක් යටතේ පැවැත්වූ බැවින්, 2011 වර්ෂයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගය සඳහා නව සහ පැරණි විෂය නිර්දේශයන් යටතේ පෙනී සිටි සිසුන්ට අදාළව SC(FR) 29/2012 නඩුයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගය අනුව යමින්, 2019 වර්ෂයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන් ද වෙනම කාණ්ඩ දෙකක් (two distinct populations) වශයෙන් සැලකීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලදී. ඒ අනුව, 2019 වර්ෂයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගයේ දී සිසුන් විසින් ලබා ගන්නා Z- අගය පදනම් කරගෙන 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සිසුන් තෝරා ගැනීම සඳහා භාවිත කළ යුතු නිර්ණායක මොනවාද යන්න යෝජනා කිරීමට නිපුණතා කමිටුවක් (Committee of Experts) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදි.

   එම නිපුණතා කමිටුවෙහි නිර්දේශ පදනම් කර ගෙන, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත) 15 (vii) වගන්තියට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ නිර්දේශ සහ නීතිපතිගේ උපදෙස් පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් තීරණවලට එළඹුණි.

   - 2019 වර්ෂයේ අ.පොෂ.(උසස් පෙළ) විභාගය සඳහා <u>නව නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>පළමු වරට</u> අ.පොෂ.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ *(Composite Average)* ප්‍රතිශතය වේ.

   - 2019 වර්ෂයේ අ.පොෂ.(උසස් පෙළ) විභාගය සඳහා <u>පැරණි නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>දෙවන සහ තුන්වන වරට</u> අ.පොෂ.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ *(Composite Average)* ප්‍රතිශතය වේ.

9. ඒ අනුව, 2019 වර්ෂයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම ඉහතින් සඳහන් කරන ලද තීරණවලට අනුව සහ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කරන ලදී.

2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා යෝජිත බඳවා ගැනීම් ප්‍රමාණය **34,161** ක් වූ අතර **2019/2020** අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අපේක්ෂකයින් **181,144** ක් සුදුසුකම් ලබා තිබුණි.

4.1.1 සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම

පහත දැක්වෙන පරිදි සාමාන්‍ය විධිවිධාන යටතේ සිසුන් 40,111 ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලදි;

2019/2020 අධ්‍යයන වර්ෂය

අධ්‍යයන පාඨමාලාව	තෝරා ගත් සංඛ්‍යාව	
	නව විෂය නිර්දේශය	*පැරණි විෂය නිර්දේශය*
1. වෛද්‍ය විද්‍යාව	608	1216
2. දන්ත ශල්‍ය විද්‍යාව	41	77
3. පශු වෛද්‍ය විද්‍යාව	46	81
4. කෘෂිකර්මය	311	546
5. ආහාර විද්‍යාව හා පෝෂණය	54	107
6. ජෛවීය විද්‍යාව	565	1102
7. ව්‍යවහාරික විද්‍යාව(ජෛවීය විද්‍යාව)	149	286
8. ඉංජිනේරු විද්‍යාව	1083	1099
9. ඉංජිනේරු විද්‍යාව - (EM)	32	45
10. ඉංජිනේරු විද්‍යාව - (TM)	39	56
11. ප්‍රමාණ සමීක්ෂණය	62	88
12. පරිගණක විද්‍යාව	255	362
13. භෞතීය විද්‍යාව	1008	1318
14. මැනුම් විද්‍යාව	61	101
15. ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව)	335	453
16. කළමනාකරණය	3875	1395
17. දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	49	36
18. වාණිජ්‍යය	574	295
19. කලා	4553	2267
20. කලා (SP)- ජනමාධ්‍ය	63	45
21. කලා (SAB)	175	128
22. කළමනාකරණ අධ්‍යයන - (TV)	267	185
23. වාස්තු විද්‍යාව	52	45
24. නිර්මාණවේදය	41	43
25. නීතිය	414	77
26. තොරතුරු තාක්ෂණය(IT)	84	164
27. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)	32	84
28. කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	73	38
29. සන්නිවේදන අධ්‍යයනය	112	85
30. නගර හා ග්‍රාම නිර්මාණය	53	32
31. සාමය හා ගැටුම් නිරාකරණය	22	11
32. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	122	257

33. යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	39	47
34. විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	56	20
35. ආහාර විද්‍යාව හා තාක්ෂණය	61	172
36. සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	128	116
37. භෙද	176	358
38. තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	91	191
39. කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	61	157
40. කලා (විශේෂ) / ප්‍රසාංගික කලා	64	43
41. සෞඛ්‍ය ප්‍රවර්ධනය	40	60
42. ඖෂධ විද්‍යාව	55	169
43. වෛද්‍ය රසායනාගාර විද්‍යා	48	173
44. විකිරණ ශිල්පය	31	34
45. භෞත චිකිත්ස	32	67
46. පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	41	65
47. පහසුකම් කළමනාකරණය	38	40
48. ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	36	52
49. අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව	33	44
50. කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	43	75
51. සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	35	41
52. පරිගණනය හා කළමනාකරණය	40	32
53. ධීවර සහ සාගර විද්‍යාව	42	75
54. ඉස්ලාම් අධ්‍යයනය	234	41
55. විද්‍යාව සහ තාක්ෂණය	43	62
56. පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	31	67
57. ව්‍යවසායකත්වය හා කළමනාකරණය	57	41
58. සත්ත්ව පාලන විද්‍යාව	37	68
59. සංගීතය	380	120
60. නර්තනය	303	171
61. චිත්‍ර සහ නිර්මාණ	49	10
62. නාට්‍ය හා රංග කලා	116	55
63. දෘශ්‍ය සහ තාක්ෂණික කලා	62	29
64. අපනයන කෘෂිකර්මය	33	69
65. තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	39	70
66. කාර්මික තොරතුරු තාක්ෂණය	51	46
67. ඛනිජ සම්පත් සහ තාක්ෂණය	40	64
68. ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)(BIS)	47	30
69. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	122	45
70. ආගනණය සහ තොරතුරු පද්ධති	75	100
71. ශාරීරික අධ්‍යාපනය	49	45
72. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	115	60
73. කථන හා ශ්‍රවන විද්‍යා	45	37
74. අරාබි භාෂාව	202	20
75. දෘශ්‍ය කලා	69	45
76. සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව	29	42

77. ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	44	92
78. ජලජ සම්පත් තාක්ෂණය	34	78
79. තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම	31	70
80. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	62	43
81. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	82	42
82. සංචාරක හා සත්කාරක කළමනාකරණය	108	70
83. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	46	132
84. කෘෂි ව්‍යාපාර කළමනාකරණය	31	44
85. හරිත තාක්ෂණය	32	37
86. තොරතුරු පද්ධති	51	73
87. භූමි නිර්මාණවේදය	37	41
88. පරිවර්තන අධ්‍යයනය	75	56
89. මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	58	56
90. සිනමා හා රූපවාහිනී අධ්‍යයන	37	32
91. ව්‍යාපෘති කළමනාකරණය	62	36
92. ඉංජිනේරු තාක්ෂණවේදය - (ET)	1089	198
93. ජෛව පද්ධති තාක්ෂණවේදය - (BST)	1033	176
94. තොරතුරු සන්නිවේදන තාක්ෂණය	752	121
95. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL)	42	6
96. සාගර හා මිරිදිය විද්‍යාව	43	44
97. ආහාර ව්‍යාපාර කළමනාකරණය	73	59
98. භෞතීය විද්‍යාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	98	66
99. ව්‍යාපාර විද්‍යාව	97	50
100. මූල්‍ය ඉංජිනේරුකරණය	52	26
101. භූගෝලීය තොරතුරු විද්‍යාව	45	27
102. සමාජ වෘතවේදය	43	5
103. මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	36	36
104. මානව සම්පත් සංවර්ධනය	41	41
එක් එක් විෂය නිර්දේශයෙන් තෝරාගත් මුළු සංඛ්‍යාව	**22,862**	**17,249**
2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් මුළු සංඛ්‍යාව	**40,111**	

වගුව **4.1** **සාමාන්‍ය විධිවිධාන අනුව නව හා පැරණි විෂය නිර්දේශය යටතේ තෝරාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව**

4.2 හඳුන්වාදෙන ලද නව අධ්‍යයන පාඨමාලා

2019/2020 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නව අධ්‍යයන පාඨමාලා දෙකක් හඳුන්වා දෙන ලදී.

අංකය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	රුහුණු විශ්වවිද්‍යාලය	50
2	මානව සම්පත් සංවර්ධනය	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	65

වගුව 4.2 **2019/2020** වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා

4.3 *<u>විශේෂ විධිවිධාන</u>* යටතේ **2018/2019** අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම **(2018** අගෝස්තු මාසයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

(අ) අන්ධ හා කායික අශක්නතාවන් ඇති සිසුන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්ධ සිසුන් සීමිත සංඛ්‍යාවක් [බ්‍රේල් ක්‍රමය භාවිතා කරමින් 2018 අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්] කලා අධ්‍යයන පාඨමාලාවටත්, කායික අශක්නතාවන් ඇති සිසුන් (වෛද්‍යමය වශයෙන් විවිධ කායික අශක්නතාවන් ඇති බවට සහතික කර ඇති) කලා, වාණිජ්‍යය, ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව යන අධ්‍යයන පාඨමාලාවලට ඇතුළත් කර ගන්නා ලදී.

අධ්‍යයන පාඨමාලාව	එකතුව	විෂයයන්			
		කලා	වාණිජ්‍යය	ජීව විද්‍යාව	භෞතික විද්‍යාව
1. අන්ධ සිසුන්	26	26			
2. කායික අශක්නතාවන් ඇති සිසුන්	67	52	4	5	6
එකතුව	**93**	**78**	**4**	**5**	**6**

වගුව **4.3.(අ)** අන්ධ හා කායික අශක්නතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම

(ආ) විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා හැරුණු විට අනෙක් සෑම අධ්‍යයන පාඨමාලාවකම ඇති ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක්, සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම්කිසි පාඨමාලාවකට නොතේරුණු එහෙත්, ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු (උදා: නැටුම්, චිත්‍ර, සංගීතය හා සාහිත්‍යය) බාල දක්ෂ සහ ශිෂ්‍ය බට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලින් 2015.08.01 සිට 2018.07.31 දක්වා කාලය තුළ ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති ශිෂ්‍යයන්ට මෙම අවස්ථාව පිරිනැමේ. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා එකඟ වී ඇති ස්ථානවලින් 4% ක් දක්වා මෙම කාණ්ඩය යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වෙන් කර ඇත.

2018/2019 අධ්‍යයන වර්ෂය	
අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1. වෛද්‍ය විද්‍යාව	7
2. දන්ත ශල්‍ය විද්‍යාව	1
3. පශු වෛද්‍ය විද්‍යාව	1
4. කෘෂිකර්මය	3
5. ආහාර විද්‍යාව හා පෝෂණය	1
6. ජෛවීය විද්‍යාව	7
7. ව්‍යවහාරික විද්‍යාව (ජෛවිය විද්‍යා)	2
8. ඉංජිනේරු විද්‍යාව	9
9. ඉංජිනේරු විද්‍යාව (EM)	1
10. ඉංජිනේරු විද්‍යාව (TM)	1
11. ප්‍රමාණ සමීක්ෂණය	1
12. පරිගණක විද්‍යාව	2
13. භෞතීය විද්‍යාව	10
14. ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව)	3
15. කළමනාකරණය	22
16. දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය	1
17. වාණිජ්‍යය	3
18. කලා	30
19. කලා (SP) - ජනමාධ්‍ය	1
20. කලා (SAB) –A	1
21. කළමනාකරණ අධ්‍යයන (TV) –A	1
22. වාස්තු විද්‍යාව	1
23. නිර්මාණවේදය	1
24. නීතිය	2
25. තොරතුරු තාක්ෂණය (IT)	1
26. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)	1
27. කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	1
28. සන්නිවේදන අධ්‍යයන	1
29. නගර හා ග්‍රාම නිර්මාණය	1
30. සාමය හා ගැටුම් නිරාකරණය	1
31. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	1
32. ආහාර විද්‍යාව හා තාක්ෂණය	1
33. සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	1
34. භෙද	1
35. තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	1
36. කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	1
37. කළමනාකරණ අධ්‍යයන (TV) –B	1
38. කලා (විශේෂ) - ප්‍රසාංගික කලා	1

39. කලා (SAB) –B	1
40. නර්තනය (ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය)	1
41. සංගීතය (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	10
42. නර්තනය (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	10
43. නාට්‍ය හා රංග කලා (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	2
44. ඖෂධ විද්‍යාව	1
45. වෛද්‍ය රසායනාගාර විද්‍යාව	1
46. විකිරණ ශිල්පය	1
47. භෞත චිකිත්ස	1
48. පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	1
49. ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	1
50. අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	1
51. සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	1
52. පරිගණනය හා කළමනාකරණය	1
53. ධීවර සහ සාගර විද්‍යාව	1
54. ඉස්ලාම් අධ්‍යයනය	1
55. පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	1
56. සත්ත්ව පාලන විද්‍යාව	1
57. නර්තනය (රාමනාදන්)	1
58. නාට්‍ය හා රංග කලා (ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය)	1
59. තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	1
60. කාර්මික තොරතුරු තාක්ෂණය	1
61. ඛනිජ සම්පත් සහ තාක්ෂණය	1
62. ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)(BIS)	1
63. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	1
64. ශාරීරික අධ්‍යාපනය	1
65. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	1
66. දෘශ්‍ය කලා	2
67. ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	1
68. ජලජ සම්පත් තාක්ෂණය	1
69. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි කළමනාකරණය	1
70. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	1
71. සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය	1
72. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	1
73. කෘෂි ව්‍යාපාර කළමනාකරණය	1
74. හරිත තාක්ෂණය	1
75. භූමි නිර්මාණවේදය	1
76. පරිවර්තන අධ්‍යයනය	1
77. මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	1
78. සිනමා හා රූපවාහිනී අධ්‍යයනය	1

79. ව්‍යාපෘති කළමනාකරණය	1
80. ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	5
81. ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	3
82. තොරතුරු සන්නිවේදන තාක්ෂණය	3
83. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL)	1
84. ආහාර ව්‍යාපාර කළමනාකරණය	1
85. භෞතීය විද්‍යාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	1
86. ව්‍යාපාර විද්‍යාව	1
87. මූල්‍ය ඉංජිනේරුකරණය	1
88. භූගෝලීය තොරතුරු විද්‍යාව	1
89. සමාජ වෘතවේදය	1
2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් මුළු සංඛ්‍යාව	**205**

වගුව **4.3.(ආ)** **විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම**

(ඇ) ගුරුවරුන් ඇතුළත් කර ගැනීම

සෑම අධ්‍යයන වර්ෂයකදී ම කලා, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලා සඳහා පහත සඳහන් කාණ්ඩවලට අයත් ගුරුවරුන් සීමිත සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත.

අ) කලා අධ්‍යයන පාඨමාලාව සඳහා එක් විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂය හදාරා ඇති, 2014 වර්ෂයේ දී හෝ ඊට පසු වර්ෂයකදී සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය සමත් ගුරුවරුන්.

ආ) ජෛවීය විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලාවක් සඳහා 2014 වර්දීෂයේ දී හෝ ඊට පසු වර්ෂයක දී විද්‍යාවේ දී (බාහිර) උපාධි පාඨමාලාවේ පළමු විභාගය සමත් වූ ගුරුවරුන්.

ඒ අනුව; 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා කලා අධ්‍යයන පාඨමාලාව සඳහා මෙම කාණ්ඩය යටතේ එක් ගුරුවරයෙකු තෝරා ගන්නා ලදී.

4.4 ***විශේෂ විධිවිධාන*** **යටතේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2019 අගෝස්තු මාසයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)-** *තවමත් අවසන් කර නොමැත*

5. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම

5.1 ස්ථාවර කමිටු

සංශෝධිත 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 4 වන වගන්තියේ (2)වන උප වගන්තිය යටතේ ලබා දී ඇති විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු පිහිටුවා ඇත. එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම නම් අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය හා සම්බන්ධ කරුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීමය. ඒ අනුව 2020 වර්ෂය තුළ විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු විස්සක් (20) හා වෙනත් එක් (1) කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ක්‍රියාත්මක විය. එම එක් එක් කමිටු හා ඒ යටතේ පැවැති රැස්වීම් වාර ගණන පහත සඳහන් කර ඇත;

අංකය	ස්ථාවර කමිටුවේ නම	2020 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
01.	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව	01
02.	වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	08
03.	දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	04
04.	විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	05
05.	කෘෂිකර්ම, පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව පාලන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	05
06.	පශ්චාත් උපාධි අධ්‍යයනය හා පර්යේෂණය පිළිබඳ ස්ථාවර කමිටුව	03
07.	ඉංජිනේරු හා වාස්තු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	05
08.	තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව	05
09.	මානව ශාස්ත්‍ර සමාජ විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	06
10.	අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව	04
11.	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව	05
12.	කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	04
13.	බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුව	03
14.	පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුව	05
15.	නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	04
16.	පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	05
17.	ලලිත කලා පිළිබඳ ස්ථාවර කමිටුව	04
18.	සම සෞඛ්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	05
19.	විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා පිළිබඳ ස්ථාවර කමිටුව	04
20.	තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මාර්ගගත අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව	01
	වෙනත් කමිටු	
21.	සුදුසුකම් /උපාධි පිරිනමන ආයතන පිළිගනු ලැබීම සඳහා වූ අයදුම්පත් අධ්‍යයනය කිරීම සඳහා වූ කමිටුව	01

වගුව **5.1** ස්ථාවර කමිටු සහ වෙනත් කමිටු විසින් **2020** දී පවත්වන ලද රැස්වීම්

5.2 2020 වර්ෂය තුළ අනුමත කරන ලද පීඨ/ අධ්‍යයනාංශ/ ප්‍රථම උපාධි පාඨමාලා, බාහිර හා පශ්චාත් උපාධි වැඩසටහන්

අවස්ථා ප්‍රමාණය වැඩි කිරීම සහ උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශ ගණන වැඩි කිරීමේ අභිප්‍රාය ඇතිව, 2020 වර්ෂය තුළ නව පීඨ 4 ක්, නව අධ්‍යයනාංශ 27ක්, නව ප්‍රථම උපාධි පාඨමාලා 11ක්, නව විශේෂවේදී ප්‍රථම උපාධි පාඨමාලා 11ක් සහ නව පශ්චාත් උපාධි වැඩසටහන් 33 ක් හඳුන්වා දී අනුමත කරන ලදී. මේවා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත;

අංකය	පීඨයේ නම	විශ්වවිද්‍යාලය
1	දේශීය වෛද්‍ය පීඨය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
2	දේශීය සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
3	දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
4	උපාධි අධ්‍යයන පීඨය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

වගුව 5.2.1 2020 වර්ෂයේ අනුමත කරන ලද පීඨ

අංකය	අධ්‍යයනාංශයේ නම	විශ්වවිද්‍යාලය
1	පරිසර හා කාර්මික විද්‍යා අධ්‍යයනාංශය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2	ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය අධ්‍යයනාංශය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3	වෛද්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය	කොළඹ විශ්වවිද්‍යාලය
4	ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය	රුහුණ විශ්වවිද්‍යාලය
5	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
6	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT)	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
7	පරිගණක විද්‍යා අධ්‍යයනාංශය	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
8	තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
9	ආයුර්වේද මූලික මූලධර්ම පිළිබඳ අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
10	විකිත්සා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
11	කෞමරභෘත්‍ය හා ස්ත්‍රෛරෝගා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

12	ශල්‍යාශාලක්‍ය අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
13	භාෂා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
14	රෝග විඡ්ඡන අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
15	දේශීය චිකිත්සා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
16	දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
17	තාක්ෂණ අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
18	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
19	දේශීය සමාජ විද්‍යා අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
20	කළමනාකරණ අධ්‍යයන අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
21	ද්‍රව්‍යගුන විඥාන අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
22	මූල්‍ය අධ්‍යයනාංශය	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
23	ව්‍යාපෘති කළමනාකරණ අධ්‍යයනාංශය	වව්නියා මණ්ඩපය
24	මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය	වව්නියා මණ්ඩපය
25	අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය	වව්නියා මණ්ඩපය
26	ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	වව්නියා මණ්ඩපය
27	කළමනාකරණ හා ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය	වව්නියා මණ්ඩපය

වගුව **5.2.2** **2020 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශ**

අංකය	උපාධි වැඩසටහනේ නම	විශ්වවිද්‍යාලය
1	මූල්‍ය ගණිතය හා කාර්මික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	රුහුණ විශ්වවිද්‍යාලය
2	මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
3	වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
4	දෘෂ්ටි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
5	වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය	මොරටුව විශ්වවිද්‍යාලය
6	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
7	කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	මොරටුව විශ්වවිද්‍යාලය
8	ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
9	ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
10	ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
11	ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය

වගුව **5.2.3** **2020 වර්ෂයේ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා**

අංකය	විශේෂවේදී උපාධියේ නම	විශ්වවිද්‍යාලය
1	ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	යාපනය විශ්වවිද්‍යාලය
2	ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3	දන්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4	ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය [බීඒ ගෞරව (ජන සන්නිවේදනය)]	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

6	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය [බීඒ ගෞරව (සමාජ විද්‍යාව)]	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
7	ජෛව වෛද්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8	උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
9	ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
10	ව්‍යාපාර නීතිය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	රුහුණ විශ්වවිද්‍යාලය
11	මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	රුහුණ විශ්වවිද්‍යාලය

වගුව **5.2.4** **2020 වර්ෂයේ අනුමත කරන ලද විශේෂවේදී උපාධි පාඨමාලා**

අංකය	උපාධි වැඩසටහනේ නම	විශ්වවිද්‍යාලය
1	දත්ත විශ්ලේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
2	තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MIT)	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
3	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
4	අධ්‍යාපන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
5	තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MIT)	කැලණිය විශ්වවිද්‍යාලය
6	ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
7	විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	කැලණිය විශ්වවිද්‍යාලය
8	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
9	විශ්ලේෂණ රසායන විද්‍යා වැඩසටහන් පිළිබඳ විද්‍යාපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය

10	ආයුර්වේද කෞමාරභ්‍රිත්‍ය ආචාර්ය උපාධිය සහ මණ්ඩල සහතිකය	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
11	ආයුර්වේද කයාචිකිත්සා ආචාර්ය උපාධිය සහ මණ්ඩල සහතිකය	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
12	හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
13	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
14	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
15	ගණකාධිකරණ හා මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
16	ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව [PGDip (ඉතිහාසය)]	කොළඹ විශ්වවිද්‍යාලය
17	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය [එම්. ඉතිහාසය]	කොළඹ විශ්වවිද්‍යාලය
18	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
19	පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
20	පරිසර කළමනාකරණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	පරිසර කළමනාකරණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
21	ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
22	සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
23	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
24	මානව සම්පත් කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය	මානව සම්පත් කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය
25	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
26	පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
27	පරිසර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය

28	පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	කැලණිය විශ්වවිද්‍යාලය
29	අධිකරණ වෛද්‍ය විද්‍යා ශාස්ත්‍රපති උපාධිය	කොළඹ විශ්වවිද්‍යාලය
30	ජෛව රසායන විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
31	ජෛව රසායන විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	කැලණිය විශ්වවිද්‍යාලය
32	ජෛව රසායන විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	කැලණිය විශ්වවිද්‍යාලය
33	ජෛව රසායන විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව	කැලණිය විශ්වවිද්‍යාලය

වගුව **5.2.5** **2020 වර්ෂයේ අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන්**

5.3 2020 වර්ෂය තුළ අනුමත කරන ලද පීඨ, අධ්‍යයනාංශ හා ප්‍රථම උපාධි පාඨමාලාවල නම වෙනස් කිරීම්

2020 වර්ෂය තුළ පහත වගුවල දක්වා ඇති පරිදි පිළිවෙලින් අධ්‍යයනාංශ 3ක නාම වෙනස් කිරීම් සහ ප්‍රථම උපාධි පාඨමාලා 101ක නාම වෙනස් කිරීම් යෝජනා කර අනුමත කරන ලදී.

	අධ්‍යයනාංශයේ පවතින නම	අධ්‍යයනාංශයේ අනුමත නම	විශ්වවිද්‍යාලය
1	කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය	කාය ව්‍යවච්ඡේද විද්‍යා, ජාන විද්‍යාව සහ ජෛව වෛද්‍ය තොරතුරු අධ්‍යයනාංශය	කොළඹ විශ්වවිද්‍යාලය
2	ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා හා ප්‍රතිශක්ති විද්‍යා අධ්‍යයනාංශය	කොළඹ විශ්වවිද්‍යාලය
3	රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණ අධ්‍යයනාංශය	රෙදිපිළි හා ඇඟලුම් ඉංජිනේරු අධ්‍යයනාංශය	මොරටුව විශ්වවිද්‍යාලය

වගුව **5.3.2** **2020 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශවල නම වෙනස් කිරීම්**

5.4 දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකික සිසුන් තම උසස් අධ්‍යාපන හදාරන ලද දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පිළිගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් 1000 කට අධික ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපුරා දෙන ලදී. මෙම දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීමේ කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. 1992 මාර්තු 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/92 හි විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල පිළිබඳ ජාත්‍යන්තර අත්පොතේ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල

විශ්වවිද්‍යාල පිළිබඳ වාර්ෂික සංග්‍රහයේ ලැයිස්තුගත කර ඇති විදේශ විශ්වවිද්‍යාල සඳහා පිළිගැනීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

5.5 කලා / මානව ශාස්ත්‍ර උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

පහත දැක්වෙන අරමුණු සපුරාලමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන ශ්‍රී ලංකාවේ ඕනෑම විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබන කලා /මානව ශාස්ත්‍ර උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘති යෝජනාවේ අපේක්ෂාවයි;

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණ පිළිබඳ සහතිකයක් / ඩිප්ලෝමාවක් ලබා ගැනීමට උපාධි අපේක්ෂකයින්ට අවස්ථාව ලබා දීම.

2. සියළුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම තුළින් සිසුන්ට නවීන පහසුකම් අත්විඳීමට සැලැස්වීම.

3. සියලුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ සේවා ඒකක /අධ්‍යයනාංශ පිහිටුවීම.

මෙම ව්‍යාපෘතිය මගින් කලා හා මානව ශාස්ත්‍ර / දෘශ්‍ය හා ප්‍රසාංගික කලා පීඨවල තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ සහ විද්‍යාගාර පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර ඒ සඳහා ලෝක බැංකුවේ උසස් අධ්‍යාපන පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මඟින් අරමුදල් සපයනු ලැබේ.

5.6 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා හරහා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂණ ප්‍රතිඵල සංවර්ධනය කරමින් ලද නිෂ්පාදන හා සේවාවන් වාණිජකරණය කිරීමේ වැදගත්කම

රාජ්‍ය විශ්වවිද්‍යාලවල විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා කුටි හා රාජ්‍ය නොවන ආයතනවල උසස් අධ්‍යාපන ආයතන - සමාජ සම්බන්ධතා කුටි හරහා නිෂ්පාදන හෝ සේවා වාණිජකරණය කිරීම සඳහා වඩාත් සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා, පර්යේෂණ ප්‍රතිඵල වාණිජ හවුල්කරුවන් වෙත ගෙනයාමට සහාය වීමට පේටන්ට් දත්ත පද්ධති වෙත ප්‍රවේශය ලබා දීම හා CONNECT AHEAD යෙදවුම, 2020 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයෙන් වැඩි සාමාජිකයින් ප්‍රමාණයක් එක් කර ගැනීමේ වැදගත්කම අවධාරණය කෙරිණි.වර්තමානයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ප්‍රතිඵල AHEAD UBL ලකුණු කාඩ්පතේ විවිධ අදියරයන් හරහා නිරීක්ෂණය කරනු ලැබේ. මෙය පහත සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කර ඇත

- පර්යේෂණ වාණිජකරණය කිරීම තුළින් විශ්වවිද්‍යාලවල සංවර්ධනය කරන ලද නව තාක්ෂණය, අදාළ කර්මාන්තයට හා ප්‍රජාව වෙත ගෙන යාම ප්‍රවර්ධනය කිරීම.
- වාණිජකරණ ප්‍රයත්නයන් වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා විශ්වවිද්‍යාල, වාණිජ මණ්ඩල, සංගම් සහ කර්මාන්ත අතර ජාලකරණ සහ උපායමාර්ගික හවුල්කාරිත්වයට පහසුකම් සැපයීම.
- විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා කුටි (UBL)/උසස් අධ්‍යාපන ආයතන - සමාජ සම්බන්ධතා (HEI-SL) කුටි මුහුණ දෙන අභියෝගයන්ට විසඳුම් සෙවීම.

- සංවර්ධනය කරන ලද නව තාක්ෂණයන් ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල සහ තෝරාගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා අවස්ථාවක් ලබා දීම.

5.7 විශ්වවිද්‍යාල පනත යටතේ විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද බාහිර උපාධි පිළිබඳ කාරක සභාවේ නිර්දේශ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2020 අගෝස්තු 23 දිනැති ලිපිය මගින් බාහිර උපාධි වැඩසටහන් සඳහා සිදු කරන නව ලියාපදිංචි කිරීම් සහ සියලුම ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන් (BA EDPs) ආරම්භ කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභිප්‍රාය වූයේ නව ලියාපදිංචි කිරීම් නැවත ආරම්භ කිරීමට පෙර තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ඇතුළු අදාළ සියලු දෙනාගේ අදහස්වලට අනුව පවත්නා විෂයමාලා ප්‍රතිව්‍යුහගත කිරීම හා සංශෝධනය කිරීමයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 අගෝස්තු 13 වන දින පැවති 1036 වන සභාවාරයේ දී උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාවල විෂයමාලා ප්‍රතිව්‍යුහගත කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණ හඳුනාගෙන නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. අදාළ කමිටුව විසින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයන්හි පීඨාධිපතිවරුන්, බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුවේ අධ්‍යක්ෂවරුන්, ශාස්ත්‍රවේදී උපාධි පිරිනමන විශ්වවිද්‍යාල හයක් සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව, බාහිර උපාධි පිරිනැමීම විධිමත් කිරීම සඳහා වක්‍රලේඛයක් නිකුත් කරන ලෙස කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කළේය.

5.8 විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල විකල්ප ඇගයීම් පැවැත්වීම සඳහා වූ මාර්ගෝපදේශ

ශ්‍රී ලංකා අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය (PTF) සහ උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) සමඟ පැවැත්වූ විවිධ රැස්වීම්වලදී විකල්ප ඇගයීම් පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාකච්ඡා කර තිබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම රැස්වීම්වලදී සිදු කළ සාකච්ඡා මත පදනම්ව, රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතු පහත සඳහන් මාර්ගෝපදේශ සකස් කර ඇත. මෙම විකල්ප ඇගයීම් ක්‍රම ගෝලීය වශයෙන් අනුගමනය කර ඇති අතර විශේෂයෙන් කොවිඩ්-19 වසංගත කාල පරිච්ඡේදය තුළ දී මෙම ක්‍රමවේද වැඩි වශයෙන් භාවිත වූයේ සංවෘත ලිඛිත විභාගවලට සිසුන්ට භෞතිකව සහභාගී වීමට නොහැකි වීම හේතුවෙනි.

1. විකල්ප ඇගයීම් පැවැත්වීම සඳහා පොදු මාර්ගෝපදේශ (අමුණා ඇත)
2. මාර්ගගත ඇගයීම් සඳහා නිශ්චිත මාර්ගෝපදේශ (අමුණා ඇත)

සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ප්‍රමාදයකින් හා බාධාවකින් තොරව කරගෙන යාම වෙනුවෙන් විශ්වවිද්‍යාල ඉහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

5.9 පවත්නා ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයේ (UTEL) ඉම් ලකුණු පුළුල් ලෙස සංශෝධනය කිරීම

ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයේ ක්‍රියාකාරී සැලසුම් කමිටුවේ (සාමාජිකයින් 8 දෙනෙකුගේ) සහභාගීත්වයෙන් වැඩමුළුවක් 2020 අගෝස්තු 14 සහ 15 යන දින දෙකේදී ජනකි

හෝටලයේදී පවත්වනු ලැබීය. මෙහි ප්‍රතිඵලය වූයේ පවත්නා ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයේ ඉම්ලකුණු පුළුල් ලෙස සංශෝධනය කිරීමයි.

5.10 උපාධි අපේක්ෂකයින් සඳහා වන අනාගත සැලසුම්

5.10.1 දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) සහ ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL)

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ස්ථාවර කමිටුව, පූර්ව විශ්වවිද්‍යාල මාර්ගගත / ඊ-ඉගෙනුම් ඉංග්‍රීසි පාඨමාලාවක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී. මෙය අළුතින් ලියාපදිංචි වන උපාධි අපේක්ෂකයින් සඳහා දැනට සිදු කෙරෙන ඉංග්‍රීසි පාඨමාලාව වෙනුවට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සංවර්ධනය කෙරෙන මාර්ගගත පාඨමාලාවකි.

මෙම පාඨමාලාව, අලුතින් ලියාපදිංචි වන සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා පිරිනැමෙන අතර පාඨමාලව අවසානයේ දී ඔවුන්ට විභාගයකට පෙනී සිටීමට සිදු වේ. රැකියාවක් සොයා ගැනීමේ දී ඉංග්‍රීසි භාෂා දැනුම වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා ඉහළ නැංවීම මෙම පාඨමාලාවේ පරමාර්ථය වේ.

ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණ සේවා සඳහා වන ජාතික මධ්‍යස්ථානය (UTEL) පිහිටුවන ලද අතර 2020 නොවැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂවරයෙකු ද ඒ සඳහා පත් කර ඇත. මෙම මධ්‍යස්ථානය විසින් සියලුම පරීක්ෂණ පවත්වනු ලැබේ. ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) සඳහා කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනයේ සහාය ඇතිව නියමු පරීක්ෂණයක් පවත්වනු ලැබූ අතර තවමත් පරීක්ෂණ සංවර්ධනය කරමින් පවතී.

5.10.2 කලා / මානව ශාස්ත්‍ර උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

තොරතුරු තාක්ෂණ කුසලතා ඉහළ නැංවීම තුළින් කලා / මානව ශාස්ත්‍ර උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළේය. මෙම යෝජනාවේ අරමුණු වූයේ:

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණ පිළිබඳ සහතිකයක්/ඩිප්ලෝමාවක් ලබා ගැනීමට උපාධි අපේක්ෂකයින්ට අවස්ථාව ලබා දීම.

2. සිසුන්ට නවීන පහසුකම් අත්විඳීමට හැකි වන පරිදි සියළුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම.

3. සියලුම මානව ශාස්ත්‍ර හා කලා පීඨවල තොරතුරු තාක්ෂණ සේවා ඒකක / අධ්‍යයනාංශ පිහිටුවීම.

ඒ අනුව, කලා හා මානව ශාස්ත්‍ර / දෘශ්‍ය හා ප්‍රසාංගික කලා පීඨවල තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ සහ විද්‍යාගාර පිහිටවනු ලබන අතර මේ සඳහා ලෝක බැංකුවේ AHEAD ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයනු ලැබේ.

5.11 නව විශ්වවිද්‍යාල

5.11.1 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය පිහිටුවීම

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අනුගත වූ අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස යක්කල පිහිටි ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය නංවාලීමට 2016.07.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කළ අතර 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)" නමින් වර්තමාන ආයතනය විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම සඳහා 2020.10.28 දිනැති 2199/12 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නියෝගයක් නිකුත් කරන ලදී. විශ්වවිද්‍යාලය පීඨ 4කින් සහ අධ්‍යයනාංශ 13 කින් සමන්විත වන අතර එමඟින් ප්‍රථම උපාධි පාඨමාලා 08 ක් සහ පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා 08 ක් පිරිනැමේ. 2020 වර්ෂයේ දී අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා සිසුන් 600 ක් පමණ ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාලය යෝජනා කර ඇත.

5.11.2 හෙද හා ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීම

වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" යටතේ හෙද හා ඉගැන්වීමේ වෘත්තීන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමේදී ඉහළ වෘත්තීය පිළිගැනීමක් හා වෘත්තීය නිපුණතාවයක් ඇති ගෝලීය වශයෙන් තරහකාරී වෘත්තිකයින් බිහිකිරීමේ අවශ්‍යතාවය මත හෙද හා ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීම හඳුනාගෙන ඇත. වර්තමාන තරහකාරී ගෝලීය රැකියා වෙළඳපොලේ හෙද හා ඉගැන්වීමේ වෘත්තිකයින් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

ඒ අනුව, ගෝලීය තරහකාරී රැකියා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් ඇති හෙද වෘත්තිකයින් සහ ඉගැන්වීමේ වෘත්තිකයන් බිහිකිරීමට ප්‍රමුඛත්වය දී තිබේ.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය හා නියාමනය යටතේ වර්තමාන හෙද පාසල් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය හා නියාමනය යටතේ වත්මන් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ වැඩිදියුණු කිරීම මගින් විශ්වවිද්‍යාල දෙකක් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට වඩා වෙනස් වූ විශේෂ අරමුණු සහිත විශ්වවිද්‍යාල ලෙස විශ්වවිද්‍යාල දෙකක් පිහිටුවීමට 2020.12.14 දින පැවති රැස්වීමේ දී කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය හිමි විය.

5.11.3 ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා විශ්වවිද්‍යාලය පිහිටුවීම

වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" යටතේ ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මූලික පියවර ගෙන තිබේ. කැබිනට් අමාත්‍යවරුන්ගේ තීරණයට අනුව 2020 දී ක්‍රීඩා විශ්වවිද්‍යාලය

පිහිටුවීම සඳහා ශක්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී.

5.12 විශ්වවිද්‍යාල පද්ධතියට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් කෙරෙහි කොවිඩ් -19 තත්ත්වය නිසා ඇති වූ බලපෑම

කෝවිඩ් -19 වසංගතයේ පළමු රැල්ල හේතුවෙන් 2020 මාර්තු 16 වන දින විශ්වවිද්‍යාල වසා දමන ලදී. විශ්වවිද්‍යාල වසා දැමීමේ කාලය තුළ සියලුම විශ්වවිද්‍යාල පාහේ ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) සමඟ එක්ව මාර්ගගත / දුරස්ථ ඉගෙනීම් වේගයෙන් ආරම්භ කළ අතර අධ්‍යයන වැඩසටහනේ වර්ගය, ඉදිරිපත් කිරීමේ භාෂා මාධ්‍යය නොසලකා බොහෝ සිසුන් අන්තර්ජාලය හරහා ඉගෙනීමට මහත් උනන්දුවක් හා කැමැත්තක් පෙන්නුම් කර ඇති බව මෙහි දී අගය කරමින් දැනුම් දිය යුතුය.

සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීමට සහ අවසාන වසරේ සිසුන්ට ප්‍රමුඛතාවය ලබා දීමට යටත්ව 2020 ජූනි 15 වන දින අධ්‍යයන කටයුතු භෞතිකව නැවත ආරම්භ කරන ලදී. අනෙකුත් සියලුම පීඨ සහ වසරවල සිසුන් සඳහා ද අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. 2020 ඔක්තෝබර් 05 වන දින ආරම්භ වූ නව කොරෝනා රැල්ලත් සමඟ, විශේෂයෙන් බස්නාහිර පළාතේ සමහර විශ්වවිද්‍යාල වසා දැමුණු නමුත් මාර්ගගත ක්‍රමය ඔස්සේ අධ්‍යයන වැඩසටහන් දිගටම පවත්වාගෙන යාමට පියවර ගන්නා ලදී.

ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) විසින් අවම බාධාවන් සහිත ක්‍රියාකාරීත්වකින් යුතුව දීර්ඝ කාලයක් දුරස්ථව වැඩ කිරීමට අවස්ථාව උදා කර දෙමින් ඉගෙනුම් හා පර්යේෂණ විෂයමාලාවන්ට මාර්ගගතව ප්‍රවේශ වීමට අවශ්‍ය මෙවලම් සපයන ලදී. ජනාධිපතිවරයාගේ මහ පෙන්වීම යටතේ සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහ අන්තර්ජාල සේවා සපයන්නන් සමඟ සහයෝගයෙන්, වර්තමාන තත්ත්වය තුළ විශ්වවිද්‍යාලවල ඉගෙනුම් ජාලයේ සේවාදායකයන්ට නොමිලේ දත්ත ප්‍රවේශය ලබා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිවරයාට හැකි විය. මෙම මුලපිරීම තුළින්, රාජ්‍ය විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට නිවසේ සිට අධ්‍යයන කටයුතු (SFH) සිදු කිරීමට පෙළඹවීමක් ඇති කරන ලදී.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල එකවර සිදු කෙරෙන ඉගැන්වීම් සහ ඉගෙනීම් ක්‍රියාවලිය සඳහා ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය සතුව 'LEARN.zoom.us' යනුවෙන් වීඩියෝ සම්මන්ත්‍රණ විකල්පයක් ඇත. වර්තමාන තත්ත්වය තුළ, ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය විසින් එහි සාමාජික ජාලය සමඟ එක්ව තමන්ගේම මාධ්‍ය සර්වරයන් පිහිටුවා ගනිමින් එහි සාමාජිකයින්ට (ගුරුවරුන්ට සහ සිසුන්ට) වේගවත් හා ලාභදායී අන්තර්ජාල විසඳුමක් ලබා දුන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජාත්‍යන්තර දත්ත කලාප පරාසය සුරකිමින්, වීඩියෝ සම්මන්ත්‍රණ දත්ත ගමනාගමනය, ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය තුළ තබා ගැනීමට හැකි විය. මෙම විසඳුම නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිටින ගුරුවරුන් සහ සිසුන්ට එකම ස්ථානයක, එකම වේලාවක සිට ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රමය සජීවීව අත්දැකීමට හැකියාව ලැබුණි.

මාර්ගගත ඉගෙනුම් හා ඉගැන්වීම් අඛණ්ඩව සිදු කිරීම සඳහා සාධාරණ මෙන්ම ප්‍රජාවට උපරිම ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ Zoom සේවාවන් ඔස්සේ ක්‍රියාත්මක වන වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරන ලදී.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල එකවර සිදු කෙරෙන ඉගැන්වීම් සහ ඉගෙනීම් ක්‍රියාවලිය සඳහා ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය සතුව 'LEARN.zoom.us' යනුවෙන් වීඩියෝ සම්මන්ත්‍රණ විකල්පයක් ඇත. වර්තමාන තත්ත්වය තුළ, ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය විසින් එහි සාමාජික ජාලය සමඟ එක්ව තමන්ගේම මාධ්‍ය සර්වරයන් පිහිටුවා ගනිමින් එහි සාමාජිකයින්ට

(ගුරුවරුන්ට සහ සිසුන්ට) වේගවත් හා ලාභදායී අන්තර්ජාල විසඳුමක් ලබා දුන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජාත්‍යන්තර දත්ත කලාප පරාසය සුරකිමින්, වීඩියෝ සම්මන්ත්‍රණ දත්ත ගමනාගමනය, ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය තුළ තබා ගැනීමට හැකි විය. මෙම විසඳුම නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිටින ගුරුවරුන් සහ සිසුන්ට එකම ස්ථානයක, එකම වේලාවක සිට ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රමය සජීවීව අත්දැකීමට හැකියාව ලැබුණි.

මාර්ගගත ඉගෙනුම් හා ඉගැන්වීම් අඛණ්ඩව සිදු කිරීම සඳහා සාධාරණ මෙන්ම ප්‍රජාවට උපරිම ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ Zoom සේවාවන් ඔස්සේ ක්‍රියාත්මක වන වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරන ලදී.

5.13 වසංගත තත්ත්වය මධ්‍යයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල විකල්ප ඇගයීම් පැවැත්වීම සඳහා වූ මාර්ගෝපදේශ.

උසස් අධ්‍යාපනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ (PTF) උප කමිටුව, උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) සහ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (QAC/UGC) ඇතුළු විවිධ කමිටු සමඟ පැවැත්වූ රැස්වීම්වලදී, විකල්ප ඇගයීම් පැවැත්වීමේ වැදගත්කම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාකච්ඡා කර තිබේ. මෙම සාකච්ඡා මත පදනම්ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතු මාර්ගෝපදේශ මාලාවක් සකස් කර ඇත.

කෝවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ විභාග ශාලාවල පවත්වන සංවෘත ග්‍රන්ථ ලිඛිත විභාගවලට පෙනී සිටීමට සිසුන් නොහැකි වීම හේතුවෙන් මෙම විකල්ප ඇගයීම් ක්‍රම ගෝලීය වශයෙන් අනුගමනය කර ඇත.

සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ප්‍රමාදයකින් හා බාධාවකින් තොරව ඉදිරියට ගෙන යාම පිණිස විශ්වවිද්‍යාල විසින් කොමිෂන් සභා වක්‍රලේඛ අංක 11/2020 හි දක්වා ඇති පරිදි ඉහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

5.14 රට වසා දැමූ කාලපරිච්ඡේදයන් තුළ උපාධි පාඨමාලා අඛණ්ඩව සිදු කිරීමට ගත් පියවර හා පශ්චාත් කොවිඩ් කාල පරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලවල කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ සැලසුම්

අතිගරු ජනාධිපතිතුමා විසින් 2020 මාර්තු 31 වන දින ගැසට් නිවේදනයක් මඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් (PTF) පත් කරන ලදී. ඒ අනුව, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත ජනාධිපති කාර්ය සාධක බලකායක් ජනාධිපතිවරයා විසින් පත් කරන ලද අතර සිසුන්, ගැටළු, ආයතන සහ පවතින සම්පත්වල වෙනස්කම් සහ විවිධත්වය සැලකිල්ලට ගනිමින් විවිධ අධ්‍යාපන අංශවල (සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය) පවතින ගැටළු විසඳීම සඳහා සුදුසු නිර්දේශ යෝජනා කිරීමට මූලික කණ්ඩායම් තුනක් (03) පත් කිරීමට තීරණය කරන ලදී. මෙම පසුබිම තුළ, කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නවීකරණය කිරීම සඳහා මැදිහත්වීම් නිර්දේශ කිරීම සහ කිසිදු පසුබෑමකින් තොරව අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා උසස් අධ්‍යාපන මූලික කණ්ඩායම පිහිටුවන ලදී.

5.15 මාර්ගගත ක්‍රමය ඔස්සේ අධ්‍යාපන වැඩසටහන පැවැත්වීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල මුහුණ දෙන අභියෝග

වසංගත කාලපරිච්ඡේදය මධ්‍යයේ මාර්ගගත ඉගැන්වීම් හා ඉගෙනීම් ක්‍රියාවලියට අදාළව විශ්වවිද්‍යාල අංශය විශේෂයෙන් පීඨ/ අධ්‍යයනාංශ / ශිෂ්‍ය කණ්ඩායම්වලට ඇති අභියෝග අධ්‍යයනය කිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් සමීක්ෂණ පවත්වා ඇත.

5.16 නවක වදයට ගොදුරු වූවන්ට සහන සැලසීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල (HEIs) නවක වදය සම්බන්ධ අනිසි හැසිරීම් වැළැක්වීම සඳහා නියාමන යාන්ත්‍රණයක් සැපයීම සඳහා පත් කරන ලද කමිටුව

එවකට උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු.ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා විසින් විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වන රාජ්‍ය විශ්වවිද්‍යාලවල හා උසස් අධ්‍යාපන ආයතනවල නවක වදය හේතුවෙන් 2014/2015 අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යාපනය අහිමි වූ සිසුන්ට සුදුසු සහනයක් ලබා දීම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

විනිසුරු ජනාධිපති නීතිඥ ආචාර්ය සලීම් මර්සූෆ්	සභාපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ	සාමාජික සහ ලේකම්
මහාචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමි	සාමාජික
ආචාර්ය බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා	සාමාජික
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නාරද වර්ණසූරිය	සාමාජික
ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය	සාමාජික
ජනාධිපති නීතිඥ ප්‍රසන්ත ලාල් ද අල්විස්	සාමාජික

නවක වදයට ලක් වූ සිසුන් මෙසේ නැවත අධ්‍යයන ආයතනයකට ඇතුළත් කර ගැනීමේදී ඔවුන් නැවතත් එවැනිම ඉරණමකට මුහුණ දීමෙන් වළක්වා ගැනීම සහතික කිරීමට නියාමන යාන්ත්‍රණයක් යෝජනා කිරීම ද මෙම කමිටුවට පැවරුණු රාජකාරියකි.

කමිටුවට පැමිණිලි 88 ක් ලැබුණු අතර ඒ අතරින් දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකිරීම, අදාළ අධ්‍යයන වර්ෂයට අනුකූල නොවීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන උසස් අධ්‍යාපන ආයතනයන් වීම ආදී හේතු නිසාවෙන් පැමිණිලි 35 ක් ප්‍රතික්ෂේප විය.

කමිටුවේ වාර්තාව 2020 අගෝස්තු 31 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත භාර දෙන ලදී.

5.17 ශිෂ්‍ය විනය සඳහා වූ ස්ථාවර කමිටුව (SCSD)

ශිෂ්‍ය විනය සඳහා වන ස්ථාවර කමිටුවක් (SCSD) පිහිටුවීමට මූලික පියවර ගන්නා ලදී. මෙම ස්ථාවර කමිටුවේ පරමාර්ථය වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් නවක වදය තුරන් කිරීමයි. ඉහත කමිටුව සඳහා පත් කරන ලද සාමාජිකයින්ට අමතරව, පහත නම් සඳහන් අය වෙනුවෙන් නම් කරන ලද නියෝජිතයන් මෙම ශිෂ්‍ය විනය සඳහා වන ස්ථාවර කමිටුවට ඇතුළත් කරනු ලැබේ.

- ගරු නීතිපති
- ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
- පොලිස්පති

6. මූල්‍ය පරිපාලනය

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත සඳහන් පරිදි 2020 අයවැයෙන් මුදල් ලබා ගත යුතු උපායමාර්ගික අරමුණු පහක් හඳුනාගෙන ඇත.

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශය අවස්ථා වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසියකු සඳහා අවශ්‍ය වන කුසලතා සහ දැනුම සිසුන් තුළ වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මගින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙනුම් කටයුතු වන නියැලීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් වල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක බැවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු සහතික කිරීම.
- ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා වන 2020 අයවැය අනුමත කර ඇත. "රට හඳන සෞභාග්‍යයේ දැක්ම" පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් 2020 අයවැය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

ප්‍රදාන	2019 වර්ෂය			2020 වර්ෂය		
	මුළු අරමුදල් වෙන් කිරීම රු.මි	මුදා හරින ලද මුළු අරමුදල රු.මි	මුදා හැරීමේ / භාවිතා කිරීමේ අනුපාතය, මුළු වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස	මුළු අරමුදල් වෙන් කිරීම රු.මි	මුදා හරින ලද මුළු අරමුදල රු.මි	මුදා හැරීමේ / භාවිතා කිරීමේ අනුපාතය, මුළු වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස
පුනරාවර්තන	46,076	45,544	99%	49,497	49,457	99%
ප්‍රාග්ධන	13,980	10,820	77%	9,545	9,545	100%
එකතුව	**60,056**	**56,364**	**94%**	**59,041**	**59,002**	**99%**

වගුව **6.1** විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම- 2019/2020

ඇ. **පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අරමුදල් ප්‍රතිපත්තිය මත පදනම්ව 2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන, පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG) හා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG) ලෙස වෙන් කරන ලදී.

ආ. **පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG)**

විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව 2020 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ප්‍රදාන, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන් කර ඇත.

ඇ. **මූල්‍යයන ප්‍රතිපත්තිය - ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම (CG)**

6.3.1. ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG)

අරමුදල් පරිහරණය කිරීමේ ප්‍රගතිය සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වෙන් කරන ලදී.

ඒ අනුව, විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන පහත සඳහන් කාණ්ඩ යටතේ අනුමත ප්‍රතිපාදන තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කරන ලදී;

රු. මි.

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	2020 වෙන් කිරීම	2020 වර්ෂයේ දී නිකුත් කරන ලද අරමුදල්
ඉදි කිරීම් ව්‍යාපෘති	3,241	6,965
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	1,496	
ස්ථාවර වත්කම් අත් කර ගැනීම	1,521	
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති	517	
පර්යේෂණ හා සංවර්ධන	190	
අයවැය යෝජනා	2,580	2,580
එකතුව	**9,545**	**9,545**

වගුව 6.3.1 **විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම**

6.3.2. අයවැය යෝජනා – 2020

රු.මි.

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	2020 වර්ෂයට අදාළ වෙන් කිරීම	2020 වර්ෂයේ දී නිකුත් කරන ලද අරමුදල්
විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම	2,005	2,005
විශ්වවිද්‍යාලවල පීඨ කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැලසීම	15	15
නව පාඨමාලා හඳුන්වාදීම සඳහා යටිතල පහසුකම්: වෛද්‍ය පීඨය (පළමු අදියර), ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	420	420
කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලද කටයුතු	100	100
වව්නියා මණ්ඩපයේ පුස්තකාල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම.	40	40
එකතුව	**2,580**	**2,580**

වගුව **6.3.2** **අයවැය යෝජනා – 2020**



6.3.3. යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති – 2020

රු.මි.

විශ්වවිද්‍යාලය	ව්‍යාපෘතිය	ප්‍රදානය කළ අගය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ප්‍රධාන පුස්තකාලයේ දීර්ඝ කිරීමට යෝජිත කොටස	252.6
	පරිගණක මධ්‍යස්ථානය, ඉංජිනේරු ගණිතය සහ ඉංජිනේරු කළමනාකරණය අධ්‍යයනාංශ සඳහා වන ගොඩනැඟිල්ල	294.2
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	කාර්ය මණ්ඩල නිල නිවාස -අබයරත්න මාවත, බොරලැස්ගමුව	122.3
	තාක්ෂණ පීඨය සඳහා වන ගොඩනැගිලි - වැඩ අංශ පරිපාලන සහ අධ්‍යයන ගොඩනැගිල්ල	3,073.0
එකතුව		**3,742.1**

වගුව 6.3.3.1 වර්ෂය තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති

රු.මි.

විශ්වවිද්‍යාලය	ව්‍යාපෘතිය	ප්‍රදානය කළ අගය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ සහ සේවා සඳහා වන බහුකාර්ය ගොඩනැගිල්ල	1,183.9
	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය සඳහා වන බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය	1,598.4
යාපනය විශ්වවිද්‍යාලය	ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා වන ගොඩනැගිලි ඉදිකිරීම - අදියර II	645.0
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය සඳහා වන අතුරු වෛද්‍ය සායනික ගොඩනැගිල්ල - අදියර I	1,013.9
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	යෝජිත තාක්ෂණ පීඨය - II කොටස	1,685.0
එකතුව		**6,126.2**

වගුව 6.3.3.2 වර්ෂය තුළ ආරම්භ කළ යටිතල පහසුකම් ව්‍යාපෘති

රු.මි.

	2015	2016	2017	2018	2019	2020
1. රජයේ ප්‍රතිපාදන						
පුනරාවර්තන	25,898	29,029	30,597	36,786	46,076	49,497
ප්‍රාග්ධන	8,860	19,797	11,540	19,454	13,980	9,545
2. වියදම						
පුනරාවර්තන	25,761	27,999	29,874	35,935	45,544	49,457

ප්‍රාග්ධන	8,735	15,162	10,478	14,098	10,820	9,545
3. ශිෂ්‍ය මූල්‍ය ආධාර						
මහපොල	576	912	859	1,305	1,257	1,420
ශිෂ්‍යාධාර	466	832	539	521	707	705

වගුව **6.3.3.3** අයවැය යෝජනාවෙන් වෙන් කර ඇති අරමුදල් වාර්ෂික ප්‍රතිපාදනවලට ඇතුළත් කර ඇත.

ශීර්ෂ අංක 214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව				
විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම - 2020				
				රු.මි.
අංකය	විශ්වවිද්‍යාලය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	168	49	217
2	කොළඹ විශ්වවිද්‍යාලය	122	21	143
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	194	58	252
4	කැලණිය විශ්වවිද්‍යාලය	167	62	229
5	මොරටුව විශ්වවිද්‍යාලය	84	21	106
6	රුහුණ විශ්වවිද්‍යාලය	82	48	130
7	යාපනය විශ්වවිද්‍යාලය	90	86	176
8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	31	65	96
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	56	63	119
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	83	78	161
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	46	36	82
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	43	34	78
13	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	19	10	29
14	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	11	28	39
15	දේශීය වෛද්‍ය විද්‍යායතනය	9	13	23
16	ත්‍රිකුණාමලය මණ්ඩපය	10	25	34
17	ශ්‍රීපාලි මණ්ඩපය	4	8	13
18	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය	1	6	7
19	වවිනියා මණ්ඩපය	9	17	26
20	තාක්ෂණ විද්‍යා ආයතනය- මොරටුව	6	20	26
21	කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය	6	4	10
22	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය විශ්වවිද්‍යාලය	5	7	11
	එකතුව	**1248**	**760**	**2008**

වගුව **6.3.3.4** විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම - **2020**

7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විවිධ සේවක කාණ්ඩ 5ක් යටතේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 325ක් වූ අතර 2020 දෙසැම්බර් 31 වන විට සේවයේ නියුක්ත සංඛ්‍යාව 255 ක් විය පුරවා නොමැති පුරප්පාඩු ගණන 70 කි. තොරතුරු 7.1 වගුවේ දක්වා ඇත.

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව
අධ්‍යයන කාර්ය මණ්ඩලය	07	04
විධායක කාර්ය මණ්ඩලය	57	42
අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	09	05
කළමනාකරණ සහකාර ශ්‍රේණි	187	149
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	65	55
එකතුව	**325**	**255**

වගුව 7.1 **2020** දෙසැම්බර් **31** දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක සංඛ්‍යාව *(වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඇමුණුම I බලන්න)*

7.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත්වීම් ,උසස්වීම් ,සේවය ස්ථිර කිරීම්

2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයට නව පත්වීම් තුනක් (කොන්ත්‍රාත් / තාවකාලික පැවරුම් පදනම මත පත්වීම් දෙකක් සහ එක් වැඩ බලන පත්වීමක්) ලබා දී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවකයින් 19 දෙනෙකු සේවයේ ස්ථිර කර ඇත.

කොන්ත්‍රාත්තුව අවසන් වීම හේතුවෙන් එක් සේවකයෙකුගේ සේවය අවසන් වූ අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ එක් සේවකයෙකුව සේවයෙන් පහ කර ඇත.

7.2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ අභ්‍යන්තර මාරුවීම්, සේවා සම්මාන සහ විශේෂ අරමුණු නිවාඩු

2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ එක් අභ්‍යන්තර මාරුවීමක් පමණක් වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් පස් දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

7.3. සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය හැරයාම්

2020 වර්ෂයේ දී, පද්ධතිය තුළ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරුවීම් ලබා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයෙන් ඉවත් වූ පුද්ගලයින් ගණන දෙදෙනෙකි.
සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලා අස්වීම් දෙකක් (02), විශ්‍රාම ගැන්වීම් තුනක් (03) සහ විශ්‍රාම යාමට සූදානම් වීමේ නිවාඩු දෙකක් ලබා දීම සිදු කරන ලදී.

7.4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ලබා දෙන පුහුණු හා සංවර්ධන අවස්ථා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන වෙනම කාර්ය මණ්ඩල පුහුණු අරමුදලක් යටතේ සෑම වසරකදීම එහි කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ රාජකාරිවලට අදාළ වන වැඩමුළු / පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමට අවස්ථාව සලසා දෙන අතර එමඟින් ඔවුන්ගේ කුසලතා හා වැඩ කිරීමේ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව සැලසේ. මෙම වැඩමුළු / පුහුණු වැඩසටහන් සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), මිලෝඩා මූල්‍ය අධ්‍යයන ඇකඩමිය, ප්‍රොෆෙෂනල් ඩාර්ටිස් කෝපරේෂන් (PDC), ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය, ශ්‍රී ලංකා ප්‍රාග් පුහුණු ආයතනය (PRAG), මැක්වයිර් රෙන්ස් ඇන්ඩ් ජෝන්ස් ආයතනය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS), ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM), RH පුහුණු සහ සංවර්ධන ආයතනය (RH Training & Development) සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය වැනි පිළිගත් ආයතන විසින් පවත්වනු ලැබීය.

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ විධායක, ලිපිකරු සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් පහත සඳහන් පරිදි පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී විය;

සේවක මට්ටම	සේවකයින් සංඛ්‍යාව
විධායක	01
ලිපිකරු	12
ප්‍රාථමික	08
එකතුව	15

වගුව 7.2 පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව

7.5. සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

7.6. සේවය අගය කිරීම හා සේවයට පිළිගැනීම

2020 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත්වූ සේවකයන් ඉටු කරන ලද සේවය අගය කිරීමත් සලකනු ලබන කාලයේ දී සේවයට එකතු වූ සේවකයන් පිළිගැනීමත් කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලදී.

8. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය ලබා දීමේ වගකීමට අනුකූලව මානව සම්පත් අංශය 2020 දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මානව සම්පත් අංශයට පවරා ඇති කාර්යයන් යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

8.1 සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 956 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.මෙම තනතුරු 956 හි විස්තර 8.1.1 වගුවේ දක්වා ඇත.

සේවක කාණ්ඩය	සේවක තනතුරු සංඛ්‍යාව
අධ්‍යයන කාර්ය මණ්ඩලය	678
පීඨාධිපති තනතුරු	02
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය	103
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	08
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	05
කළමනාකරණ සහකාර / තාක්ෂණික නොවන	43
කළමනාකරණ සහකාර / තාක්ෂණික	60
ප්‍රාථමික (පුහුණු / අර්ධ පුහුණු / නුපුහුණු)	57
එකතුව	**956**

වගුව **8.1.1** **2020 දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව**

උසස් අධ්‍යාපන ආයතනය	තනතුරු සංඛ්‍යාව
කොළඹ විශ්වවිද්‍යාලය	60
ශ්‍රී පාලි මණ්ඩපය	03
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	26
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	74
කැලණිය විශ්වවිද්‍යාලය	43
මොරටුව විශ්වවිද්‍යාලය	125
යාපනය විශ්වවිද්‍යාලය	114
වව්නියා මණ්ඩපය	24

රුහුණ විශ්වවිද්‍යාලය	76
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	34
ත්‍රිකුණාමලය මණ්ඩපය	17
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	42
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	99
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	34
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	68
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	43
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	03
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	72
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	06
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය	08
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය	06
තාක්ෂණ විද්‍යා ආයතනය - මොරටුව	46
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය විශ්වවිද්‍යාලය	05
එකතුව	**1228**

වගුව **8.1.2** විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල අනුමත සේවක සංඛ්‍යා තොරතුරු

අළුතින් පිහිටුවන ලද ගම්පහ වික්‍රමරාච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM) සඳහා අනුමත කරන ලද නව සේවක සංඛ්‍යා පහත දැක්වේ.

සේවක කාණ්ඩය	තනතුරු සංඛ්‍යාව
අධ්‍යයන කාර්ය මණ්ඩලය	65
පීඨාධිපති තනතුරු	04
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය	29
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	20
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	05
කළමනාකරණ සහකාර / තාක්ෂණික නොවන	70
කළමනාකරණ සහකාර / තාක්ෂණික	20
ප්‍රාථමික (පුහුණු / අර්ධ පුහුණු / නුපුහුණු)	59
එකතුව	**272**

වගුව **8.1.3** අළුතින් පිහිටුවන ලද ගම්පහ වික්‍රමරාච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය **(GWUIM)** සඳහා අනුමත කරන ලද නව සේවක සංඛ්‍යා

8.2 පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම

2009 අංක 57 විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (ii) සහ (iii) ඡේද සහ විශ්වවිද්‍යාල පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් පිළිබඳ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී ඇත.ඒ අනුව, 2020 වර්ෂය තුළ සිදු කරන ලද පත්වීම් සහ උසස්වීම් පිළිවෙලින් 8.2 වගුවේ සාරාංශ කොට ඇත.

පත් කරන ලද සේවක කාණ්ඩය	පත්වීම් ගණන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර	04
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර (නීති හා ප්‍රලේඛන)	01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර (පුස්තකාල සේවා)	02
සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර	01 (අභ්‍යන්තර කාණ්ඩය)
සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර	08 (බාහිර කාණ්ඩය)
සහකාර ලේකම්/සහකාර ලේඛකාධිකාරී තනතුර (නීති හා ප්‍රලේඛන)	01

වගුව **8.2** **2020 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා පත් කිරීම්**

8.3 වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් / උසස්වීම්

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (iii) ඡේදයට අනුව, 2020 වර්ෂය තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් විසි එකක් (21) සහ උසස්වීම් දාහතක් (17) ලබා දී ඇත. මේ පිළිබඳ විස්තර 8.3.1 සහ 8.3.2 වගුවල දක්වා ඇත.

පත් කළ තනතුර	පත්වීම් ගණන
වැඩ ඉංජිනේරු (සිවිල්) III ශ්‍රේණිය	05
පාලක (උද්‍යාන) III ශ්‍රේණිය	01
වැඩ ඉංජිනේරු (සිවිල්) III ශ්‍රේණිය	07
ප්‍රධාන ආරක්ෂක නිලධාරී II ශ්‍රේණිය	02
සංඛ්‍යාලේඛන නිලධාරී II ශ්‍රේණිය	01
විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී	01
පුහුණු ඉංජිනේරු III ශ්‍රේණිය	01
සහකාර අධ්‍යක්ෂ / ප්‍රාදේශීය අධ්‍යාපන සේවා	03
එකතුව	**21**

වගුව **8.3.1** **අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් – 2020**

උසස් කරන ලද තනතුර	උසස්වීම් ගණන
ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කාර්මික නිලධාරී	09
පාලක (උද්‍යාන) II ශ්‍රේණිය	03
ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරී 1 ශ්‍රේණිය	01
ප්‍රධාන තාක්ෂණික නිලධාරී	04
එකතුව	**17**

වගුව **8.3.2** අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් **-2020**

8.4 විශ්වවිද්‍යාල අතර ස්ථාන මාරු 2020

විශ්වවිද්‍යාල පනතේ 78 වන වගන්තියට අනුව, 2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 139 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහසුකම් ලබා දී ඇත;

- ❖ පරිපාලන කාර්ය මණ්ඩලය - 19
- ❖ අනධ්‍යයන/ පරිපාලනමය නොවන කාර්ය මණ්ඩලය - 120

8.5 සහනදායී කොන්දේසි මත මෝටර් රථ වාහන බලපත්‍ර සඳහා අයදුම්පත්

2020 ජනවාරි 1 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 540 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබේ.

සංශෝධිත 2016.07.14 දිනැති අංක 01/2016 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුව මෙම අයදුම්පත් ලැබුණු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම අයදුම්පත් වසර පුරාම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ.

9. යටිතල පහසුකම් සංවර්ධනය

2020 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 9545 ක මුදලක් වෙන් කරන ලදී. 2020 වසර අවසන් වන විට රු.මිලියන 9545ක් වන මුළු මුදල, භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 34 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2020 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති යෝජනා* 16 ක් පමණි. රේඛීය අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 16 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි. 2020 වර්ෂයේ දී භෞතිකව වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන 9 ක් වන අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු.මිලියන 30,865 ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 91 ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9521 ක් වන ව්‍යාපෘති 21 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත. විස්තර පහත දැක්වේ.

	2017		2018		2019		2020	
	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)
වි.ප්‍ර.කොා. වෙත ලැබුණු ව්‍යාපෘති යෝජනා ගණන	61	42,601.52	48	28,979.42	39	18,906.75	34	8,857.79
වි.ප්‍ර.කොා. මඟින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*36	22,680.38	*26	24,719.24	19	6,331.26	16	7,630.97
ජාතික ක්‍රමසම්පාදන දෙ. වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*34	21,997.38	*26	24,719.24	14	6,382.96	16	7,630.97
ජාතික ක්‍රමසම්පාදන දෙ. විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*26	17,799.62	*14	14,213.46	11	2,845.80	1	182.45
අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*40	15,438.45	*19	22,846.03	21	14,544.20	-	-
වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන	#*50	32,353.50	#*11	7,117.00	16 සටහන - 1	3,581.70	9 සටහන - 1	6,794.90
දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති ගණන	#*122	49,972.00	#*90	47,783.00	179 සටහන - 2	28,323	91 සටහන - 2	30,865.0
අවසන් කර ඇති ව්‍යාපෘති ගණන	#*59	12,454.00	#*98	30,248.00	17 සටහන - 3	5,723	21 සටහන - 3	6,521.0

** පෙර වර්ෂවල ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළත්ව*
 # ව්‍යාපෘතියේ භෞතික තත්ත්වය පමණක් සලකනු ලැබිණි

සටහන – 01. 2020 සැප්තැම්බර් මස විශ්වවිද්‍යාලවලින් යාවත්කාලීන කරන ලද තොරතුරු අනුව 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති.

සටහන – 02. රදවා තබා ගැනීම වැනි ශේෂ ගෙවීම් කළ යුතු ව්‍යාපෘති ලෙස ගනු ලබන 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ගණන.

සටහන – 03. විශ්වවිද්‍යාලවලින් යාවත්කාලීන කළ පරිදි 2020 සැප්තැම්බර් දක්වා වන වාර්තා අනුව සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති.

වගුව 9.1 නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති

10. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු(QAC)

ශක්තිමත් තත්ත්ව ආරක්ෂණ (QA) පද්ධතියක සහයෝගයෙන්, උසස් අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (QAC) ආරම්භ කරන ලදී.

2020 වර්ෂය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයෙහි කාර්යභාරය සහ කටයුතු පහත දැක්වේ;

කොවිඩ් 19 වසංගත තත්ත්වය ඇති වීමත් සමඟ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට 2020 වර්ෂය වඩාත් අභියෝගාත්මක එකක් බවට පත්විය. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයාව 2020 සැප්තැම්බර් මාසයේදී වෙනස් කරන ලදී. එහෙයින්, තත්ත්ව ආරක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ස්ථාවර කමිටුවේ (SC) සභාපතිවරයා සහ සාමාජිකයින් විසින් තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය මග පෙන්වීම සහ සහාය ලබා දෙන ලදී. ඒ අනුව පහත සඳහන් කටයුතු සිදු කර ඇත;

- 2020 තුන්වන කාර්තුව (Q3) වන විට CQA 14/15 ක් ලබා, කාර්ය සාධන ලකුණු කාඩ්පතේ 75% කට වඩා වැඩි අගයක් ලබා ඇති අතර ඒ අනුව, එය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ඉලක්කය ඉක්මවා ඇත.
- 2020 අවසන් වන විට CQA වලින් 93% ක් හා කාර්ය සාධන ලකුණු කාඩ්පතෙන් 75% කට වඩා ලබාගෙන ඇත. එනම්, 2021 වර්ෂය සඳහා AHEAD විසින් නියම කරන ලද ඉලක්කය සපුරා ඇත. (75% දී CQA ලකුණු වලින් 80% ක්)
- 2020 පළමු කාර්තුව අවසන් වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාල 12 ක් (2019 දී 8 ක් සහ 2020 දී 4 ක්) වෙත ගොස් අධීක්ෂණය කර ඇත.

2019 වර්ෂයට අදාළ ආයතනික සමාලෝචන කිරීමට ඉතිරිව තිබූ විශ්වවිද්‍යාල තුන වෙත ගොස් එම කටයුතු 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී අවසන් කර ඇත. 2020 ආයතනික සමාලෝචන සඳහා විශ්වවිද්‍යාල දෙකකින් ස්වයං ඇගයීම් වාර්තා (SER) ලැබී ඇත. කොවිඩ් -19 හේතුවෙන් අනෙකුත් විශ්වවිද්‍යාල අධීක්ෂණය කිරීමට යාම 2021 වර්ෂය දක්වා කල් තබන ලදී.

- 2020 දෙසැම්බර් වන විට වැඩසටහන් සමාලෝචන 32 ක් සඳහා වන සමාලෝචන වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් ලැබී ඇත. 2019 දී ආරම්භ කරන ලද සියලුම අධ්‍යයන වැඩසටහන් 41 (වෛද්‍ය, පශු වෛද්‍ය විද්‍යාව, දන්ත වෛද්‍ය විද්‍යාව, සම සෞඛ්‍ය විද්‍යාව, ආහාර විද්‍යාව, සත්ත්ව විද්‍යාව හා කෘෂිකර්මය) සඳහා වන වැඩසටහන් සමාලෝචන 2020 වසරේ දී අවසන් කරන ලද අතර සමාලෝචන වාර්තා ද සකස් කර අවසන් කරන ලදී. 2020 වසරේ දී විද්‍යා, ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ භූ නිර්මාණවේදය පිළිබඳ වැඩසටහන් සමාලෝචන 59 ක් සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලැබී ඇත.
- ***පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය සඳහා අත්පොතක්*** සංවර්ධනය කිරීම AHEAD ව්‍යාපෘතියේ සහාය ඇතිව ආරම්භ කරන ලද අතර එය 2021 වැඩසටහන් සමාලෝචන සඳහා යොදා ගැනීමට නියමිතය.

- 2020 දී ආයතනික හා වැඩසටහන් සමාලෝචකයින් හා ස්වයං ඇගයීම් වාර්තා ලේඛකයින් සඳහා තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් වෙනම වැඩමුළු දෙකක් පවත්වන ලදී. වැඩසටහන් සමාලෝචන සඳහා වන නව සමාලෝචකයින් වෙනුවෙන් Zoom තාක්ෂණය ඔස්සේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනට විද්වතුන් 112 ක් සහභාගී වූ අතර ඉන් 83 දෙනෙකු වැඩසටහන් සමාලෝචකයින් වීමට සුදුසුකම් ලැබුහ.

2020 වර්ෂය තුළ විෂය ඉම් ලකුණු ප්‍රකාශන සංවර්ධනය කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන් සඳහා වන විෂය ඉම් ලකුණු පිළිබඳ වැඩමුළුවක් 2020 මාර්තු 11 වන දින පැවැත්වූ අතර ඉතිහාසය, සිංහල, භූගෝල විද්‍යාව, ජන සන්නිවේදනය, ඉංග්‍රීසි සහ දර්ශනය යන විෂය කමිටු සඳහා නාමයෝජනා ලබා ගන්නා ලදී. මෙම නාමයෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටු විසින් අනුමත කළ යුතුය. ඉංග්‍රීසි හා සමාජ විද්‍යාව සඳහා වන ඉම් ලකුණු කමිටු සඳහා අනුමැතිය හිමි වී ඇත.

2020 දී, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් යෝජනා 233 ක් (සංශෝධිත හා නැවත සංශෝධිත යෝජනා ඇතුළුව) ඇගයීමට ලක් කරන ලද අතර එය ප්‍රථම උපාධි යෝජනා 94 කින් සහ පශ්චාත් උපාධි යෝජනා 98 කින් සමන්විත විය. නව පීඨයක් පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා 04 ක් සහ නව අධ්‍යයනාංශ පිහිටුවීම සඳහා ඉදිරිපත් කළ යෝජනා 29 ක් ඇගයීමට ලක් කරන ලදී.

එබැවින්, තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව නව බාහිර උපාධි වැඩසටහන් අනුමත කිරීම සඳහා වන අයදුම්පත සංශෝධනය කරන ලදී. සංශෝධිත අයදුම්පත, නව පූර්ණ කාලීන උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි සුදුසුකම් අනුමත කිරීම සඳහා භාවිතා කරන ක්‍රමයට සමාන වන අතර යෝජිත සුදුසුකම් SLQF 2015 අවශ්‍යතාවයන්ට අනුකූලද යන්න තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවට ද සහතික වනු ඇත.

2020 කාලය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ක්‍රියාත්මක කර ඇති අනෙකුත් කටයුතුවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමන උපාධි වැඩසටහන් වල ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ මට්ටම් පිළිබඳව සහ මහජනතාව සිදුකරන විමසීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සැපයීම;
- විශ්වවිද්‍යාලවල තත්ත්ව ආරක්ෂණ කටයුතුවල දී සිසුන්ගේ සහභාගිත්වය; සහ
- පොදු අධ්‍යයන දින දර්ශනයක් පවත්වා ගැනීමට සහාය වීම සම්බන්ධ ක්‍රියාකාරකම්

11. තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා /පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2020 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.

1. මෘදුකාංග සංවර්ධන කටයුතු

i. පිරිස් අංශය සඳහා රක්ෂණ කළමනාකරණ පද්ධතිය

මෙම මෘදුකාංගය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක තොරතුරු ඇතුළත් කිරීමට පහසුකම් සපයන අතර, එමඟින් ඔවුන්ගේ හිමිකම් රක්ෂණය සහ රක්ෂණයට අදාළ වෙනත් තොරතුරු බැලීමට ඔවුන්ට හැකි වේ.

ii. පිරිස් අංශය සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතිය

මෙම යෙදවුම මඟින් සේවකයින්ට ඔවුන්ගේ නිවාඩු ලබා ගැනීම සඳහා අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් සපයයි.

iii. වාහන වෙන්කිරීමේ පද්ධතිය

මෙය මාර්ගගත ඉල්ලුම් පත්‍රයක් වන අතර එමඟින් වාහන ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතු ඉල්ලුම් පත්‍රය මාර්ගගතව යැවීමට පහසුකම් සපයයි.

iv. උසස්වීම් සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවීමේ පද්ධතිය

කළමනාකරණ සහකාර තනතුරට උසස් කිරීම සහ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ව කළමනාකරණ සහකාර III ශ්‍රේණියට පත් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි.

v. මාර්ගගත ප්‍රේරණ පුහුණු වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය

විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය නිලධාරීන් සඳහා වන ප්‍රේරක පුහුණු වැඩසටහන් ක්‍රියාවලිය සඳහා මෙම ක්‍රමය පහසුකම් සපයන අතර මෙම පද්ධතිය සියලු පරිපාලන හා මූල්‍ය නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යනු ඇත.

12. නීති කටයුතු

12.1. නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් නියෝග 15ක් සහ නියමාවලීන් 3 ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

12.1.1. 2020 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 2160/40 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය යටතේ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය අලුතින් එකතු කිරීමේ නියමය.

ii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.02.09 දිනැති අංක 22/2163 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ අලුතින් වෛද්‍ය පීඨයක් සහ ඒ යටතේ අධ්‍යනාංශ 13 ක් පිහිටුවන ලද නියමය.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 43/2160 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපයේ නව තාක්ෂණික අධ්‍යයන පීඨයක් සහ ඒ යටතේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශයක් පිහිටුවන ලද නියමය.

iv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 41/2160 දරන රජයේ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයට යටතේ තොරතුරු පද්ධති අධ්‍යයන අංශය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ රසායන විද්‍යා අධ්‍යයන අංශය අලුතින් පිහිටුවන ලද නියමය .

v. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 45/2160 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ ව්‍යවහාරික භූ විද්‍යා අධ්‍යයන අංශය අලුතින් පිහිටවන ලද නියමය.

vi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 2160/39 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා සහ සංස්කෘතික කටයුතු පීඨය යටතේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

vii. 1978 අංක 16දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 44/2160 දරන රජයේ අතිවිශේෂ ගැසට්

පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය ඉවත් කොට අලුතින් ද්‍රව්‍ය සහ යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයන අංශය සහ සිවිල් සහ පාරිසරික තාක්ෂණ අධ්‍යයන අංශය පිහිටුවන ලද අතර තාක්ෂණය සඳහා විද්‍යාව අධ්‍යයන අංශයද අලුතින් ආදේශ කිරීම.

viii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.01.30 දිනැති අංක 2160/42 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයට අලුතින් ආගන්තුක සත්කාරක හා විවේක කළමනාකරණ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

ix. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.02.19 දිනැති අංක 21632/1 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ කලා පීඨය යටතේ භාෂා පරිවර්තන අධ්‍යයනාංශය හා විද්‍යා පීඨය යටතේ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය පිහිටුවීමේ නියමය.

x. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.02.27 දිනැති අංක 2164/53 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය යටතේ පිහිටුවා තිබූ භාෂා සංස්කෘතික අධ්‍යයන අංශය වෙන්කොට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය යටතේම භාෂා සංස්කෘතික අධ්‍යයන සහ ප්‍රසාංගික කලා අධ්‍යයන අංශය සහ සංගීත හා නිර්මාණාත්මක තාක්ෂණවේදී අධ්‍යයන අංශය අලුතෙන් පිහිටුවීමේ නියමය.

xi. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.07.03 දිනැති 218/240 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයේ ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය යටතේ පාරිසරික හා කාර්මික විද්‍යා අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

xii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.07.30 දිනැති අංක 28/2186 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය යටතේ වෛද්‍ය තාක්ෂණ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

xiii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2020.07.30 දිනැති අංක 27/2186 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය යටතේ ප්‍රතිශක්ති විද්‍යා හා අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

xiv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2019.09.11 දිනැති අංක 2192/63 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

xv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2019.09.11 දිනැති අංක 2192/64 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය යටතේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

12.1.2. 2020 දී ප්‍රකාශයට පත් කරන ලද නියමාවලීන්

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2020.01.07 දිනැති අංක 2157/9 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය.

ii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2020.02.13 දිනැති අංක 2162/32 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2020.11.11 දිනැති අංක 2201/9 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය.

12.2. අධිකරණ නඩු

2020 වර්ෂය තුළ විවිධ පාර්ශවයන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ හා විනිශ්චය සභාවල ගොනු කර තිබූ පහත සඳහන් නඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අංශය විසින් මෙහෙයවන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය	-	නඩු 31
අභියාචනාධිකරණය	-	නඩු 27
විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය	-	නඩු 23
දිස්ත්‍රික් අධිකරණය	-	නඩු 06
කම්කරු විනිශ්චය සභාව	-	නඩු 02

12.3. වෙනත් ක්‍රියාකාරකම් වලට ලබා දෙන ලද දායකත්වය

12.3.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිදු කළ ක්‍රියාකාරකම්

i. පුරවර විශ්වවිද්‍යාල පිහිටුවීමේ ශක්‍යතාව සොයා බැලීමට අදාල මූලික කටයුතු සඳහා සහයෝගය ලබාදීම.

ii. අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සේවකයන් විසින් අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී අත්සන් කළ යුතු ගිවිසුම් පිළිබඳව නිකුත් කර ඇති කොමිෂන් සභා වක්‍රලේඛ අංක 920 සංශෝධනය කිරීම පිළිබඳ කමිටුවේ සභාපතිත්වය දැරීම.

iii. පවත්නා පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩල (BoM) ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සංශෝධන කෙටුම්පත් කිරීම.

12.3.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත සිදු කළ ක්‍රියාකාරකම්

i. හෙද සහ ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීමේ නෛතික ලේඛන සෑදීමේ කටයුතු සඳහා සහාය ලබාදීම.

13. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 2020.01.01 සිට 2020.12.31 දක්වා කාලය තුළ වාර 22ක් රැස්වී ඇත. 2020 වර්ෂයේ දී අභියාචනා මණ්ඩලය තුළ අභියාචනා 24ක් ලියාපදිංචි කොට ඇත. අභියාචනා 2ක් සම්බන්ධයෙන් මූලික නියෝග ලබා දී ඇති අතර ඉන් 2ක් නිෂ්ප්‍රභා කරන ලදි. අභියාචනා 16 ක් සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලද අතර ඉන් 11ක් නිෂ්ප්‍රභා කර 3ක් පිළිගෙන ඇත. ඉන් අභියාචනා 1ක් නිෂ්ප්‍රභා කර හෝ පිළිගෙන නොමැති අතර 1ක් අභියාචනයක් ප්‍රතික්ෂේප කරන ලදි. කිසිඳු අතුරු නියෝගයක් ද නිකුත් කර නොමැත. නියෝග 13ක් 2020 වර්ෂය අවසාන වන විට ලේඛණ ගත කර ඇති අතර බෙරුම් කිරීම් හේතුවෙන් අභියාචනා 2ක නඩු කටයුතු අවසන් විය. නියෝග ලබාදුන් අභියාචනා දෙකක් (2) තවමත් විභාගවෙමින් පවතින අතර ඊට අභියාචනා 2ක් ඉදිරිපත් කර ඇත. 2020 අවසන් වන විට අභියාචනා 34ක් විභාග වෙමින් පැවතුණි.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් දෙන ලද නියෝගයන්ට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අභියාචන 2ක් ඉදිරිපත් කර ඇති අතර එක් නඩුවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාවක් ඉදිරිපත් කරන ලදී.

14. මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු

මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ 3 වන ඡේදයේ, 1 වන පරිච්ඡේදය මගින් පවරා ඇති බලය යටතේ ස්ථාපිත කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙන්ම අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් සහ පරීක්ෂණ පැවැත්වීමයි.

14.1 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සංසරණය විය යුතු ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් විගණන කමිටුව කළමනාකරණ කමිටුවට හෝ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. 2020 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පහක් (5) පවත්වන

ලදී. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ද සාකච්ඡාවට බඳුන් කෙරේ.

14.2 පවත්වන ලද පූර්ව විගණනයන්

සේවකයින්ට නිකුත් කරනු ලබන ගෙවීම්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් හි පූර්ව විගණනයක් සිදු කරන ලදී.

- අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
- පාරිතෝෂික ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම

15 ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්

15.1 ප්‍රකාශන සහ වාර්තා

2020 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ පහත සඳහන් වැදගත් ප්‍රකාශන සහ වාර්තා තුන මඟින් විශ්වවිද්‍යාල පද්ධතියට අවශ්‍ය පරිපාලනමය සහාය ලබා දෙන ලදී;

1) ‘ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2019’ ප්‍රකාශන මාලාවේ 18 වන වෙළුම 2020 ජූලි මාසයේ දී ප්‍රකාශයට පත් කිරීම.

2) 2019 මූල්‍ය වර්ෂය සඳහා වන විශ්වවිද්‍යාලවල පුනරාවර්තන පිරිවැය විශ්ලේෂණය කර, ‘විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන්වල උපාධි අපේක්ෂකයෙකු සඳහා වන ඒකක පුනරාවර්තන පිරිවැය විශ්ලේෂණය -2019’ නමින් කොමිසමට වාර්තාව ඉදිරිපත් කිරීම.

3) විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

4) විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල නේවාසිකාගාර, ශිෂ්‍යත්ව, ලියාපදිංචි ගාස්තු සහ ආපනශාලා පහසුකම් පිළිබඳ තොරතුරු සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

15.2 විශේෂ පැවරුම්

2020 වර්ෂය තුළ පහත සඳහන් විශේෂ පැවරුම් සිදු කරන ලදී.

1) 2019 සඳහා ජාතික පර්යේෂණ හා සංවර්ධන (පර්යේෂණ හා සංවර්ධන) සමීක්ෂණයේ වාර්තාව සඳහා විශ්වවිද්‍යාලවලින් ලබාගත් දත්ත සම්පූර්ණ කිරීම.

2) උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් (2019 දෙසැම්බර් 31 දින වන විට) කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල අයකර

ගැනීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව තොරතුරු රැස් කොට විශ්ලේෂණය කිරීම.

3) කොවිඩ් -19 වසංගතය අතරතුරදී සිදුකළ මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනීම් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන විසින් කරන ලද සමීක්ෂණවල ප්‍රතිඵල වාර්තාවක් ලෙස සාරාංශ ගත කිරීම.

4) 2012/13 කාණ්ඩයේ අවසාන එම්.බී.බී.එස් (ප්‍රධාන) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ පොදු කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

5) 2011/12 කාණ්ඩයේ අවසාන එම්.බී.බී.එස් (පුනර් පරීක්ෂණ) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ පොදු කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

6) 2009/10 සහ 2010/11 කාණ්ඩවල ආයුර්වේද උපාධිධාරීන්ගේ විභාගයට අදාළ කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම හා පහත දැක්වෙන පරිදි සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය ආයුර්වේද දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

- 2009/10 කාණ්ඩයට අදාළ ආයුර්වේද උපාධිධාරීන් සඳහා වන ප්‍රධාන කුසලතා ලැයිස්තුව; ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, සැප්තැම්බර් / 2016 විභාගය සහ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, ජනවාරි / 2016 විභාගය.
- පුනර් පරීක්ෂණ ලැයිස්තුව 01; ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ ජනවාරි / 2017 සහ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ජූලි / 2016 පැවැත්වූ විභාග සඳහා.
- පුනර් පරීක්ෂණ ලැයිස්තුව 02; ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මැයි / 2017 විභාගය සඳහා පළමු විශේෂ අතිරේක ලැයිස්තුව සහ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ජූලි / 2016 පැවැත්වූ විභාග සඳහා.
- පුනර් පරීක්ෂණ ලැයිස්තුව 03; දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඔක්තෝබර් / 2017 විභාගය සඳහා වන දෙවන විශේෂ අතිරේක ලැයිස්තුව.
- පුනර් පරීක්ෂණ ලැයිස්තුව 04; දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ජූලි / 2018 විභාග සඳහා වන තෙවන විශේෂ අතිරේක ලැයිස්තුව.
- GPA අගය භාවිතයෙන් සකස් කරන ලද 2010/11 කාණ්ඩයට අදාළ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සඳහා වන ප්‍රධාන කුසලතා ලැයිස්තුව.
- 2010/11 කාණ්ඩයට අදාළ සිද්ධ වෛද්‍ය උපාධිධාරීන්ගේ විභාගය සඳහා කුසලතා ඇණවුම් ලැයිස්තුව සම්පාදනය කිරීම හා සීමාවාසික පුහුණුව සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

16 ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී පුරුෂ සමාජභාවමයට ගරු කරමින් කටයුතු කරන ඉගෙනීම් පරිසරයක් නිර්මාණය කිරීමේ ආයතනික හැකියාව සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පීඩාවන්ගෙන් හා වෙනස් කොට සැලකීමකින් තොරව තම වැඩ කටයුතු කරගෙන යාමට ඉඩ සලසන, ස්ත්‍රී පුරුෂ සමාජභාවමය පිළිබඳ සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතීන් සහ විශ්වවිද්‍යාල පරිසරයන් ඇති කිරීමට පහසුකම් සැලසීම මගින් විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. ඒ අනුව පහත දැක්වෙන්නේ ඉහත කාරණාව සාක්ෂාත් කර ගැනීම උදෙසා 2020 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් ය.

16.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙ හි මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

2020 වර්ෂයේ දී නවක සිසුන්ගෙන් හෝ ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයන්ගෙන් නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ පැමිණිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් යටතේ ස්ථාපිත කර ඇති පහත මාර්ග ඔස්සේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

- නවක වදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය www.ugc.ac.lk/rag/හෝ https://www.eugc.ac.lk/rag/
- ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරයwww.ugc.ac.lk/sgbv/
- 0112123700 දුරකථන අංකය
- විද්‍යුත් ලිපිනය ragginghelp@ugc.ac.lk සහ helpme@ugc.ac.lk
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත ඇමතුම් ලබා දීම, පෞද්ගලිකව හෝ ලිඛිතව පැමිණිලි ඉදිරිපත් කිරීම, විද්‍යුත් ලිපිනය ඔස්සේ දැනුම් දීම.

එවැනි පැමිණිලි සියල්ලම විශ්වවිද්‍යාල අනුව වර්ග කර අදාළ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් / මණ්ඩපවල මණ්ඩපාධිපතිවරුන් / ආයතනහි අධ්‍යක්ෂවරුන් වෙත නිසි ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී. ඒ සමඟම, එවැනි පැමිණිලි සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා යොමු කරන ලෙස ද ඉල්ලා සිටින ලදී. නවක වදය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය අතරතුර, විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ ඉල්ලීම් අනුව හා අවශ්‍ය අවස්ථාවන්හි දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දෙන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලැබෙන සියලුම පැමිණිලි සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා විශ්වවිද්‍යාල විසින් ඒවාට ගනු ලැබූ ක්‍රියාමාර්ග ආදිය සියල්ල එක් කොට, නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ

සමානාත්මතාව /සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය පවත්වා ගෙන යන දත්ත සංචිතය සම්පාදනය කර ඇත. එය අඛණ්ඩව යාවත්කාලීන කර වැඩිදියුණු කරනු ලැබේ.

16.2. නවක වදයට ගොදුරු වූවන්ට සහන සැලසීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල (HEIs) නවක වදය සම්බන්ධ අනිසි හැසිරීම් වැළැක්වීම සඳහා නියාමන යාන්ත්‍රණයක් සැපයීමට පත් කරන ලද කමිටුව

එවකට උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු.ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල නවක වදය හේතුවෙන් 2014/2015 අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යාපනය අහිමි වූ සිසුන්ට සුදුසු සහනයක් ලබා දීම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

- විනිසුරු ජනාධිපති නීතිඥ ආචාර්ය සලීම් මර්සූෆ් - සභාපති
- මහාචාර්ය ජනිතා ඒ ලියනගේ - සාමාජික හා ලේකම්
- පූජ්‍ය මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි - සාමාජික
- ආචාර්ය බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා - සාමාජික
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නාරද වර්ණසූරිය - සාමාජික
- ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය - සාමාජික
- ජනාධිපති නීතිඥ ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා - සාමාජික

පීඩාවට පත් සිසුන් නැවත අධ්‍යයන ආයතනයකට ඇතුළත් කර ගැනීමේදී ඔවුන්ට නැවත වරක් එවැනිම ඉරණමක් අත්විඳීමට සිදු නොවන බව සහතික කිරීම සඳහා නවක වදය වැළැක්වීම සඳහා වන නියාමන යාන්ත්‍රණයක් යෝජනා කිරීමට ද මෙම කමිටුව වෙත පැවරී තිබුණි.

මෙම කමිටුව වෙත පැමිණිලි 88 ක් ලැබී ඇති අතර දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකිරීම, අධ්‍යයන වර්ෂයට අනුකූල නොවීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන උසස් අධ්‍යාපන ආයතනයක් වීම ආදී කරුණු හේතුවෙන් පැමිණිලි 35 ක් ප්‍රතික්ෂේප විය.

කමිටුවේ වාර්තාව 2020 අගෝස්තු 31 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත භාර දෙන ලදී.

16.3 ශිෂ්‍ය විනය පිළිබඳ ස්ථාවර කමිටුව (SCSD)

ශිෂ්‍ය විනය සඳහා ස්ථාවර කමිටුවක් (SCSD) පිහිටුවීමට මූලික පියවර ගන්නා ලදී. මෙම ස්ථාවර කමිටුවේ පරමාර්ථය වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් නවක වදය තුරන් කිරීමයි. ඉහත ස්ථාවර කමිටුව සඳහා පත් කරන ලද සාමාජිකයින්ට අමතරව, පහත සඳහන් අය වෙනුවෙන් නම් කරන ලද පුද්ගලයන් මෙම ශිෂ්‍ය විනය සඳහා වන ස්ථාවර කමිටුවට ඇතුළත් කරනු ලැබේ;

- ගරු. නීතිපති
- ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
- පොලිස්පති

16.4 නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ එහි සමාජ හා නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම පිළිබඳව දැනුවත් කිරීම

පහත සඳහන් ලියකියවිලි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කර 2018/2019 අධ්‍යයන වර්ෂයේ නවක සිසුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත යවා ඇත.

1. 1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා තහනම් කිරීමේ පනත;
2. 2015 අංක 04 දරන අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත;
3. "විශ්වවිද්‍යාලයේ නවක වදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ තොරතුරු" යනුවෙන් පත්‍රිකාවක් සකස් කිරීම. නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යනු කුමක්ද, නවක වදයට අයත්වන ක්‍රියාවන්, නවක වදයේ දී ගත හැකි ක්‍රියාමාර්ග හා එවැනි අවස්ථාවකදී පැමිණිලි කළ යුත්තේ කාටද යන්න පිළිබඳව මෙහි ඇතුළත් වේ.

16.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය, නවකවදය හා ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්ති

නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව තම ආයතනයට ලැබී ඇති පැමිණිලි සහ එවැනි පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්ෂණික ක්‍රියාමාර්ග පිළිබඳව, අදාළ ආයතනය වෙත එවැනි පැමිණිල්ලක් ලැබී දින 7ක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන මෙන් විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ගෙන්, මණ්ඩපවල මණ්ඩපාධිපතිවරුන්ගෙන් සහ ආයතනවල අධ්‍යක්ෂවරුන්ගෙන් ඉල්ලමින්, කොමිෂන් සභා වක්‍රලේඛ අංක 04/2020 ***"ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාල / මණ්ඩප/ ආයතනවලට නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සිදු කරන පැමිණිලි"*** නිකුත් කරන ලදී.

16.6 "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක් සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම සඳහා මැදිහත්වීම් සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම / යෝජනා කිරීම"

මෙම විශ්වවිද්‍යාල පද්ධතිය පුරා සිදු කරන ලද පර්යේෂණය යුනිසෙෆ් සංවිධානයේ මූල්‍ය සහයෝගය ඇතිව 2018 ජුනි මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආරම්භ කළ අතර එය අදියර දෙකක් (02) යටතේ සිදු කරන ලදී. පළමු අදියරෙන් විශේෂයෙන් අවධානය යොමු කර ඇත්තේ ගැටලුව පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයනයන් සිදු කිරීමටයි. දෙවන අදියර පළමු අදියර මත පදනම්ව සංවර්ධනය කරන ලද උපායමාර්ග / ක්‍රියාකාරී කරුණු ක්‍රියාත්මක කිරීමට සහාය වීම කෙරෙහි අවධානය යොමු කර ඇත. 2019 දී

පර්යේෂණ කටයුතු සිදු කිරීමේදී ඇති වූ නොවැළැක්විය හැකි බාධා වීම් හේතුවෙන් පර්යේෂණයේ දෙවන අදියරේ කටයුතු 2020 වර්ෂය දක්වා ගෙන යාමට සිදු වුණි.

පර්යේෂණයේ අවසාන වාර්තාව 2020 දී සම්පූර්ණ කරන ලද අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ යුනිසෙෆ් හි සමාලෝචන ක්‍රියාවලියෙන් පසුව ප්‍රකාශයට පත් කෙරේ.

ඉහත පර්යේෂණයේ දෙවන අදියරෙහි ඉදිරිපත් වූ යෝජනාවේ එක් ප්‍රධාන අංගයක් වූයේ අලුතින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන්ට සඳහා මානව සාරධර්ම, සමාජ සහජීවනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවමය, විවිධත්වයට ගරු කිරීම සහ වෙනස්කම් යනාදිය පිළිබඳ දිශානති අත්පොතක් සකස් කිරීමයි. එම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා උපදේශකවරයෙකු ලෙස සම්මානිත මහාචාර්ය සිරිහෙට්ටිගේ පත් කරන ලද අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී.

17. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම

අධ්‍යයන කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම තරුණ විද්‍යාර්ථීන්ට මෙරට මෙන් ම පිටරට උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගීතා අංශය මඟින් ඒ වෙනුවෙන් 2019 වසර තුළ දැඩි උත්සාහයක් දැරුවේය. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදුකළ කාර්යයන් පහත පරිදි වේ;

17.1 උසස් අධ්‍යාපනය සඳහා ප්‍රදාන ලබා දීම

17.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන යටතේ උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල ගුරුවරුන්ට මූල්‍යාධාර ලබාදීම

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථිර සේවයේ නිරත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ සියළුම අංශයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීමයි.

ප්‍රදානයේ මුළු වටිනාකම විෂය, අධ්‍යයන වැඩසටහනේ ස්වභාවය සහ වැඩසටහන පවත්වනු ලබන රට අනුව වෙනස් වේ.කෙසේ වෙතත්, වසරකට ලබාදෙන ප්‍රදානය රු. මිලියන 2.0 නොයික්මවයි.යෝජනාවේ ගුණාත්මකභාවය සහ එහි විද්‍යාත්මක කුසලතාවය මත පදනම්ව තරඟකාරී පදනමින් ප්‍රදාන පිරිනැමීම සිදු කෙරේ. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදාන ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට,අපේක්ෂකයා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන ශාස්ත්‍රපති හෝ ආචාර්ය උපාධි සඳහා ILETS (අධ්‍යයන) සඳහා ලකුණු 6.0 ට නොඅඩු අවම වශයෙන් සමස්ත ලකුණු 6.5ක් ලබා

ගත යුතු අතර වෙනත් ඕනෑම භාෂාවක උපාධියක් සඳහා ILETS (අධ්‍යයන) සඳහා අවම වශයෙන් සමස්ත ලකුණු 6.0 ලබා තිබිය යුතුය.

2020 දී ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් 17 දෙනෙකුගේ මුළු අයවැය වූ රු.මිලියන 67 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

වර්ෂය	ලබාදුන් ප්‍රදාන ගණන	අනුමත කරන ලද ප්‍රදානවල වටිනාකම රු.මි.
2015	43	69.89
2016	39	107.32
2017	49	147.79
2018	17	83.38
2019	14	75.2

වගුව **17.1.1** **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 – 2019 දක්වා ප්‍රදානය කරන ලද පශ්චාත් උපාධි ප්‍රදාන**

17.1.2 UGC ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව-ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර ආචාර්ය/ශාස්ත්‍රපති ශිෂ්‍යත්ව වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙ හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට ,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කරන ලදී.

මෙම වැඩසටහන යටතේ 2019 වර්ෂය සඳහා ආචාර්ය උපාධි (PhD) වැඩසටහන් සඳහා උපරිම වශයෙන් අපේක්ෂකයින් 02 ක් සහ ශාස්ත්‍රපති වැඩසටහන සඳහා උපරිම වශයෙන් අපේක්ෂකයින් 10 ක් දක්වා ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීමට නියමිතය. අපේක්ෂකයින් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය එක්ව එක් එක් ආයතනය විසින් නියම කර ඇති අවශ්‍යතා සපුරා ඇති ආකාරයට යටත්ව සිදුකරන ලදී.

මෙම ශිෂ්‍යත්වය මඟින් අධ්‍යයන වැඩසටහනේ මුළු පන්ති ගාස්තුව සහ එක් අපේක්ෂකයෙක් වෙනුවෙන් ජපාන යෙන් 90,000ක මාසික ජීවන වියදමක් ආවරණය කරයි. අවබෝධතා ගිවිසුමට අනුව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය පන්ති ගාස්තුවෙන් 50% ක් නිදහස් කරන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 50% ආයතනික ගාස්තු සහ මාසික ජීවන වියදම් ලබා දෙනු ඇත.

2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කිසිදු අපේක්ෂකයෙකු අනුමත කර නොමැති නමුත් අපේක්ෂකයින් 04 දෙනෙකු සිය උසස් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යන අතර 2020 වර්ෂය සඳහා මෙම යෝජනා

ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඩොලර් 5,165,000 කට සමාන මුළු මුදලක් ප්‍රදානය කර ඇත. එක් අපේක්ෂකයෙක් 2020 දී සිය අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කර ඇත.

17.1.3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) ශ්‍රී ලංකාව - ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) ඒකාබද්ධ / හින්න ආචාර්ය උපාධි වැඩසටහන 2020/2021

ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් උසුලන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒකාබද්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒකාබද්ධ / හින්න ආචාර්ය උපාධි වැඩසටහනක් දියත් කළේය. ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයෙ හි විශේෂයෙන් විද්‍යා, ඉංජිනේරු, තාක්ෂණ, සෞඛ්‍ය විද්‍යා සහ ව්‍යාපාර යන අංශවල ශක්තිමත් පර්යේෂණ පද්ධතියක් පවතී.

මෙම වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව සඳහා 2020 සැප්තැම්බර් 04 දිනැති ලිපිය මගින් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව, අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට (2020 ඔක්තෝබර් 30) අයදුම්පත් 07 ක් ලැබී තිබුණු අතර මූලික තේරීම් කටයුතු සඳහා ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ඒවා යොමු කර ඇත.

17.1.4 ඕස්ට්‍රේලියාවේ, ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය - 2020

ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (PhD) සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සම අනුග්‍රාහක ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර තිබේ.

ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසරකට ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව 12 ක් දක්වා ප්‍රදානය කරන අතර සාර්ථක අපේක්ෂකයින්ට වසර තුන (3) ක කාලයක් සඳහා පන්ති ගාස්තු සඳහා වන සම්පූර්ණ පිරිවැය පියවා ගැනීමට ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්වයක් පිරිනමනු ලැබේ. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය නම් අමතර මාස හයක (6) පන්ති ශිෂ්‍යත්වයක් සහ ජීවන දීමනාවක් ප්‍රදානය කිරීම ද ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් සලකා බැලීය.

ඊට අමතරව, ඕස්ට්‍රේලියාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සීමාවන් තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාර්ථකව අධ්‍යයන කටයුතු සිදු කරන අපේක්ෂකයින්ට වසර තුන (3) ක කාලයක් සඳහා ජීවන වියදම් සහ විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණයක් ලබා දෙයි.

2019 ජූනි මාසයේ දී පළමු වටය සඳහා අයදුම්පත් කැඳවන ලද අතර අයදුම්පත් කැඳවන අවසන් දින වන විට අයදුම්පත් 22 ක් ලැබී තිබූ අතර, එම සියළුම අයදුම්පත් මූලික පරීක්ෂාව සඳහා ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයට යොමු කරන ලදී. අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා සලකා බැලීමෙන් පසු ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ එක්ව ප්‍රදානලාභීන් 10 දෙනෙකු තෝරාගෙන 2020 වර්ෂයේ දී ශිෂ්‍යත්ව පිරිනැමීමට අනුමත කර ඇත.

මෙම වැඩසටහන යටතේ වන දෙවන වටය සඳහා අයදුම්පත් 2020 අගෝස්තු 28 වන දින කැඳවනු ලැබූ අතර අවසාන දිනය 2020 සැප්තැම්බර් 15 දින විය. ඒ අනුව, අයදුම්පත් 18 ක් අවසාන දිනය දක්වා ලැබී ඇති අතර මූලික තේරීම් සඳහා ශ්‍රීජිත් විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.

17.2 රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුම් / ගිවිසුම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

විශ්වවිද්‍යාල විසින් විදේශ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් / ගිවිසුම්වලට එළඹීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) නිර්දේශය ඇතිව රේඛීය අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. තවද, විශ්වවිද්‍යාල විසින් අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුම් / ගිවිසුම් අමාත්‍ය මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව 2018.07.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් එය තීරණය කර තිබුණි. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2019.12.19 දිනැති චක්‍රලේඛ අංක PS/SP/SB/Circular/06/2019 විසින් මෙම ක්‍රියාවලිය විධිමත් කරන ලදී.

ඒ අනුව, මේ සඳහා 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පාලනය වන විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා පහත දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියා පටිපාටියක් අනුගමනය කර ඇත.

1. අදාළ විශ්වවිද්‍යාලයේ පාලන සභාව විසින් අනුමත කිරීම
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීම
3. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කිරීම
4. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අනුමත කිරීම

2020 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද අවබෝධතා ගිවිසුම් / ගිවිසුම්වල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

අංකය	විශ්වවිද්‍යාලය	ලැබුණු අවබෝධතා ගිවිසුම් ගිවිසුම් / ගණන	අමාත්‍යාංශයට නිර්දේශ කර යවන ලද අවබෝධතා ගිවිසුම් ගිවිසුම් / ගණන
01	පේරාදෙණිය	08	06
02	කොළඹ	14	14
03	කැලණිය	01	01
04	ශ්‍රී ජයවර්ධනපුර	06	06
05	මොරටුව	06	04
06	රුහුණ	16	09
07	විවෘත විශ්වවිද්‍යාලය	04	04
08	රජරට	02	02
09	සබරගමුව	01	01
10	වයඹ	02	02

වගුව 17.2 2020 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද අවබෝධතා ගිවිසුම් / ගිවිසුම්

18 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 1999 ජුනි 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 ප්‍රකාරව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවන ලද අතර එය1999 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක විය.

18. 1 ප්‍රධාන මූල්‍ය තොරතුරු

18.1.1 ආයෝජන සහ ආයෝජන ආදායම

රාජ්‍ය බැංකු සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සහ ණයකරවල ස්ථාවර තැන්පතු සඳහා ආයෝජන සිදු කර ඇත.





18.2 සාමාජික දායකත්වය

ප්‍රධාන මූල්‍ය තොරතුරු						
විශ්‍රාම වැටුප් අරමුදල						
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව						
		2016	2017	2018	2019	2020
1	සාමාජිකයන්					
	ක්‍රියාකාරී සාමාජිකයන්	11,722	12,586	13,945	14922	15,211
	අක්‍රිය සාමාජිකයන්	1,451	1,856	1,928	2025	2,023
	මුළු සාමාජිකයන් ගණන	13,173	14,442	15,873	16947	17,234
2	මුළු සාමාජිකත්වය	16,230	17,779	19,733	21275	21,951

3	විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයන් ගණන	222	252	279	314	351
4	එකවර මුදල් ආපසු ගෙවන සාමාජිකයන් ගණන	812	886	965	1082	1,186
5	අරමුදලේ ශේෂය(රු.මී)					
	දායකයින්ගේ අරමුදල	5,805	7,043	8,722	10,906	13,473
	විශ්‍රාමිකයන්ගේ අරමුදල සහ සංචිත	590	708	744	815	855
	අරමුදලේ වර්ධනය %	21%	21%	22%	24%	22%
6	මුළු ආයෝජනය (රු.මී)	5,704.	6,969	9,078	11,060	13,347
7	මුළු ආයෝජන ආදායම (රු.මී)	595	733	924	1,168	1,333
8	ආදායම් බදු (රු.මී)	11	22	138	166	189
9	ආයෝජන මත ප්‍රතිලාභ (%)	10%	10.50%	10.18%	10.56%	9.98%
10	සාමාජිකයන්ට ප්‍රකාශිත පොලිය	10.50%	10%	10%	10%	9.60%
11	විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මී)	39	51	58	75	93
12	විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්ධනය (%)	21%	31%	14%	29%	24%

වගුව **18.2** විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය









19 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුපක් සහතික කිරීමේ සැලැස්මක් ලෙස 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 89 - 96 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ පරමාර්ථය වන්නේ සාමාජිකයින්ට විශ්‍රාම යාමේදී හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමේදී වඩා හොඳ ප්‍රතිලාභයක් සහතික කිරීම සඳහා අරමුදල දූරදර්ශීව කළමනාකරණය කිරීමයි.

19.1 මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය

ප්‍රධාන මූල්‍ය තොරතුරු									
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල									
		දිනය වන විට			2016	2017	2018	2019	2020
1	සාමාජිකත්වය								
	සක්‍රීය සාමාජිකයන්ගේ ගිණුම්	දෙසැ.31			32,055	34,614	36,851	38,842	40,105
	අක්‍රිය සාමාජිකයන්ගේ ගිණුම්	දෙසැ.31			5,218	5,208	5,202	5,196	5,193
2	මුදල් ආපසු ගෙවීම්								
	ආපසු ගෙවීම් කළ ගණන	දෙසැ.31			2,845	2,881	2,798	3,143	2,717
	සිදුකළ ආපසු ගෙවීම්වල වටිනාකම (රු.මි)	දෙසැ.31			1,737	2,259	2,141	2,456	2,712
3	අරමුදල් ශේෂය(රු.මි))	දෙසැ.31			33,052	37,027	42,254	48,729	56,059
4	ණය ශේෂය(රු.මි)	දෙසැ.31			4,745	5,274	6,304	7,047	7,432
5	සාමාන්‍ය සංචිතය (රු.මි)	දෙසැ.31			220	279	6	121	65
6	වර්ෂය තුළ දී ලබා දුන් ණය (රු.මි)	දෙසැ.31			916	1,414	1,963	1,897	1,471
7	මුළු ආයෝජනය(රු.මි)	දෙසැ.31			23,763	27,028	34,651	38,275	45,585
8	ආයෝජන ආදායම(රු.මි)	දෙසැ.31			2,852	3,157	3,653	4,393	4,741
09	ආදායම් බදු(රු.මි)	දෙසැ.31			57	113	690	622	674
10	ආයෝජන මත ප්‍රතිලාභ (බදුවලට පෙර)	දෙසැ.31			12.87%	11.68%	10.54%	11.48%	10.40%
11	ප්‍රකාශිත පොළිය - ආරම්භක ශේෂය සඳහා	දෙසැ.31			11.30%	10.50%	10.00%	10.00%	9.60%

වගුව **19.1** මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය









20 2020 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා වක්‍රලේඛ සහ ආයතන වක්‍රලේඛ ලිපි

අදාළ රජයේ ආයතන විසින් කරන ලද නියෝගයන් සමඟ සමාලෝචිත කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම සඳහා කොමිෂන් සභා වක්‍රලේඛ 16 ක් සහ ආයතන වක්‍රලේඛ ලිපි 07 ක් නිකුත් කර ඇත.

මේවා පිළිබඳ විස්තර 20.1 වගුවේ සහ 20.2 වගුවේ දක්වා ඇත;

අංකය	චක්‍රලේඛ අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
1	01/2020	වෘත්තීය මාර්ගෝපදේශ උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	24.01.2020
2	11/2019(iii)	සහකාර මහාචාර්ය / මහාචාර්ය තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කිරීම	17.02.2020
3	02/2020	උපකුලපති තනතුරට පත්කිරීම	04.05.2020
4	14/2019(i)	විවෘත දැන්වීම් / කුසලතා අනුව උසස් කිරීම ආදිය මගින් මහාචාර්ය / සහාය මහාචාර්ය තනතුර සඳහා වන තේරීම් කමිටු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියෝජිතයන් පත් කිරීම	15.05.2020
5	03/2020	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / නියෝජ්‍ය ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන) තනතුරු සඳහා උසස්වීම්	01.06.2020
6	04/2020	විශ්වවිද්‍යාල / මණ්ඩප / ආයතන වෙත සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි	10.08.2020
7	05/2020	විගණන සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	10.08.2020
8	06/2020	පාලක (උද්‍යාන) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම	24.08.2020
9	07/2020	ආයතනයක අධ්‍යක්ෂ තනතුරට පත්කිරීම	11.09.2020
10	21/2018(i)	තාක්ෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම	16.10.2020
11	08/2020	U-AS 2 (II) හි වැටුප් කේතයට අයත් අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල කාණ්ඩය සඳහා කාර්යක්ෂමතා කඩයිම් අවශ්‍යතා	11.11.2020
12	09/2020	පශ්චාත් උපාධි, උපාධිය හෝ වෙනත් අධ්‍යයන සුදුසුකම් වෙනත් අදාළ සුදුසුකම් ලෙස සලකා බැලීම	12.11.2020
13	10/2020	රසායනාගාර සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	12.11.2020
14	11/2020	විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල විකල්ප ඇගයීම් පැවැත්වීම සඳහා වූ මාර්ගෝපදේශ	01.12.2020
15	12/2020	රාජ්‍ය ආයතනවල විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සේවයේ යෙදවීම	08.12.2020
16	13/2020	තාක්ෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය (ශ්‍රව්‍ය දෘශ්‍ය)	23.12.2020

වගුව **20.1** **2020 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ**

අංකය	ආයතන චක්‍රලේඛ ලිපි අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
1	01/2020	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2019 අදාළ කර ගැනීම - රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2020 වසර	03.01.2020
2	02/2020	වැටුප් වර්ධක දිනයේ ම නිලධාරියෙකුට උසස්වීමක් ලබා දී, ඔහුගේ මනාපය පරිදි පෙර තනතුරටම නැවත පත් කරන විට අදාළ විය යුතු වැටුප් පියවර තීරණය කිරීම	30.01.2020
3	03/2020	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2020 අදාළ කර ගැනීම - 2020 රාමලාන්(රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම.	30.04.2020

4	04/2020	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2020 අදාළ කර ගැනීම – කොවිඩ් -19 වෛරසය පවතින කාලය තුළ රාජ්‍ය ආයතන විවෘත කර කාර්යාලයීය කටයුතු ආරම්භ කිරීම සහ එම කටයුතු පවත්වාගෙන යාම.	30.04.2020
5	05/2020	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019 සහ 03/2019 (i) අදාළ කර ගැනීම	11.05.2020
6	06/2020	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ එක් තනතුරක සිට තවත් තනතුරකට පත් කිරීමේදී සේවකයින්ගේ වැටුප් ස්ථානගත කිරීම	24.08.2020
7	07/2020	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2020 අදාළ කර ගැනීම - 2021 වසර- රාජකාරී කටයුතු ඇරඹීම	30.12.2020

වගුව 20.2 2020 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

	සටහන	2020	2019
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන ද	1	517,346,263	66,871,406
ලැබිය යුතු ගිණුම්	2	84,352,955	138,945,888
තොග		11,463,447	8,246,357
ඉදිරියට කළ ගෙවීම්/තැන්පතු	3	2,825,836	4,951,841
මුළු ජංගම වත්කම්		**615,988,501**	**219,015,492**
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	4	76,883,610	77,889,919
ඉඩම් හා ගොඩනැගිලි	4	602,658,363	613,327,894
අස්පර්ෂ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග	5	3,848,906	5,013,193
කරගෙන යන වැඩ - පරිගණක මෘදුකාංග	6	12,271,750	11,683,750
ආයෝජන	7	49,701,691	49,080,430
බැදුම්කර අධිමිල	8	4,703,829	5,268,598
පරිත්‍යාග/ ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන	9	36,787,225	30,783,729
මුළු ජංගම නොවන වත්කම්		**786,855,374**	**793,047,513**
මුළු වත්කම්		**1,402,843,876**	**1,012,063,005**
ස්කන්ධය හා වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	10	94,780,735	59,760,624
ඉදිරියට ලද ගෙවීම්/තැන්පතු	11	40,901,140	21,788,605
මුළු ජංගම වගකීම්		**135,681,876**	**81,549,230**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම්	12	100,266,049	87,645,735
පරිත්‍යාග අරමුදල්	13	38,914,914	32,958,826
මුළු ජංගම නොවන වගකීම්		**139,180,963**	**120,604,562**
මුළු වගකීම්		**274,862,838**	**202,153,791**
ශුද්ධ වත්කම්		**1,127,981,037**	**809,909,214**
විශ්වවිද්‍යාල අරමුදල් හා සංචිත			
විශේෂිත අරමුදල්	14	1,708,840	1,573,366
විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන	15	188,429,760	201,135,647
ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකළ	16	306,824,678	3,577
ත්‍යාග සහ පරිත්‍යාග		759,665	893,906
සේවක සංවර්ධන අරමුදල		25,402,237	33,800,132
UGC සංවර්ධන අරමුදල		36,154,376	39,129,376
නැවත අගය කිරීමේ අතිරික්තය		509,313,767	509,313,767
සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය)		59,387,714	24,059,443
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**1,127,981,037**	**809,909,214**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයන් විසින් අනුමත කරන ලද අතර කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

මහාචාර්ය ඒ.කේ.ඩබ්.ජයවර්ධන
කොමිෂන් සභා සාමාජික

ආර්.ඒ.යූ.රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2020 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය රු

	2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ලැබීම්		
අතිරික්තය/(ඌනතාවය)	29,882,647	12,267,136
ගැලපීම්		
පෙර වර්ෂ සඳහා ගැලපීම්	5,445,624	42,322
යලි ඒකාබද්ධ කිරීම් ගිණුම වෙත මාරු කිරීම්	-	11,412,091
UGC සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම්	-	-
ක්ෂය වීම්	34,655,997	39,744,987
ක්‍රමක්ෂය	(34,655,997)	(39,744,987)
වැදගීකර ඇටිම්ල	(564,769)	251,763
භාදායම් සහ වියදම්-අරමුදල් ගිණුම	(8,971,395)	-
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම	13,641,856	30,861,385
අරමුදල් කළමනාකරණ ගිණුම් පොළිය-ශිෂ්‍යත්ව අරමුදල	(46,049)	-
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	39,387,914	54,834,697
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
තොගවල වැඩිවීම්	(3,217,090)	24,497,186
ගෙවීම්වල අඩුවීම්	48,687,022	(41,787,016)
පාරිතෝෂිකය සඳහා පොළිය	3,568,467	3,568,116
ඉදිරියට කළ ගෙවීම්/තැන්පතු වල අඩුවීම්	2,126,005	(111,738)
අයවීම්වල වැඩිවීම්	54,592,934	76,198,203
පාරිතෝෂික ගෙවීම්	(4,025,241)	(2,610,988)
පෙර වර්ෂ සඳහා ගැලපීම් - ස්ථාවර වත්කම් ප්‍රශ්ඨනීකරණය	-	290,196
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ලැබීම්	141,120,009	114,878,656
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපළ පිරියත උපකරණ වීලට ගැනීම	(21,815,869)	(25,119,904)
ස්ථාවර තැන්පතු /භාණ්ඩාගාර බැදුම්කර වල ආයෝජනය	(6,624,758)	1,027,043
කරගෙන යන වැඩවල වැඩිවීම - UGC ගොඩනැගිල්ල සහ UGC මූල්‍ය ඇංශය, මෘදුකාංග	(588,000)	8,883,328
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(29,028,627)	(15,209,533)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය		
මූලධන ආධාර ලැබීම්	21,000,000	11,500,000
පුනරුත්ථාපන ආධාර ලැබීම්	3,000,000	4,000,000
මූලධන ආධාර (අඩුවීම්)/වැඩිවීම්	12,705,887	4,129,900
විශේෂ අරමුදල් අඩුවීම්	135,475	(29,798,027)
ශිෂ්‍යත්ව අරමුදල් ලැබීම්/(ගෙවීම්)	5,956,088	776,761
කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදලේ වැඩිවීම්/(අඩුවීම්)	(8,397,895)	3,769,065
UGC සංවර්ධන අරමුදලේ වැඩිවීම්	(2,975,001)	(30,640,783)
වියදම් නොකළ මානව සම්පත් සංවර්ධන අරමුදලේ වැඩිවීම්/(අඩුවීම්)	306,824,678	-
2017 අයවැය යෝජනා අඩුවීම්	-	3,577
ණයාග හා පරිත්‍යාග (අඩුවීම්)/වැඩිවීම්	134,241	234,051
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	338,383,473	(36,025,456)
මුදල් සහ මුදල් සමාන වත්කම් වල වැඩිවීම්/(අඩුවීම්)	450,474,857	63,643,667
වර්ෂය මූල මුදල් සහ මුදල් නොවන වත්කම්	66,871,406	3,227,739
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් නොවන වත්කම්	517,346,263	66,871,406
සටහන-1		
UGC A/C 2323284 - ලංකා බැංකුව	(258,892,745)	(50,374,646)
ලංකා බැංකුව-විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල	3,133,245	2,071,605
රාත්‍රී කාලීන තැන්පතු	650,000,000	86,000,000
අරමුදල් කළමනාකරණ ගිණුම	122,954,013	28,918,448
මහජන බැංකුව	151,750	256,000
	517,346,263	66,871,406

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

විස්තරය	ඵලමිණික ප්‍රදාන	වියදම් නොකළ ප්‍රදාන	රඳවාගත් ලාභ /(අලාභ)	UGC සංවර්ධන අරමුදල	නැවත අගය කිරීමේ අතිරික්තය	කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	ණය සහ ප්‍රදාන	මුළු ඉද්ධ වත්කම් හිමිකම
2019 ජනවාරි 01 දිනට ශේෂය	205,234,547	-	11,749,985	69,770,159	509,313,767	30,031,067	1,127,957	827,227,482
පෙර වර්ෂයේ ඇලපිම්	-	-	42,322	-	-	-	-	42,322
පෙර වර්ෂයේ ඇලපිම් - ක්ෂයවීම්	-	-	(290,196)	-	-	-	-	(290,196)
පෙර වර්ෂයේ ඇලපිම් - ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම්	-	-	290,196	-	-	-	-	290,196
ලැබුණු රජයේ ප්‍රදාන	-	15,500,000		-	-	-	-	15,500,000
වර්ෂයේ අතිරික්තය/(ඌනතාව)	-		12,267,136	-	-	-	-	12,267,136
වියදම් නොකළ අත්පත් කර ගැනීම් සඳහා වියදම් නොකළ අරමුදල් මාරු කිරීම්	15,500,000	(15,500,000)	-	-	-	-	-	-
ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම්	(40,035,183)	-	-	-	-	-	-	(40,035,183)
සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම්	19,955,021	-	-	(19,955,021)	-	-	-	-
HCD වියදම් නොකළ අරමුදලෙන් මාරු කිරීම්	247,211	-	-	-	-	-	-	247,211
CGEE වෙත මාරු කිරීම්	-	-	-	(11,514,011)	-	-	-	(11,514,011)
පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම්	234,051	-	-	-	-	-	(234,051)	-
ලාභය මාරු කිරීම් - APQN සමුළුව	-	-	-	828,250	-	-	-	828,250
ආයෝජන සඳහා පොළිය	-	-	-	-	-	2,148,764	-	2,148,764
ජාතික විද්‍යා පදනමෙන් අරමුදල් මාරු කිරීම්	-	-	-	-	-	1,620,301	-	1,620,301
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**201,135,647**	**-**	**24,059,443**	**39,129,376**	**509,313,767**	**33,800,132**	**893,906**	**808,332,272**
අයවැය යෝජනා වියදම් නොකළ ප්‍රදානය 2019	-	3,577	-	-	-	-	-	3,577
පෙර වර්ෂයේ ඇලපිම්	-	-	5,445,624	-	-	-	-	5,445,624
ලැබුණු රජයේ ප්‍රදාන	-	440,000,000		-	-	-	-	440,000,000
වර්ෂයේ අතිරික්තය/(ඌනතාව)	-	-	29,882,647	-	-	-	-	29,882,647
වියදම් නොකළ අත්පත් කර ගැනීම් සඳහා වියදම් නොකළ අරමුදල් මාරු කිරීම්	21,000,000	(21,000,000)	-	-	-	-	-	-
ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම්	-	(2,881,725)	-	-	-	-	-	(2,881,725)
ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම්	(34,655,997)	-	-	-	-	-	-	(34,655,997)
HCD වියදම් නොකළ අරමුදලෙන් මාරු කිරීම්	697,594	(697,594)	-	-	-	-	-	-
පුනරුත්ථාපන ප්‍රදාන වියදම් නොකළ අරමුදලෙන් මාරු කිරීම්	118,275	(118,275)	-	-	-	-	-	-
UGC ණය අරමුදල වෙත මාරු කිරීම් - හොඳම විශ්වවිද්‍යාල ආයෝජනය	-	-	-	(2,000,000)	-	-	-	(2,000,000)
HCD වියදම් ක්‍රමක්ෂය කිරීම්	-	(108,481,304)	-	-	-	-	-	(108,481,304)
පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම්	134,241	-	-	-	-	-	(134,241)	-
ආයෝජන සඳහා පොළිය	-	-	-	-	-	1,611,389	-	1,611,389
ජාතික විද්‍යා පදනමට අදාළ වියදම්	-	-	-	-	-	(401,500)	-	(401,500)
උත්පාදක අරමුදල් සම්බන්ධ වියදම්	-	-	-	(975,000)	-	-	-	(975,000)
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල් හා සම්බන්ධ වියදම්	-	-	-	-	-	(9,607,784)	-	(9,607,784)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**188,429,760**	**306,824,678**	**59,387,714**	**36,154,376**	**509,313,767**	**25,402,237**	**759,665**	**1,126,272,198**

2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

රු.

	සටහන්	2020	2019
ආදායම්			
රජයේ ප්‍රදාන	17	2,789,612,876	2,674,130,539
සංවර්ධන අරමුදල් දායකත්වය			
වෙනත් ආදායම්	18	29,677,510	30,318,443
මුළු ආදායම්		**2,819,290,387**	**2,704,448,982**
වියදම්			
පඩිනඩි, වේතන සහ සේවක සුභසාධන	19	320,396,652	319,259,998
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	20	86,317,908	106,122,138
ප්‍රදාන හා වෙනත් මාරු කිරීම්	21	2,314,606,010	2,175,591,318
ක්ෂය වෙන් කිරීම් සහ ක්‍රමක්ෂය	22	34,655,997	39,744,987
ප්‍රතිරූක්ථාපන වියදම්	23	2,881,725	17,775,506
වෙනත් වියදම්	24	30,549,447	33,687,898
මුළු වියදම්		**2,789,407,740**	**2,692,181,845**
කාල පරිච්ඡේදය තුළ අතිරික්තය/(ඌනතාවය)		**29,882,647**	**12,267,136**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UGC/FA/20

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 අගෝස්තු 12 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 67.2 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තව දුරටත්

භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 26 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනුයේ අස්පිත්වයක වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ එහි මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් මිස අනාගතයේ විය හැකි තත්ත්වයන් සම්බන්ධයෙන් නොවන අතර අනාගතයේදී මෙහෙයුම්වලට දැරීමට අවශ්‍යවන වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනා නොගත යුතුය. එසේ වුවද වාර්තාවේ දින වනවිට නගර විශ්වවිද්‍යාල 02 ක් සඳහා බඳවා නොගත් උපදේශකවරු 04 දෙනෙකු වෙනුවෙන් උපදේශක ගාස්තු ලෙස රු.මිලියන 4.4 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ප්‍රතිපාදන කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා ජංගම වගකීම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර ප්‍රදානයක් වශයෙන් ලද 2018 වර්ෂයේ දී කොමිෂන් සභාව වෙත අයිතිය පවරා දී තිබූ වටිනාකම රු.මිලියන 4.3 ක් වූ මෝටර් රථයෙහි සාධාරණ අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 1.8 ක වියදම් ගිණුම්වලින් අතහැරී තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කරනු ලැබේ. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට

මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වවයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කාර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 12 කට අදාළ ව්‍යාපෘති යෝජනා 20 ක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී වසර 01 සිට වසර 13 දක්වා කාලපරාසයක් ගත වී තිබුණ ද අදාළ ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ උසස් අධ්‍යාපන ආයතන අපොහොසත් වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 10 කට අදාළ ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වසර 03 සිට වසර 11 දක්වා කාලයක් ගත වී තිබුණ ද ලංසු ප්‍රදානය කිරීම ප්‍රමාදවීම, වැඩ ආරම්භ කිරීම සහ ව්‍යාපෘතිය අවසන් කළ යුතු නියමිත කාලය දීර්ඝ කිරීම යනාදී හේතූන් මත ව්‍යාපෘති 18 ක භෞතික ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2020 වර්ෂයේ ජුනි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 452 ක මුදලක් දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සාමාජික ගාස්තු ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරා තිබුණ ද ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමට දායකත්වය ලබා දී ඇති බව නිරීක්ෂණය නොවුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල 03 ක් වෙත මාර්ගගත ක්‍රමය අනුව සිසුන් බඳවා ගැනීමට අදාළ පරිගණක මෘදුකාංග ස්ථාපිත කිරීම සඳහා එකතුව රු.10,253,750 ක අත්තිකාරම් මුදලක් ලබා දී සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ගතවී තිබුණ ද අදාළ කාර්යයන් නිමකර අත්තිකාරම් නිරවුල් කිරීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේදී 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙළින් 897, 738, 2,226 ක් හා 2,461 ක් වශයෙන් පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු වාර්තාවේ දිනය දක්වා සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2019 වර්ෂයේ පැවැත්වූ අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල 2019 දෙසැම්බර් 27 දින නිකුත් කර තිබුණ ද විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් කැඳවීම මාස 02 කට අධික කාලයක් ප්‍රමාද කර 2020 මාර්තු 05 වන දින ආරම්භ කර තිබුණි. තව ද 2020 ඔක්තොම්බර් 12 වන දින 2020 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගය ආරම්භ කර තිබුණ ද එදිනට පෙර කඩඉම් ලකුණු නිකුත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපොහොසත් වීම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා අහිමි වී ගිය සිසුන්ට 2020 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටීමට තිබූ අවස්ථාව මග හැරී තිබුණි.

(උ) 21 වන සියවසට සරිලන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවක කේන්ද්‍රීය මූල්‍ය තොරතුරු පද්ධතියක් 2020 ජූනි මාසය වනවිට හඳුන්වාදීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසන් වනවිට එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක පමණ වී තිබුණි.

(ඌ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සමාලෝචනය කර යාවත්කාලීන කිරීම, සිසුන් බඳවා ගැනීම පුළුල් කිරීම සඳහා රජයේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිව්‍යුහගත කිරීම හා වර්තමාන සහ අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසාන වන විට එහි ප්‍රගතිය සියයට 25 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
(අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 12 කට අදාළ ව්‍යාපෘති යෝජනා 20 ක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී වසර 01 සිට වසර 13 දක්වා කාලපරාසයක් ගත වී තිබුණ ද අදාළ ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ උසස් අධ්‍යාපන ආයතන අපොහොසත් වී තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පනතේ 100 (1) වගන්තිය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන පරිදි විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වලට ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. ඒ අනුව අදාල විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ඔවුනට ලැබෙන සීමිත ප්‍රතිපාදන තුල ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ව්‍යාපෘති ආරම්භ කරනු ලැබේ. ජාතික අයවැය චක්‍රලේඛ මඟින් නව ව්‍යාපෘති ආරම්භ කිරීම 2019 වර්ෂයේ සිට සීමා කර තිබීම නව ව්‍යාපෘති වල වැඩ ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. මේ වන විට කැබිනට් අනුමැතිය ලද රු.මි. 10,408/- ඇස්තමේන්තුගත ව්‍යාපෘති 22 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නව ව්‍යාපෘති ආරම්භ කිරීම සීමාකර ඇති නිසා ආරම්භ කිරීමට නොහැකි වී ඇත. එමෙන්ම විගණන විමසුමේ පරිදි වසර 13ක් ප්‍රමාද වී ඇත්තේ මොරටුව විශ්වවිද්‍යාලයට අනුමත වූ සිසු නේවාසිකාගාරය ඉදිකිරීම පමණි. ඒ සඳහා යෝජිත ඉඩමේ නේවාසිකාගාරය ඉදිකිරීමට පිරිවැය අධික බැවින් වෙනත් ඉඩමක් සොයා ගැනීමට කටයුතු කරන නිසා මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇති බවට විශ්වවිද්‍යාලය දැනුම් දී ඇත.
(ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 10 කට අදාළ ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වසර 03 සිට වසර 11 දක්වා කාලයක් ගතවී තිබුණ ද ලංසු ප්‍රදානය කිරීම ප්‍රමාදවීම, වැඩ ආරම්භ කිරීම සහ ව්‍යාපෘති අවසන් කළ යුතු නියමිත කාලය දීර්ඝ කිරීම යනාදී හේතූන් මත ව්‍යාපෘති 18 ක භෞතික ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.	විශ්වවද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන හා ඒ සඳහා මහාභාණ්ඩාගාරයේ මුදල් නිදහස් කිරීම අනුව ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය තීරණය වී ඇත. පසුගිය වසර 05 තුළ රු.මි. 13,546/- වැයකර ව්‍යාපෘති 91 ක් නිමකර ඇත. ඊට අමතරව ව්‍යාපෘති 80 ක් විවිධ ප්‍රගති මට්ටම් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහි සඳහන් ව්‍යාපෘති අතුරින් වසර 11 ක් ප්‍රමාද වී අවසන් වී ඇත්තේ පේරාදෙණිය වෛද්‍ය පීඨයේ සමාන්තර සායනික ගොඩනැගිල්ල පමණි. එහි පළමු අදියර 2013.04.30 නිම වී ඇත. එහෙත් දෙවන අදියර ආරම්භ කිරීම නව ඇස්තමේන්තු අනුමත කරගන්නා තුරු ප්‍රමාද වී ඇත. මෙසේ ව්‍යාපෘති වල ප්‍රගතිය අවම මට්ටමක පැවතීමට පොදුවේ පහත හේතු බලපානු ලැබේ. i. සීමිත වාර්ෂික ප්‍රතිපාදන නිසා ආරම්භ කිරීම ප්‍රමාද වීම. ii. ප්‍රමාදවී ආරම්භ කිරීම නිසා අනුමත ඇස්තමේන්තු පිරිවැය (TCE) ප්‍රමානවත්

	නොවීම. iii. ඒ අනුව ව්‍යාපෘති වල මුළු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කර අනුමත කර ගැනීමට කටයුතු කිරීම. iv. 2018,2019,2020 වර්ෂයන් වල ප්‍රාග්ධන අරමුදල් නිදහස් කිරීම පහල මට්ටමක පැවතීම. එමෙන්ම 2019 වසරේ ඉරුදින ප්‍රහාරය හා 2020 වසරේ කොවිඩ් 19 වසංගත තත්වය ව්‍යාපෘති ප්‍රගතියට බලපා ඇත.
(ඇ) ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2020 වර්ෂයේ ජුනි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මි. 452 ක මුදලක් දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සාමාජික ගාස්තු ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරා තිබුණ ද ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමට දායකත්වය ලබා දී ඇති බව නිරීක්ෂණය නොවුණි.	දකුණු ආසියානු විශ්වවිද්‍යාලය, සාර්ක් (SARC) රාජ්‍ය නායක සමුළුවේ එකඟතාවයක් අනුව 2007 දී අත්සන් කරන ලද එකඟතා ගිවිසුමක් මත ආරම්භ විය. මෙම ගිවිසුමෙහි එකඟතාවය මත සාමාජික රටවල දායක මුදල් තීරණය වී තිබුණි. ඒ අනුව විදේශ අමාත්‍යාංශයේ දැනුම් දීම හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමත කල පරිදි දායක මුදල් ගෙවන ලදී. **විස්තරය** | **ගෙවීම් 2010 සිට2014** | **ගෙවීම් 2015 සිට 2019** | **ගෙවීම් 2020, 2019 සහ 2020 මාස 06** | **මුළු එකතුව** දායකත්වය ඇ.ඩො.මි. | 2.951 | නැත | 0.394 | 3.345 දායකත්වය රු. මි. | 378.1 | නැත | 73.87 | 451.97 දකුණු ආසියානු විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි සඳහා යම් ශ්‍රී ලාංකික සිසුන් ප්‍රමාණයක් ද වාර්ෂිකව තෝරාගනු ලබයි. එහෙත් ශ්‍රී ලාංකික සිසුන් තෝරා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බලය පවරා නොමැති අතර තෝරාගන්නා ලද සිසුන් විසින්ද දකුණු ආසියානු විශ්වවිද්‍යාලයට පාඨමාලා ගාස්තු ගෙවනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සිසුන් 44 දෙනෙකුට දකුණු ආසියානු විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධිය හැදෑරීමට අවස්ථාව ලැබී ඇත. 2021 වසරේදී මෙම සිසුන් සංඛ්‍යාව තිදෙනෙක් වන අතර එම සිසුන්ද සියළු පාඨමාලා ගාස්තු ගෙවනු ලබයි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දකුණු ආසියානු විශ්වවිද්‍යාලයට සිසුන් තෝරාපත් කරන ක්‍රමවේදය පිළිබඳව ඉදිරිපත් කරන ලද යෝජනාවලියට මෙතෙක් පිළිතුරක් ලැබී නොමැති අතර පාලක සභාව කැඳවීම ද දිගින් දිගටම කල් දමා ඇත. මේ අනුව ගෙවන මුදල් හා සාපේක්ෂව දකුණු ආසියානු විශ්වවිද්‍යාලයෙන් ප්‍රතිලාභ නොලැබෙන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

	එමෙන්ම මෙම තත්වය මත 2020/2021 වාරිකය ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තාවකාලිකව අත්හිටුවන ලද අතර මෙම දකුණු ආසියානු විශ්වවිද්‍යාලය හා සම්බන්ධව තවදුරටත් පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණයක් කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇත.
(ඇ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල 03 ක් වෙත මාර්ගගත ක්‍රමය අනුව සිසුන් බඳවා ගැනීමට අදාළ පරිගණක මෘදුකාංග ස්ථාපිත කිරීම සඳහා එකතුව රු.10,253,750 ක අත්තිකාරම් මුදලක් ලබා දී සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ගතවී තිබුණ ද අදාළ කාර්යයන් නිමකර අත්තිකාරම් නිරවුල් කිරීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.	1. විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් මාර්ගගත ක්‍රමය යටතේ කැඳවීම සඳහා අවශ්‍ය පරිසණක මෘදුකාංග ස්ථාපිත කිරීමේ කටයුතු 2014 වසරේ සිට මොරටුව විශ්වවිද්‍යාලය මඟින් ආරම්භකරන ලදී. ඒ සඳහා මූලික ගෙවීම රු.7,000,000/- කි. 2015 දී යුනිකේත ක්‍රමය (UNICODE) හඳුන්වාදීම මත එය තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වූ අතර ඒ සඳහා රු.1,972,750/- මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවන ලදී. මෙසේ අඛණ්ඩව සංවර්ධනය කරන ලද මෘදුකාංගය 2019 වසරේ සිට ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මොරටුව විශ්වවිද්‍යාලය හා මොබිටෙල්/ටෙලිකොම් ත්‍රෙපාර්ෂවීය ගිවිසුමක් මත මෙම මෘදුකාංගය "ප්‍රවේශ අයදුම්පත් මාර්ගගත ක්‍රමය යටතේ කැඳවීම" සඳහා භාවිතා කරනු ලැබේ. එසේම එම මෘදුකාංගය මගින් සිසුන් විශ්වවිද්‍යාලවලට තේරී පත් වීමෙන් පසු අදාල පාඨමාලාවේ ලියාපදිංචි වීම සඳහාද අවස්ථාව සලසා ඇත. මෙම ත්‍රෙපාර්ෂවීය ගිවිසුම ආරම්භ කිරීමේදී මොරටුව විශ්වවිද්‍යාලය හා මොබිටෙල්/ටෙලිකොම් ආයතන වෙත කිසිම අමතර ගෙවීමක් කර නැත. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරන ලද මෘදුකාංග සඳහා ගෙවන ලද රු.8,972,750/- ක මුදල 2021 වසරේ සිට ප්‍රාග්ධනිත කල හැක. 2. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිසණක තාක්ෂණ ආයතනය හා අනුබද්ධ තීක්ෂණ ආයතනය විසින් ස්ථාපිත කරන ලද "විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තේරීම සඳහා වන මෘදුකාංගය" සඳහා 2015 වසරේදී යුනිකේත ක්‍රමය (UNICODE) හඳුන්වා දීම හේතුවෙන් ඒ සඳහා අමතර රු.750,000/- ක් 2016 වසරේදී රු. 375,000 සහ 2017 වසරේදී රු.375,000 වශයෙන් ගෙවන ලදී. තවද, එම මෘදුකාංගය 2020/2021 අධ්‍යයන වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් ලකුණු නිකුත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අභ්‍යන්තර මෘදුකාංගයක් සමග සසඳා බැලීම පිණිස තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2021 වසරේදී නව සේවා ගිවිසුමකට එළඹුණු අතර එම කාර්යය මේ වන විට අවසන් කර ඇත. ඒ සඳහා රු.450,000/- ක ගෙවිය යුතු අතර එයින් රු.405,000/- ක මූලික මුදල මේ වන විට නිදහස් කර ඇත.

	ඒ අනුව මෙම මෘදුකාංගය ද 2021 වසරේදී ප්‍රාග්ධනිත කල හැක. 3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විගණන කමිටුවේ නිර්දේශය මත මහපොළ ශිෂ්‍යත්වය මාර්ගගත ක්‍රමයට ගෙවීම සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කර ස්ථාපිත කිරීම සඳහා කැළණිය විශ්වවිද්‍යාලය වෙත 2017 වසරේදී භාර දෙන ලදී. එහි ඇස්තමේන්තුව රු.1,770,000/- ක් වන අතර එම මුදලින් රු.531,000/- ක අත්තිකාරමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් කැළණිය විශ්වවිද්‍යාලය වෙත ගෙවන ලදී. මේ වන විට එම මුදලින් රු.265,500/- ක් මහපොළ අරමුදල මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ප්‍රතිපූරණය කර ඇත. මෙම මෘදුකාංග පිළිබඳව වර්තමාන තත්වය මහපොළ අරමුදලින් කැළණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙතින් විමසා ඇති අතර එම පිළිතුරු අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
(ඉ)විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේදී 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂ දක්වා පිළිවෙළින් 897,738,2,226 ක් හා 2,461 ක් වශයෙන් පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු වාර්තාවේ දිනය දක්වා සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.	2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා එක් එක් අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී විගණන විමසුමේ දක්වා ඇති පරිදි පුරප්පාඩු සංඛ්‍යාවක් පවතිනුයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම නොව පුරප්පාඩු පිරවීම් යටතේ ලබා දෙන අධ්‍යයන පාඨමාලා සඳහා ලියාපදිංචි වීම අදාළ සිසුන් විසින් ප්‍රතික්ෂේප කරන නිසාවෙනි. කෙසේ වෙතත් 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා පුරප්පාඩු පිරවීමේ වට 7ක් කර තිබෙන අතර 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා මේ වන විට පුරප්පාඩු පිරවීමේ වට 5ක් සම්පූර්ණ කර ඇත. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා තවදුරටත් විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා සඳහා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී.
(ඊ) 2019 වර්ෂයේ පැවැත්වූ අ.පොස.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල 2019 දෙසැම්බර් 27 දිනත නිකුත් කර තිබුණද තවද විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් කැඳවීම මාස 02 කට අධික කාලයක් ප්‍රමාද කර 2020 මාර්තු 05 වන දින ආරම්භ කර තිබුණි. තව ද 2020 ඔක්තෝම්බර් 12 වන දින 2020 වර්ෂයේ අ.පොස.ස. උසස් පෙළ විභාගය ආරම්භ කර තිබුණ ද එදිනට පෙර කඩඉම් ලකුණු නිකුත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපොහොසත් වීම හේතුවෙන්	2019 වර්ෂයේ පැවති අ.පොස.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් 2020 මාර්තු මසදී කැඳවන ලදී. එහෙත් පළමු කොවිඩ් වසංගතය හේතු කොටගෙන මාර්තු 14 සිට රට වසා දැමූ අතර ඒ අනුව පාසල් පද්ධතිය දින නියමයක් නොමැතිව වසා දමන ලදී. ඒ අනුව පාසල් අයදුම්කරුවන්ට විදුහල්පති අත්සන ලබා ගැනීම පහසුවීම සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020 ජුනි 22 දක්වා දීර්ඝ කිරීමට සිදුවිය. එමෙන්ම එම වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධව විවිධ පාර්ශව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩු 07 ක් ගොනු කරන ලදී. තවද 2020 ඔක්තෝම්බර් මස 09 වැනි දින වන විට විෂය නිර්දේශ දෙකක්(02) වෙනුවෙන් පෙනී සිටි සිසුන්ට සාධාරණ ක්‍රමවේදයක් නිර්දේශ කිරීමට නීතිපති උපදෙස් පැතීමට සිදු විය. එම නීතිපති උපදෙස් මත

විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා අහිමි වී ගිය සිසුන්ට 2020 වර්ෂයේ අ.පොස. උසස් පෙළ විභාගයට පෙනී සිටීමට තිබූ අවස්ථාව මග හැරී තිබුණි.	ක්‍රමවේදය වරින් වර වෙනස් කිරීමට සිදු වීම නිසා කඩඉම් ලකුණු 2020 ඔක්තෝම්බර් මස දක්වා ප්‍රමාද විය. කොවිඩ් වසංගතය හමුවේ ඇතිවූ මෙවැනි ප්‍රමාදයන් වලක්වාගැනීම සඳහා 2021 වසරේ සිට පූර්ණ පරිසණක මෘදුකාංගයක් භාවිතා කර විභාග දෙපාර්තමේන්තුව හා ඒක්බද්ධ වී ළමුන්ගේ පාසල් කාලය තීරණය කිරීමට ක්‍රමවේදයක් සකසන ලදී. ඒ අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ කඩඉම් ලකුණු 2021 ඔක්තෝම්බර් මස ලබාදෙන ලදී. තවද, ඉදිරියේදී උසස් පෙළ විභාගය නව නිර්දේශය සඳහා පැරණි නිර්දේශය වශයෙන් විභාග දෙකක් (02) ලෙස පැවැත්වීම් අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම මත සිදු නොකරන බවට විභාග දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.
(උ) 20 වන සියවසට සරිලන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවක කේන්ද්‍රීය මූල්‍ය තොරතුරු පද්ධතියක් 2020 ජුනි මාසය වනවිට හඳුන්වාදීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසන් වනවිට එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක පමණ වී තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල සේවක කේන්ද්‍රීය මූල්‍ය තොරතුරු පද්ධතිය මඟින් විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා පොදු වැටුප් මෘදුකාංගයක්, වැඩි දියුණු කරන ලද අර්ථසාධක අරමුදල් මෘදුකාංගයක් හා වැඩි දියුණු කරන ලද විශ්‍රාම වැටුප් මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට යෝජිත වේ. මෙම කාර්යය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීමෙන් පසු උපදේශක සේවා කොන්ත්‍රාත්තුව 2021 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලය වෙත ප්‍රදානය කර ඇත. මේ වන විට මූලික සැලසුම් කිරීමේ කටයුතු අවසන් කර ඇත. ඒ අනුව මෙම කාර්යය කරගෙන යන අතර 2020 මාර්තු මස සිට ආරම්භ වූ කොවිඩ් වසංගත තත්ත්වය ද සේවක කේන්ද්‍රීය මූල්‍ය පද්ධතිය සංවර්ධනය කිරීමේ කාර්යයන් භෞතික ප්‍රගතියට බලපා ඇත.
(ඌ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සමාලෝචනය කර යාවත්කාලීන කිරීම, සිසුන් බඳවා ගැනීම පුළුල් කිරීම සඳහා රජයේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිව්‍යුහගත කිරීම හා වර්තමාන සහ අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසාන වන විට එහි ප්‍රගතිය සියයට 25 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි ප්‍රතිපාදන වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමේ අරමුණින් 2020.03.12 දින පැවති 1028 දරන කොමිෂන් සභා වාරයේදී ඒ සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලදී. එම විද්වත් කමිටු සාමාජිකයන් විශ්වවිද්‍යාල පද්ධතිය නියෝජනය කරන සියළු ඇලුම්කාර පාර්ෂවයන් සමඟ වරින්වර සාකච්ඡා පවත්වමින් විද්වත් කමිටුවේ අවසන් වාර්තාව 2020.12.22 දින කොමිෂන් සභාවට භාර දී ඇත. මෙම වාර්තාව, පනත සංශෝධනය සඳහා වූ යෝජනා අඩංගු සවිස්තර වාර්තාවක් වූ හෙයින් එය නීතිමය රාමුවට ගැලපෙන පරිදි සකස් කල යුතු වූ අතර ඉන් අනතුරුව කොමිෂන් සභා සාමාජිකයන් සමඟ වරින්වර මෙම නව ප්‍රතිපාදන සාකච්ඡා කරන ලදී. සියලු සංශෝධන ඇතුලත් අවසන් කෙටුම්පත ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා සාකච්ඡා කිරීමට නියමිත අතර දැනට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2020	ප්‍රතිප්‍රකාශිත 2019
		රු.	රු
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන ද	5	121,490,944	540,830,105
ලැබිය යුතු ආයෝජන ආදායම	6	371,000,028	340,575,680
ලැබිය යුතු දායක මුදල්	7	68,726,222	40,444,195
ආයෝජන	8	2,704,032,556	1,819,511,250
		3,265,249,750	2,741,361,229
ජංගම නොවන වත්කම්			
ආයෝජන	8	10,524,626,140	8,707,033,353
ලැබිය යුතු ආයෝජන ආදායම	6	731,805,487	396,356,998
		11,256,431,626	9,103,390,351
මුළු වත්කම්		14,521,681,376	11,844,751,581
වගකීම්			
ජංගම වගකීම්			
ණය තිම්යන්	9	1,137,214	1,083,030
සාමාජිකයන්ට ගෙවිය යුතු ගෙවීම්	10	9,513,631	1,920,135
වි.වි.වැ.අ.ගෙවිය යුතු ගෙවීම්	11	91,333	1,796,763
ජීවන වියදම් ගැලපීම් ගෙවීම	12	31,618	31,618
ගෙවිය යුතු ආදායම් බදු	13	183,210,433	119,034,441
		193,984,229	123,865,988
මුළු ශුද්ධ වත්කම්		**14,327,697,146**	**11,720,885,593**
සාමාජිකයන්ගේ අරමුදල සහ සංචිත			
දායකයින්ගේ අරමුදල		13,472,992,175	10,905,585,546
විශ්‍රාමිකයින්ගේ අරමුදල		358,793,633	321,402,667
රඳවාගත් ඉපැයුම්		495,911,337	493,897,380
මුළු ශුද්ධ වත්කම්		**14,327,697,146**	**11,720,885,593**

පිටු 05 සිට 06 හි දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 07 සිට 15 හි දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අන්තර් කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී. 2021 පෙබරවාරි 25 වැනි දින පැවති 1049 වැනි සභා වාරයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

අත්සන් කළේ- උබයකුල රණවීර, ගණකාධිකාරී	අත්සන් කළේ- ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර, ලේකම්
අත්සන් කළේ- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, සභාපති	අත්සන් කළේ- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.කේ.වී.ජයවර්ධන, කොමිෂන් සභා සාමාජික

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020	ප්‍රති ප්‍රකාශිත 2019
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
බදු සහ වියදම් වලින් පසු ශුද්ධ ආදායම	**1,129,976,136**	**989,655,897**
එකතු කළා / (අඩු කළා)		
භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම/ අධිමිල	15,763,023	15,806,269
විකුණූ භාණ්ඩාගාර බැඳුම්කර මත ලාභය/අලාභ	-	(3,729,405)
විශ්‍රාමික අරමුදලේ ගැලපීම්	12,147,579	10,567,013
ආදායම් බදු වෙන් කිරීම	188,763,208	165,438,745
	1,346,649,945	1,177,738,518
කාරක ප්‍රාග්ධනය ක්‍රියාකාරී පරමුදල් වෙනස්වීම්		
ලැබිය යුතු ආයෝජන ආදායම් (වැඩිවීම)/අඩුවීම	(365,872,837)	(316,076,528)
විවිධ ණයකරුවන්ගේ වැඩිවීම/ (අඩුවීම)	54,183	75,820
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්	**980,831,291**	**861,737,810**
අඩු කළා :ආදායම් බදු ගෙවීම්	(124,599,824)	(122,193,933)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**856,231,468**	**739,543,877**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පත් කල්පිරීම්	1,819,511,250	1,515,000,000
ස්ථාවර තැන්පත් වල ආයෝජනය	(2,154,032,556)	(2,209,511,250)
විකුණුම්- භාණ්ඩාගාර බැඳුම්කර	-	315,468,096
ණයකර මිලදී ගැනීම්	(1,800,000,000)	(800,000,000)
භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම්	(583,355,810)	(303,489,400)
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(2,717,877,116)**	**(1,482,532,554)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
දායක මුදල් ලැබීම්	1,617,121,757	1,421,253,500
දායක මුදල් ආපසු ගෙවීම්	(82,263,214)	(82,495,833)
විශ්‍රාම වැටුප් ගෙවීම්	(92,552,055)	(75,421,026)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,442,306,487**	**1,263,336,641**
මුදල් හා මුදල් සමාන අයිතම වල ශුද්ධ වැඩිවීම	**(419,339,161)**	**520,347,964**
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන අයිතම	540,830,105	20,482,141
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන අයිතම	**121,490,944**	**540,830,105**
බැංකු මුදල්		
ලංකා බැංකුව	997,561	7,817,451
මහජන බැංකුව	2,000,000	
එකතු කළා - අරමුදල් කළමණාකරන ගිණුම් ශේෂ		
කෙටිකාලීන තැන්පතු ආයෝජන	-	505,000,000
එක් දින රාත්‍රී ආයෝජන	-	25,000,000
අරමුදල් කළමනාකරණ ගිණුම - ලංකා බැංකුව	11,605,151	3,012,653
අරමුදල් කළමනාකරණ ගිණුම - මහජන බැංකුව	106,888,233	
	121,490,944	**540,830,105**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

	දායකයන්ගේ අරමුදල රු.	විශ්‍රාමිකයන්ගේ අරමුදල රු.	සමුච්චිත අරමුදල රු.	එකතුව රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය	8,722,324,383	281,196,642	462,916,135	9,466,437,160
2019 වර්ෂය සඳහා අතිරික්තය	-	-	989,641,694	989,641,695
භාණ්ඩාගාර බැඳුම්කර අධිමිල අවමිල දින 366 ඇලපිම	-	-	3,870	3,870
ණය කර ලැබිය යුතු ආදායම ඇලපිම්			83,476	83,476
ස්ථාවර තැම්පතු ලැබිය යුතු ආදායම් ඇලපිම	-	-	(71,462)	(71,462)
ආදායමට ඇළපිම්			(1,682)	(1,682)
සාමාජික පොලි රඳවා ගැනීම්	(2,540,796)	-	2,540,796	-
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(82,864)	-	-	(82,864)
හිඟ/නොලැබූ දායක මුදල්	3,351,390	-	-	3,351,390
පවත්නා වර්ෂයේ ආදායමෙන් වන හුවමාරු	-	10,567,013	-	10,567,013
විශ්‍රාමිකයන්ට අදාළ දායක මුදල් ලැබීම	-	4,417	-	4,417
පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල්	1,407,633,090	-	-	1,407,633,090
සම්පූර්ණ දායක මුදල් ආපසු ලබා දීම	(52,828,840)	-	-	(52,828,840)
දායක අරමුදල්/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්	(78,673,385)	78,673,385	-	-
අර්ථ සාධක අරමුදලට මාරු කිරීම්	(28,430,646)	-	-	(28,430,646)
2019 වර්ෂය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම	-	(75,421,026)	-	(75,421,026)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය	934,833,213	26,382,235	(961,215,448)	-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	10,905,585,546	321,402,667	493,897,380	11,720,885,593
2020 වර්ෂය සඳහා අතිරික්තය	-	-	1,129,963,528	1,129,963,528
සාමාජික පොලි රඳවා ගැනීම්	(15,896,766)	-	15,896,766	-
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(75,476)	-	-	(75,476)
හිඟ/නොලැබූ දායක මුදල්	8,511,015	-	-	8,511,015
පවත්නා වර්ෂයේ ආදායමෙන් වන හුවමාරු	-	12,147,579	-	12,147,579
විශ්‍රාමිකයන්ට අදාළ දායක මුදල් ලැබීම්	-	177	-	177
පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල	1,636,968,067	-	-	1,636,968,067
සම්පූර්ණ දායක මුදල් ආපසු ගෙවීම්	(67,908,382)	-	-	(67,908,382)
දායක අරමුදල/ විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්	(89,960,446)	89,960,446	-	-
ඊ.වී අර්ථ සාධක අරමුදල වෙත මාරු කිරීම්	(20,242,899)	-	-	(20,242,899)
2020 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම	-	(92,552,055)	-	(92,552,055)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදල් පොළිය	1,116,011,515	27,834,820	(1,143,846,336)	-
	2,567,406,629	37,390,966	2,013,959	2,606,811,554
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	13,472,992,175	358,793,633	495,911,338	14,327,697,146

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන්	2020 රුපියල්	ප්‍රකි ප්‍රකාශිත 2019 රුපියල්
ආදායම			
ආයෝජන ආදායම්	14	1,332,635,658	1,167,598,226
අඩු කළ ආදායම් බදු වෙන් කිරීම		(188,775,815)	(165,438,745)
බදු පසු ශුද්ධ ආදායම්		**1,143,859,843**	**1,002,159,481**
අඩු කළ වියදම			
විශ්‍රාමික අරමුදල් ගැලපුම්	15	12,147,579	10,567,013
මෙහෙයුම් වියදම්	16	1,748,736	1,936,570
		13,896,315	**12,503,584**
වියදම් අඩු කල පසු ශුද්ධ ආදායම		**1,129,963,528**	**989,655,897**
එකතු : ආදායමට ගැලපීම්		15,896,766	2,540,796
ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය		493,897,380	462,916,135
බෙදිය හැකි ශුද්ධ ආදායම		**1,639,757,674**	**1,455,112,828**
අඩු කළ සාමාජික පොලී			
දායකයාගේ අරමුදල		1,116,011,515	934,833,213
විශ්‍රාමික අරමුදල		27,834,820	26,382,235
		1,143,846,336	**961,215,448**
ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය		**495,911,338**	**493,897,380**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/PNF/FA/2020 මෙම අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 අප්‍රේල් 19 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාමවැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

இல. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්

සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාවට අනුව, එහි විගණන විමසුම් කිසිවක් සඳහන් කර නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට නොමැත.

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

		2020 වර්ෂය රුපියල්	ප්‍රතී ප්‍රකාශිත 2019 වර්ෂය රුපියල්
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන වත්කම්	06	154,623,411	1,517,622,550
ලැබිය යුතු පොළිය	07	1,737,016,864	1,358,607,042
ලැබිය යුතු දායක මුදල්	08	254,859,438	143,073,745
ලැබිය යුතු අර්ථසාධක ණය වාරික	09	35,588,693	22,965,568
ලැබිය යුතු අර්ථසාධක ණය	14	1,046,871,791	895,943,261
ආයෝජන	13	11,223,586,114	6,835,000,000
වෙනත් අත්තිකාරම් සහ පෙරගෙවුම්	10	362,800	373,706
තොග		28,112	210,654
		14,452,937,223	10,773,796,525
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු පොළිය	07	1,687,409,659	1,044,294,065
දේපළ , පිරියත හා උපකරණ	11	27,067	122,392
අස්පෘශ්‍ය වත්කම්	12	1,205,934	1,691,246
ආයෝජන	13	34,360,934,984	31,439,721,543
ණය	14	6,384,690,902	6,150,651,456
		42,434,268,547	38,636,480,701
මුළු වත්කම්		**56,887,205,771**	**49,410,277,227**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයගැතියෝ	15	2,044,497	1,982,440
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා ගිණ දායක මුදල්		45,849,418	45,831,213
ආපසු ගෙවිය යුතු මුදල්	16	49,806,648	46,011,265
ගෙවිය යුතු බදු	17	650,370,746	448,155,681
මුළු වගකීම්		**748,071,309**	541,980,600
මුළු ශුද්ධ වත්කම්		**56,139,134,462**	**48,868,296,627**
ශුද්ධ වත්කම්			
සාමාජික ගිණුම් ශේෂය - ක්‍රියාකාරී	18	56,020,836,691	48,690,885,342
සාමාජික ගිණුම් ශේෂය - අක්‍රිය	19	38,153,592	38,208,635
අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම්		8,000,000	8,000,000
ඉල්ලුම් නොකල ප්‍රතිලාභ සංචිත		6,993,398	6,981,274
ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ		65,150,781	124,221,377
මුළු ශුද්ධ වත්කම්		**56,139,134,462**	**48,868,296,627**

පිටු 05 සිට 07 හි දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 08 සිට 22 හි දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අන්තර් කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී. 2021 පෙබරවාරි 25 වැනි දින පැවති 1049 වැනි සභා වාරයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

අත්සන් කළේ- උබයකුල රණවීර, ගණකාධිකාරී

අත්සන් කළේ- ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර, ලේකම්

අත්සන් කළේ- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග,
සභාපති

අත්සන් කළේ- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.කේ.ඒ.ජයවර්ධන,
කොමිෂන් සභා සාමාජික

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රුපියල්	(ප්‍රති ප්‍රකාශිත) 2019 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		
බදු සහ වියදම් වලට පසුව ශුද්ධ ලාභය	4,063,226,896	3,770,201,568
එකතුකිරීම් /(අඩු): භාණ්ඩාගාර බැදුම්කර සඳහා වට්ටම් / වාරික	73,006,730	82,643,919
භාණ්ඩාගාර බැදුම්කර විකිණීමෙන් ලැබෙන ලාභය / අලාභය	-	(50,013,348)
ක්ෂයවීම්	95,325	212,540
ක්‍රමක්ෂය	485,311	485,311
ආදායම් බදු	673,936,576	619,604,539
	4,810,750,839	4,423,134,529
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
තොගවල (වැඩිවීම්)/අඩුවීම්	182,543	31,649
ලැබිය යුතු ආයෝජන ආදායම්වල (වැඩිවීම්)/අඩුවීම්	(1,021,525,417)	(637,110,925)
අත්තිකාරම් සහ පෙරගෙවුම්වල (වැඩිවීම්)/අඩුවීම්	10,906	(152,979)
ලැබිය යුතු ණය වාරිකවල (වැඩිවීම්)/අඩුවීම්	(12,623,125)	8,719,127
ගෙවිය යුතු ජීවන වියදම් ගැලපුම්වල (වැඩිවීම්)/අඩුවීම්	18,205	-
විවිධ ණයහිමියන් (වැඩිවීම්)/අඩුවීම්	62,057	(2,798,985)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	3,776,876,007	3,791,822,418
අඩු කළා : ආදායම් බදු ගෙවීම්	(471,721,511)	(795,598,664)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,305,154,495**	**2,996,223,754**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු කල්පිරීම්	7,401,682,192	11,180,000,000
ස්ථාවර තැන්පතු ආයෝජන	(10,156,731,256)	(10,375,000,000)
භාණ්ඩාගාර බැදුම්කර විකිණීම්/කල්පිරීම්	-	2,835,853,829
ණයකර මිලට ගැනීම්	(3,200,000,000)	(6,500,000,000)
භාණ්ඩාගාර බැදුම්කර මිලට ගැනීම්	(1,427,757,222)	(796,741,600)
දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් මිලට ගැනීම්	-	-
ණය ප්‍රදානය / පියවීම්	(384,967,976)	(742,099,177)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(7,767,774,262)**	**(4,397,986,948)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
සාමාජික මුදල් ලැබීම්	5,808,176,372	5,344,712,089
සාමාජික මුදල් ගෙවීම්	(2,708,555,744)	(2,451,499,444)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,099,620,628**	**2,893,212,645**
මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම	**(1,362,999,138)**	**1,491,449,450**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම්	1,517,622,550	26,173,101
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම්	**154,623,411**	1,517,622,550

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	ක්‍රියාකාරී සාමාජික ශේෂය	අක්‍රිය සාමාජික ශේෂය	අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම්	ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත	රඳවා ගන්නා ලද ලාභ	මුළු ශුද්ධ වත්කම්
2019.01.01 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	42,215,141,094	38,411,700	8,000,000	6,977,990	6,202,221	42,274,733,005
වර්ෂය තුළ දායක මුදල්	5,294,310,631	-	-	-	-	5,294,310,631
වර්ෂයේ සාමාජික පොළී	3,691,767,456	-	-	-	(3,691,767,456)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	307,093	-	(307,093)	-
වර්ෂය තුළ මුදල් ආපසු ගෙවීම්	(2,456,257,679)	-	-	-	-	(2,456,257,679)
සජීව වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැ	(14,688,093)	-	-	-	-	(14,688,093)
ගැළපිලි	(39,388,066)	(203,066)	(307,093)	3,284	39,892,135	(2,805)
බදුවලින් පසු ශුද්ධ ආදායම් (ප්‍රති ප්‍රකා	-	-	-	-	3,770,201,568	3,770,201,568
2019.12.31 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	**48,690,885,342**	**38,208,635**	**8,000,000**	**6,981,274**	**124,221,377**	**48,868,296,627**
වර්ෂය තුළ දායක මුදල්	5,929,904,394	-	-	-	-	5,929,904,394
වර්ෂයේ සාමාජික පොළී	4,146,785,331	-	-	-	(4,146,785,331)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	1,951,215	-	(1,951,215)	-
වර්ෂය තුළ මුදල් ආපසු ගෙවීම්	(2,712,351,127)	-	-	-	-	(2,712,351,127)
සජීව වාර්ෂික නිවාඩු සහ වැරදි දායක මුදල් සඳහා අයකර ගැනීම්	(9,942,329)	-	-	-	-	(9,942,329)
ගැළපිලි	(24,444,921)	(55,043)	(1,951,215)	12,124	26,439,054	-
බදුවලින් පසු ශුද්ධ ආදායම් (ප්‍රති ප්‍රකා	-	-	-	-	4,063,226,896	4,063,226,896
2020.12.31 දිනට ශේෂය	**56,020,836,691**	**38,153,592**	**8,000,000**	**6,993,398**	**65,150,781**	**56,139,134,462**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2,020 වර්ෂය රුපියල්	ප්‍රති ප්‍රකාශිත 2,019 වර්ෂය රුපියල්
ආදායම්			
ආයෝජන ආදායම්	20	4,740,825,953	4,393,116,137
අඩුකලා : මෙහෙයුම් වියදම්	21	(3,662,481)	(3,310,029)
බදු පෙර ශුද්ධ ආදායම		**4,737,163,472**	**4,389,806,107**
අඩු කළා :- ආදායම් බදු		(673,936,576)	(619,604,539)
බදුවලින් පසු ශුද්ධ ආදායම		**4,063,226,896**	**3,770,201,568**
ආදායමට ගැලපීම්		26,439,054	39,892,135
පසුගිය වසරේ රඳවාගත් ලාභය		124,221,377	6,202,221
බෙදාහැරීම සඳහා ශුද්ධ ලාභය		**4,213,887,327**	**3,816,295,925**
සාමාජික ගිණුම් සඳහා පොළිය		(4,146,785,331)	(3,691,767,455)
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය		(1,951,215)	(307,093)
ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ		**65,150,781**	**124,221,377**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/UPF/FA/2020 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 අප්‍රේල් 19 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පවරා ඇති 2018 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලියේ (සංශෝධිත) 24 වන වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්

කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත	
(i) 93 (2) වගන්තිය	දායකයෙකු විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීමට පෙර සේවය නතර කළහොත් එදිනට අර්ථසාධක අරමුදලේ සේවයකයාගේ ගිණුමේ බැරට ඇති සම්පූර්ණ මුදල හා පොලිය ඔහුට ගෙවිය යුතුය. එසේ වුවද මොරටුව විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි කථිකාචාර්යවරියකගේ සේවය 2000 සැප්තැම්බර් 10 දින නතර කර තිබුණ ද අරමුදලේ ශේෂය නිදහස් කිරීම 2020 මැයි 29 දින දක්වා මාස 227 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. සේවය අවසන් කරන ලද දිනට ගිණුමේ පැවති රු.227,072 ක් වූ ශේෂයට රු.1,228,899 ක පොලිය ද සමග රු.1,455,971 ක් නිදහස් කර තිබුණි.

(ii) 95 වගන්තිය

- දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක කාලයක් ඇතුළත දායකයාගේ ගිණුමේ ඇති ශේෂය ගෙවා අවසන් කළ යුතුව ඇත. එසේ වුවද සේවය අවසන් කරන ලද දායකයන් 108 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් අදාළ උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කර ගෙවීම් කිරීම සඳහා මාස 01 ක සිට මාස 317 ක් දක්වා වූ පරාසයක ප්‍රමාදයන් සිදුවී තිබූ අතර එම ප්‍රමාද කාලය වෙනුවෙන් රු.9,241,071 ක පොලී මුදලක් ගෙවා තිබුණි.
- සේවය අවසන් කරන ලද සේවා දායකයා සිතාමතාම හෝ නොසැලකිලිමත්භාවය මත අරමුදල නිදහස් කර ගැනීම සඳහා අයදුම්කිරීම මාස 01 ක සිට මාස 312 ක් දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයන් තිබූ අතර ප්‍රමාදවී අයදුම්කිරීමේ තත්ත්වය මග හැරවීම සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් විධිවිධාන සැලසීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය

(i) සේවය අවසන් කළ දායකයා විසින් අදාළ උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කරන ලද අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත මාස 02 ක් ඇතුළත යොමු කිරීම සිදු කළ යුතුය. එම ප්‍රමාදවීම, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ යම් වරදක් හෝ ප්‍රමාදයක් මත ගෙවන ලද පොලිය අදාළ වගකිව යුතු නිලධාරියාට අධිභාර කළ යුතුය. එසේ වුවද කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත යොමු කිරීමේදී මාස 01 ක සිට මාස 34 ක කාල පරාසයක ප්‍රමාද වීම් මත පොලිය ගණනය කර ගෙවීම් කිරීමේදී වක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත උසස් අධ්‍යාපන ආයතනය වෙතින් යොමු කරන ලද අයදුම්පත් සලකා බලා මාසයක් ඇතුළත අරමුදල දායකයා වෙත නිදහස් කළ

යුතු වුවද ඒ සඳහා මාස 01 ක සිට මාස 53 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ වටිනාකම රු.48,891,896 ක් වූ නිකුත් කළ නමුත් හිමිකම් නොපැමිණීම හේතුවෙන් අවලංගු වූ චෙක්පත් 473 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණ ද, එම අරමුදල් ගෙවා නිදහස් කිරීමට කළමනාකරණය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පින්ඩන වාර්තාව

වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදහස් සහ එහි වර්තමාන තත්වය
3.1 (අ) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත **(i) 93 (2) වගන්තිය** දායකයෙකු විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීමට පෙර සේවය නතර කළහොත් එදිනට අර්ථසාධක අරමුදලේ සේවයකයාගේ ගිණුමේ බැරට ඇති සම්පූර්ණ මුදල හා පොලිය ඔහුට ගෙවිය යුතුය. එසේ වුවද මොරටුව විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි කථිකාචාර්යවරියකගේ සේවය 2000 සැප්තැම්බර් 10දින නතර කර තිබුණ ද අරමුදලේ ශේෂය නිදහස් කිරීම 2020 මැයි 29 දින දක්වා මාස 227ක කාලයක් ප්‍රමාද කර තිබුණි. සේවය අවසන් කරන ලද දිනට ගිණුමේ පැවති රු.227,072 ක් වූ ශේෂයට රු.1,228,889 ක පොළියද සමඟ රු.1,455,971 ක් නිදහස් කර තිබුණි.	අදාළ අයදුම් පත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලැබී ඇත්තේ 2018.09.07 වන දින වන අතර ඔහුගේ ගෙවීම් කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන ගිණුම් විස්තර නොමැති වීම හේතුවෙන් සාමාජිකයා වෙත ලදුපතක් (Acknowledgement) 2018.11.29 වන දින ලියාපදිංචි තැපෑල මඟින් යවා ඇත. එයට පිළිතුරු නොලැබීම හේතුවෙන් සමාජිකයා වෙත සිහිකැඳ වීම් ලිපි දෙකක් 2019.04.03 සහ 2019.11.21 දිනයන්හිදී යවා ඇති අතර එයටද පිළිතුරු ලැබී නොමැති බැවින් 2020 මාර්තු මාසයේදී අවලංගු කිරීමට කටයුතු කර ඇත. දැනට මෙම ගෙවීම අවලංගු කල චෙක්පත් යටතේ ගිණුම් වල දක්වා ඇත.
1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත **(ii) 95 වගන්තිය** • දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක කාලයක් ඇතුළත දායකයාගේ ගිණුමේ ඇති ශේෂය ගෙවා අවසන් කළ යුතුව ඇත. එසේ වුවද සේවය අවසන් කරන ලද දායකයන් 108 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් අදාළ උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කර ගෙවීම් කිරීම සඳහා මාස 01 සිට මාස 317 දක්වා වූ පරාසයක ප්‍රමාදයක් සිදුවී තිබූ අතර එම ප්‍රමාද කාලය වෙනුවෙන් රු.9,241,071 ක පොලී මුදලක් ගෙවා තිබුණි. • සේවය අවසන් කරන ලද සේවා දායකයා සිතාමතාම හෝ නොසැලකිලිමත්භාවය මත අරමුදල නිදහස් කර ගැනීම සඳහා අයදුම් කිරීම මාස 01 සිට මාස 312 ක් දක්වා වූ කාලපරාසයක ප්‍රමාදයන් තිබූ අතර අතර ප්‍රමාද වී අයදුම්කිරීමේ තත්ත්වය මග හැරවීම සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් විධිවිධාන සැලසීමට කටයුතු කර නොතිබිණි.	1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තියට අනුව දායකයාට මාස 03 ඇතුළත ගෙවීම සිදු නොකලහොත්, ඔහුට ගෙවීම් සිදු කරන දිනට කලින් මාසය දක්වා පොළී ගෙවිය යුතු වේ. ඒ අනුව විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය අනුව ගෙවීම් කටයුතු සිදු කර ඇත. තවද නියමිතව සම්පූර්ණ කරන ලද අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලැබුණු පසු කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කර ඇත. ඒ අනුව අදාළ ප්‍රමාදය සිදු වී ඇත්තේ සෑම වර්ෂයකම සිදු කරන පරිදි ගිණුම් කටයුතු හා පොලී ප්‍රතිශත තීරණය කිරීම සඳහා දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා සහ COVID 19 ව්‍යාප්තිය හේතුවෙන් මාර්තු සිට මැයි දක්වා ගෙවීම් කටයුතු කිරීම නවතා තැබූ කාලය වේ. මේ වන විට අර්ථසාධක අරමුදල් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කටයුතු තවදුරටත් විධිමත් කිරීම සඳහා නව චක්‍රලේඛන කෙටුම්පතක් සකස් කර ඇත. එය ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදහස් සහ එහි වර්තමාන තත්වය
(ආ)1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය	
(i)සේවය අවසන් කළ දායකයා විසින් අදාළ උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කරන ලද අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත මාස 02 ක් ඇතුළත යොමු කිරීම සිදු කළ යුතුය. එම ප්‍රමාද වීම්, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ යම් වරදක් හෝ ප්‍රමාදයක් මත ගෙවන ලද පොලියට අදාළ වගකිව යුතු නිලධාරියාට අධිභාර කළ යුතුය. එසේ වුවද කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත යොමු කිරීමේදී මාස 01 සිට මාස 34ක කාල පරාසයක ප්‍රමාද වීම් මත පොලිය ගණනය කර ගෙවීම් කිරීමේදී චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මේ වන විට මේ සම්බන්ධයෙන් නව මාර්ගෝපදේශ ඇතුලත් චක්‍ර ලේඛ කෙටුම්පතක් සකස් කොට ඇත.එය ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත උසස් අධ්‍යාපන ආයතනය වෙතින් යොමු කරන ලද අයදුම්පත් සලකා බලා මාසයක් ඇතුළත අරමුදල දායකයා වෙත නිදහස් කළ යුතු වුවද ඒ සඳහා මාස 01 සිට මාස 53 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.	දායක මුදල් නිදහස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලැබිය යුතු වේ. සෑම විටකම නිසි පරිදි සම්පූර්ණ කල ගෙවීම් අයදුම්පත් කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීම සඳහා කටයුතු කර ඇත.
3.2 කළමනාකරණ ක්‍රියාකාරකම් 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ වටිනාකම රු.48,891,896 ක් වූ නිකුත් කළ නමුත් හිමිකම් නොපෑම හේතුවෙන් අවලංගු වූ චෙක්පත් 473 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණ ද, එම අරමුදල් ගෙවා නිදහස් කිරීමට කළමනාකරණය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.	මේ වන විට අවලංගු කළ චෙක්පත් ලේඛනය විගණනය කිරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ පල කර ඇත.ඒ අනුව අදාළ තොරතුරු දායකයින් ගෙන් ලැබුණු පසුව පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ හැකි වේ. තවද සේවක අර්ථසාධක පනතට අනුව කාලාවරෝධ වගන්තිය අදාළ නොවන බැවින් මෙම මුදල් ආදායමට ගැනීමට හැකියාවක් නොමැත. ඒ අනුව අදාළ දායකයා ඉල්ලුම් කරන තුරු ගෙවීය යුතු ගිණුම් ලෙස පවත්වා ගෙන යායුතු වේ. තවද සුපරීක්ෂණ කමිටුවේ සාමාජිකයි විසින් කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලද්දේ දැනට ගෙන ඇති මෙම ක්‍රියාමාර්ගය යෝග්‍ය බවත් ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ පරිපාලනය වන සේවක අර්ධසාධ අරමුදල (EPF) විසින්ද අනුගමනය කරන්නේ මෙම ක්‍රියාමාර්ගයම බවත්ය.

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2020

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2020

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 අවශ්‍ය මාර්ගෝපදේශ හා මඟ පෙන්වීම් සපයනු ලබයි.

අයවැය ක්‍රියාවලිය සඳහා හඳුන්වාදෙන මධ්‍ය කාලීන ඉදිරි දැක්ම තුළින් වඩාත් උපායමාර්ගිකව රජයේ ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දැක්විය හැකි බව ද එහි සඳහන් වේ. ඒ අනුව, අයවැය ක්‍රියාවලිය මඟින් ඇස්තමේන්තුගත සම්පත් ලබා ගැනීම; මධ්‍ය කාලීන සැලසුම, සාර්ව මූල්‍ය රාමුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා මාවත ඔස්සේ සම්බන්ධ කළ හැකි අතර මෙයින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය ප්‍රතිපාදන යථා තත්ත්වයට පත් කිරීම සිදු කළ හැකිය.

මේ අතර, අයවැය සැකසීමේ පුළුල් ඉදිරිදැක්මට ඇතුළත් වන්නේ, 2015 දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ලැයිස්තුවට අදාළ, 2030 වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු ආකාරයයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇති අතර, එයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වඩාත්ම අදාළ ඉලක්කය වන්නේ අංක 4 - ගුණාත්මක අධ්‍යාපනයයි. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තිරසාර සංවර්ධන ඉලක්ක අංක 4 ට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2019-2023 උපායමාර්ගික සැලැස්මේ හඳුනාගත් ඉලක්ක පෙළගස්වා ඇති අතර ප්‍රධාන අංශ පහක් යටතේ වෙනස්කම් සිදු කළ යුතු බවට ද හඳුනාගෙන ඇත;

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.
- ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ඒ අනුව, රටේ අපේක්ෂාවන් හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කරගත් ආර්ථිකයක් තුළ මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ආයතනික අරමුණු මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 01:** රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.	1. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල බඳවාගැනීම් තුළ	ඉහළ වෙළඳපල ඉල්ලුමක් ඇති දැනට පවතින අධ්‍යයන පාඨමාලා සඳහා බඳවා ගැනීම් 5% කින් වැඩි කිරීම ශ්‍රම වෙළඳපොළේ	- රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් (පවත්නා සහ නව යන දෙකම) සඳහා උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි වීම.

		15%ක සමුච්චිත වර්ධන වේගයක් (CGR) ලබා ගැනීම.	ඉල්ලීම් මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම	
		2. උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස දෙකකින් අඩු කිරීම.	උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය අඩු කිරීම.	- උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස 2ක් වැනි අඩු කාල පරාසයක් පවත්වා ගැනීම.
		3. දැනට පවතින අඩු ඉල්ලුමක් සහිත උපාධි (UG) පාඨමාලා, විභවය සහිත සිසුන් අතර ප්‍රවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපන ආයතනවල පුරප්පාඩු ගණන අඩු කිරීම.	- සෑම වසරකම අඩුම ඉල්ලුමක් සහිත යුනිකෝඩ් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩි කිරීම. - අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.
		4. ඉදිරි වසර 5 තුළ දැනට පවතින උපාධි අධ්‍යයන පාඨමාලා වල පුරප්පාඩු සංඛ්‍යාව 25% කින් අඩු කිරීම.		- අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.
		5. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් සහිතව ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 8% කින් වැඩි කිරීම.	අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට අදාළ විය හැකි නව දේවල් ඉගෙන ගැනීමට සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ සබඳතා ශක්තිමත් කිරීම.	- පවතින ඉල්ලුම සමඟ උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා විදේශීය සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම. - ලොව පුරා සිටින හැකියාවන් සහිත අපේක්ෂකයින් අතර විදේශීය බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට ජනමාධය

			ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අධ්‍යයන වැඩසටහන් විදේශ රටවල් තුළ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යයන පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් ඇති සිසුන් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම	සහ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. - පූර්ව ඉල්ලුමක් නොමැති එහෙත් විදේශීය අයදුම්පත් ලැබුණු උපාධි පාඨමාලා සංඛ්‍යාව.
		6. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සුදුසුකම් ලත් සිසුන්ට පහසුකම් සැලසෙන විශේෂිත කර්මාන්ත ඉලක්ක කරගත් සහ තත්ත්ව නියාමනය කරන ලද බාහිර උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම.	බාහිර උපාධි සම්බන්ධයෙන් වූ තත්ත්ව ආරක්ෂණ අත්පොත පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	- රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන අය වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරන ලද බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ ප්‍රතිශතය.
			UGC නියෝගවලට අනුකූලව සියලුම විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල බාහිර උපාධි වැඩසටහන් සහ ව්‍යාප්ති පාඨමාලාවල ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට එම ආයතන මෙහෙයවීම.	
			බාහිර උපාධි ස්ථාවර කමිටුව හරහා UGC නියෝග සමඟ විවෘත සහ දුරස්ථ ඉගෙනීම් ක්‍රමවේදය හරහා සියලුම විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන බාහිර අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව සමාලෝචනය කිරීම.	

			බාහිර විභාග අංශ තුළ පාලන සහ කළමනාකරණ ක්‍රියා පටිපාටි අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට සියලුම විශ්වවිද්‍යාල මෙහෙය වීම.	
			කණ්ඩායම් වැඩ, රැස්වීම් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සිසුන් සඳහා, රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සහ UGC පිළිගත් ආයතන හරහා ලබා දෙන UGC අනුමත උපාධි පාඨමාලා හරහා 2023 වන විට තවත් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.	UGC එකඟතාවය ඇතිව පත් කරන ලද විද්වත් කමිටුවක නිර්දේශය මඟින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට තෝරාගැනීමට අදාළ දිස්ත්‍රික් පාදක ක්‍රමය සඳහා පාසල් පාදක ක්‍රමයේ විද්‍යාත්මක ක්‍රමය සඳහා විකල්ප ලබා දීම.	- විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන UGC අනුමත උපාධි වැඩසටහන් ලබා දීම සඳහා UGC පිළිගත් ආයතන පිහිටුවීම.
			පොලිසිය සඳහා විශ්වවිද්‍යාලයක් / ඇකඩමියක් පිහිටුවීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම පහසුකම් සැලසීම.	
			අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක් පීඨ ලෙස උසස් කිරීමට සහ ඊට අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පහසුකම් සැලසීම.	

			උසස් අධ්‍යාපන ආයතනවලට යටිතල පහසුකම් සහ මානව සම්පත් සපයමින් සිසුන් ඇතුළත් කිරීම වැඩි කිරීම.	
			සමුද්‍ර සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට පුද්ගලික ආයතන ප්‍රතීතනය කිරීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම	
			පෞද්ගලික ආයතනවලට ගුවන් සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට ප්‍රතීතනය කිරීමට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට පහසුකම් සැලසීම.	
			ඩිප්ලෝමා පාඨමාලා ප්‍රදානය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතන 10ක් පිහිටුවීම.	
			හෙද විද්‍යාල උපාධි පිරිනැමීමේ මට්ටමට උසස් කිරීමට පහසුකම් සැලසීම.	
			ආයුර්වේද විද්‍යාව සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවා ආයුර්වේද උපාධි ප්‍රදානය කරන ආයතන පීඨ ලෙස උසස් කිරීම.	
			ජනමාධ්‍ය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	

			උපදේශන කමිටුවක් හරහා විශ්වවිද්‍යාල ව්‍යාපෘති යෝජනාව අවසන් කිරීම.	
			අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම.	
			අවශ්‍ය සම්පත් සුරක්ෂිත කිරීම.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බළකාය විසින් නිර්දේශ කරනු ලබන හා ප්‍රදානය කරන ආයතන විසින් නිර්දේශ කරනු ලබන උපාධිය දක්වා හෙද විද්‍යාල උසස් කිරීමට අදාළ ක්‍රියාකාරකම්.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කර ඇති පරිදි, ක්‍රීඩා අධ්‍යාපනය සඳහා කැප වූ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාළ ක්‍රියාකාරකම්.	
		8. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලා බඳවා ගැනීමේදී 30% ක CGR පහසුකම් සැලසීම.	ශ්‍රම වෙලඳපොල නිරීක්ෂණ තුළින් ලැබෙන ප්‍රක්ෂේපන මත පදනම්ව, නැගී එන වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.	- වසරකට අනුමත කරන නව සහ අදාළ පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව.
			බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍යවරුන් සඳහා වන පශ්චාත් උපාධි අවස්ථා වැඩි කිරීම.	

ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 02:** 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.	1.අවශ්‍ය අරමුදල් වෙන් කිරීම තුළින් 2023 වන විට එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලවල විනෝදාත්මක හා සංස්කෘතික පහසුකම් සහ සෞන්දර්යාත්මක පරිසරය වැඩිදියුණු කිරීම.	විශ්වවිද්‍යාල 15 හි සම්පත් භාවිතය සහ සම්පත් ලබා ගැනීම පිළිබඳ සමීක්ෂණය.	- එකතු කරන ලද/වැඩිදියුණු කළ විනෝදාත්මක/සංස්කෘතික පහසුකම් සහ/හෝ වඩා හොඳ සෞන්දර්යාත්මක පරිසරයක් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	
		2. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ ඉගෙනුම් පරිසරය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම	විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයට බිත්ති කබඩ් සැපයීම සහ සවි කිරීම.	- රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා වාර්ෂික අයවැයේ ප්‍රතිශතය වැඩිවීම.
			UGC සංචාරක නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.	
			ආපනශාලා කවුන්ටරය අලුත්වැඩියා කිරීම	
			ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය සහ සමාලෝචනය	
			යටිතල පහසුකම් සහ මානව සම්පත් ලබා දීමෙන් උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම වැඩි කිරීම - අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සහ භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීම.	
		3. සියලුම විශ්වවිද්‍යාල සිසුන් සඳහා සාධාරණ සම්පත් ප්‍රවේශයක් ලබාදීම සඳහා වන මූලික පියවර හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.	රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	- සම්පත් ලබා ගැනීමේ/භාවිත කිරීමේ සමීක්ෂණයක් සාර්ථකව නිම කරන ලද රාජ්‍ය විශ්ව විද්‍යාල සංඛ්‍යාව. - විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සම්පත් සැලැස්මේ ඉම් ලකුණු සලකුණු කිරීම.

		4. උසස් අධ්‍යාපන ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් කාලෝචිත අරමුදල් ගලායාම වැඩිදියුණු කිරීම.	රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	- වසරකට පවත්වනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව. - වසරකට උසස් අධ්‍යාපන ආයතන වෙත සිදු කරන ක්ෂේත්‍ර චාරිකා ගණන. - වසරක් තුළ භාණ්ඩාගාරය /උසස් අධ්‍යාපන අමාත්‍යාංශය / කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව - වසරක් තුළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විශ්වවිද්‍යාල මූල්‍යකරණය පිළිබඳ ප්‍රගති වාර්තා සංඛ්‍යාව
		5. අභිරුචිකරණය කරන ලද මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) හඳුන්වා දීමෙන් මූල්‍ය කාර්යයන් උපාය මාර්ගික කළමනාකරණයට පහසුකම් සැලසීම.	UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම ශක්තිමත් කළ ලේඛන කළමනාකරණ පද්ධතිය මූල්‍ය අංශය තුල 5 S ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.	- UGC හි මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) තිබීම.
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 03:** ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය	1.වැඩසටහන්වල අදාලත්වය සහතික කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන පරිදි නව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය කිරීම සහ දැනට පවතින පාඨමාලාවල	ශ්‍රම වෙළෙඳපොළ නිරීක්ෂණ අනුව පවතින අධ්‍යයන පාඨමාලා ප්‍රතිව්‍යුහගත කිරීම. ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම.	- වෙළඳපොළ ඉල්ලුම් ප්‍රවණතා සපුරාලීමට අනුමත කරන ලද, නව වෙනස්කම් කරන ලද උපාධි පාඨමාලා ප්‍රතිශතය. - නව උපාධි වැඩසටහන් සඳහා මාර්ගගත යෝජනා ඉදිරිපත් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ

	උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.	විෂයමාලාවන් සංශෝධනය කිරීම.	නව සහ පවතින උපාධි පාඨමාලා සඳහා වන යෝජනාවල ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව.	නව පීඨ/ අධ්‍යයනාංශ පිහිටුවීම. - ඉල්ලුම් වැඩි දියුණු කිරීම සහ වෙළඳපල අදාළත්වය සහතික කිරීම සඳහා දැනට පවතින සංශෝධනය කර ඇති අධ්‍යයන පාඨමාලා සංඛ්‍යාව.
			නව උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා UGC හි මාර්ගගත ක්‍රමය අනුගමනය කිරීමට පහසුකම් සැලසීම.	
		2. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	උපාධි පාඨමාලා බෙදාහැරීමේ ක්‍රමවලට අදාළ උසස් අධ්‍යාපන ආයතනයන් හි වර්තමාන තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පාර්ශ්වීය ප්‍රවේශ/ ඉගෙනුම් අධ්‍යයන සම්භාර පැවරුම් ප්‍රතිපාදන අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ගණන.
			පාර්ශ්වීය ප්‍රවේශ (lateral entry) සහ පෙර ඉගෙනුම් අධ්‍යයන සම්භාර හුවමාරුව හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ.	
			උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	
		3. උපාධි අපේක්ෂක සිසුන්ගේ පුද්ගලික සහ අවශ්‍ය කුසලතා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක (CGU) හරහා ව්‍යුහගත සැලසුම් ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකකවල කාර්ය සාධනය බැලීමට ලකුණු කාඩ්පත් පද්ධතිය සකස් කිරීම.	- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවල පීඨ වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හරහා උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලද පුද්ගලික හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් ගණන. - විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක
			කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුහුණු අවස්ථා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකක වෙත පුහුණුව ලබා දීම.	

			UTEL පරීක්ෂණ සේවාව ස්ථාපිත කිරීම.	හි උපදේශකයින්/ කාර්ය මණ්ඩලය සඳහා UGC විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සහ/හෝ වැඩමුළු ගණන. - වාර්ෂිකව ශිෂ්‍ය උපදේශකයින්/උපදේ ශකයින් ලෙස පත් කෙරෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) පවත්වන කුටි සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීම. - සමස්ත විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක ශිෂ්‍ය ජනගහනයෙන් වසරකට UTEL පරීක්ෂණවලට පෙනී සිටින සිසුන්ගේ ප්‍රතිශතය.

		4. කියවීමේ පුරුද්දේ වැදගත්කම වැඩි දියුණු කිරීම සහ විශ්ව විද්‍යාල තුළ පවතින විද්‍යුත් පුස්තකාල පද්ධති සහ අනෙකුත් පහසුකම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම.	UGC හි අනුග්‍රහය යටතේ ජාතික ඩිජිටල් පුස්තකාල එකතුව.	- පර්යේෂණ දත්ත සමුදායන්, රචනා සොරකම් (plagiarism) පිලිබඳ මෘදුකාංග සහ විද්‍යුත් පොත්වල ශිෂ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
			විද්‍යුත් පුස්තකාලවලට අදාළ උසස් අධ්‍යාපන ආයතනයන් හි වත්මන් තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	
		5. කොමිෂන් සභා වක්‍රලේඛ 933 හි සඳහන් පරිදි ශිෂ්‍ය ආධාර සේවා ශක්තිමත් කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිසුන්ගේ ඉගෙනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම.	ශිෂ්‍ය සහාය පද්ධතිවල පවතින තත්ත්වය හඳුනාගෙන ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම.	- ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 933 කොමිෂන් සභා වක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම.
			තත්ත්ව ආරක්ෂණ කටයුතු සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.	
		6. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායී විශ්වවිද්‍යාල-කාර්මික හවුල්කාරිත්වයක් ඇති කිරීම, ගෝලීය සහ ජාතික අවශ්‍යතා ඇති ක්ෂේත්‍රවල පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා සිසුන් සවිබල ගැන්වීම.	උපාධිධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා තිරසාර ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට සහ කුසලතා නොගැලපීම අඩු කිරීමට දායක වීමට UGC හි ස්ථාවර කමිටු වෙත පුද්ගලික අංශයේ නියෝජිතයන් ඇතුළත් කිරීම.	- පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පිහිටුවා ඇති ක්‍රියාකාරී විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි සංඛ්‍යාව.
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.	- රාජ්‍ය/පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්ව සංවිධානය කරන ලද

			පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට විද්වතුන්ට ආරාධනා කිරීම.	UGC පහසුකම් සපයන මහජන දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව
			පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසිද්ධ විදේශීය විශ්වවිද්‍යාල හඳුනා ගැනීම.	
			තරුණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීමට අවස්ථා ලබා දීම සහ දිරිගැන්වීම.	
			කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සඳහා පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් සපයනු ලබන උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය ඉහළ නැංවීම.	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට/ සිසුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල සේවාවන්හි අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ තක්සේරුවේදී අවම වශයෙන් 80% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා හරහා උසස් අධ්‍යාපන ආයතන සමඟ සබඳතා ඇති කර ගැනීමට බාහිර පාර්ශ්වකරුවන්ට අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිදානයේ බාහිර පාර්ශ්වකරුවන්ගේ තක්සේරුවෙහි අවම වශයෙන් 75% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
		8. UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන	විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.	- කාර්ය සාධන ලකුණු කාඩ්පත සඳහා 75%කට වඩා වැඩි

		සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල බව අඛණ්ඩව පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ සංවර්ධනය තුළින් සහතික කිරීම.	පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම.	ප්‍රමාණයක් ලබා ගත් UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක (IQAU) ප්‍රතිශතය
			ආයතනික සමාලෝචන පැවැත්වීම.	- SLQF අනුව සිතියම්ගත කර ඇති උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර උපාධි, බාහිර උපාධි සහ පශ්චාත් උපාධි) උපාධි වැඩසටහන් ප්‍රතිශතය.
			ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) අනුව දැනට පවතින සියලුම අධ්‍යයන පාඨමාලා සංශෝධනය කර නැවත නම් කිරීම සහ ඒ අනුව අත්පොත යාවත්කාලීන කිරීම.	- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන (නව සහ 25% 75% 100% උසස් කරන ලද යන දෙකම ඇතුළුව) විෂයයන් සඳහා සකස් කර ඇති අවශ්‍ය ඉම් ලකුණු ප්‍රකාශවල ප්‍රතිශතය.
			SLQF 2015 අනුව විශ්වවිද්‍යාල සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			සාගර විශ්වවිද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර ප්‍රමිතියට ඉහල නැංවීමට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.	- වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි ආයතනික සමාලෝචන වාර්තා ගණන. - වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි වැඩසටහන් සමාලෝචන වාර්තා ගණන.

ගුණාත්මක අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවම යේ සමානතාව	**ඉලක්ක අංක 04:** කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.	1. ඉදිරි වසර 5 තුළ විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සෑම තරාතිරමකම හැකි උපරිම දක්ෂතා ඇති විවිධ ශ්‍රම බලකායන් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි මානව ප්‍රාග්ධනයේ නිපුණතා සහ විශේෂඥතාව වර්ධනය කිරීම. කාර්ය මණ්ඩල කාණ්ඩ බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම.	- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම කාර්ය මණ්ඩලවල බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම. - සුදුසුකම් තහවුරු කිරීමේ පළමු උත්සාහයේදීම සේවයේ ස්ථීර කරන ලද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය.
		2. පුහුණුව හා සංවර්ධනය තුළින් දැනට සිටින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය තුළ ඇති විභව දක්ෂතා හඳුනාගැනීමට හා ඒවා පෝෂණය කිරීම සඳහා ක්‍රියා කිරීම ආරම්භ කිරීම.		- දේශීය රැකියා ආශ්‍රිත පුහුණුව සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය - විදේශ රැකියා ආශ්‍රිත පුහුණුවක් සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය. - UGC හරහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පරිපාලන කාර්ය මණ්ඩලයට UGC හරහා ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පශ්චාත් උපාධි සහ/හෝ වෘත්තීය සුදුසුකම් ඇති පරිපාලන නිලධාරීන්ගේ ප්‍රතිශතය.

		3. අඩු කාර්ය සාධනයක් සහිත කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව වැඩි කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාකාරී ලෙස වැඩිදියුණු කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාශීලීව ඉහළ නැංවීමට සහ ඌන කාර්ය සාධන කාර්ය මණ්ඩලය අඩු කිරීමට පද්ධතිය සමාලෝචනය කිරීම.	- ආවර්තිතා කාර්ය සාධන ශ්‍රේණිගත කිරීමවල මුළු ලකුණු 5 ක් වූ මිනුමෙන්, අවම වශයෙන් ලකුණු 3ක් ලබා ගන්නා කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - සේවක සුභසාධනය සහ තෘප්තිය පිළිබඳ සමීක්ෂණයකදී > 75% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව. - UGC හි නීති අංශය විසින් මෙහෙයවනු ලබන සේවකයන් සම්බන්ධ නීති/උසාවි නඩු ගණන.
		4. විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පීඩාවකින් සහ වෙනස් කොට සැලකීමකින් තොරව තම කටයුතු කරගෙන යාමට ඉඩ සලසන සංස්කෘතියක් සහ පරිසරයක් විශ්වවිද්‍යාල තුළ ඇති කිරීමට පහසුකම් සැලසීම.	සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය සහ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සුදුසු ව්‍යුහයන්/පද්ධති පිහිටුවීම/ සංවර්ධනය කිරීම සඳහා උපදේශනාත්මකව පහසුකම් සැලසීම. පර්යේෂණ - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) මර්දනය කිරීම සඳහා මැදිහත්වීම් සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම / යෝජනා කිරීම (UNICEF අරමුදල් තුලින්).	- නවක වදයෙන් තොර, විශ්වවිද්‍යාල තුළ හිතකර සහ ආරක්ෂිත ඉගෙනුම් පරිසරයක් පිළිබඳව සිසුන් විසින් කළ ඇගයීම්වල තෘප්තිමතභාවයේ ප්‍රතිශතය. - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් (SGBV) නිදහස් විශ්වවිද්‍යාල පරිසරයක් පිළිබඳව සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ තෘප්තිමත් බවේ ප්‍රතිශතය.

			නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ එහි සමාජීය සහ නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මුද්‍රිත සහ / හෝ විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් නවක වදයට සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමේ වැඩසටහන් සම්බන්ධ ප්‍රචාරණය.	
			විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම/ශක්තිමත් කිරීම සහ සිසුන් සහ කාර්ය මණ්ඩල ජනතාව අතර නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට අදාලව දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කිරීම සහ පැමිණිලි/වාර්තා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම.	
			සියලුම උසස් අධ්‍යාපන ආයතන වෙතින් නවක වදය ඉවත් කිරීමට පහසුකම් සැලසීම.	

		5. විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සිටින අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව සහ වෘත්තීය සංවර්ධනය සඳහා පැහැදිලි මහ පෙන්වීමක් සහ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම.	පරිපාලන සහ අනෙකුත් විධායක නිලධාරීන්ට පශ්චාත් උපාධි සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට පහසුකම් සැලසීම.	- වෘත්තීය සහ කළමනාකරණ කුසලතා සංවර්ධනය ඉලක්ක කරගත් අභිරුචි කළ වැඩසටහන් හරහා වාර්ෂිකව පුහුණු කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව.
			පවතින ක්‍රියා පටිපාටි සමාලෝචනය කර අධ්‍යයන ආයතන කාර්යයන් සඳහා වඩා හොඳ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම.	
		6. විවිධ හැකියාවන් ඇති සිසුන් සඳහා මිත්‍රශීලී පරිසරයක් ඇතුළු පහසුකම් සඳහා වන ප්‍රමිතීන් සහිත දේශන කාමර සහ විද්‍යාගාර ඇතුළු විශ්වවිද්‍යාල පහසුකම් නවීකරණය කිරීම සඳහා පුළුල් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාලවල සිටින සියලුම ආබාධිත සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට ප්‍රවේශ්‍යතා ප්‍රතිපාදන සැපයීමට උපදෙස් නිකුත් කිරීම.	- 50% ට වැඩි නවීකරණය කරන ලද සහ විවිධ ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රවේශය සහිත උසස් ප්‍රමිතියෙන් යුත් දේශන කාමර/ රසායනාගාර පහසුකම් සහිත විශ්වවිද්‍යාල සංඛ්‍යාව.
			විවිධ ආබාධ සහිත සිසුන් පොදු විභාගවලට මුහුණ දෙන විට ඔවුන්ට උපකාර කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් පැවැත්වීම.	
			දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය ජාත්‍යන්තර මට්ටමින් සන්නාමගත කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන අතර සංවෘත හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.	
			නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇතිකිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.	

		7. උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම්, ඉගෙනුම් පරිසරය සහ කාර්ය මණ්ඩල සේවා අවශ්‍ය ප්‍රමිතීන්/මට්ටම්වලින් සාක්ෂාත් කර ගැනීමට සහ පවත්වා ගැනීමට අවශ්‍ය පියවරයන් සමඟින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ශක්තිමත් තත්ත්ව ආරක්ෂණ සංස්කෘතියක් ගොඩනැගීම.	විශ්වවිද්‍යාල නිරීක්ෂණය කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ මණ්ඩල වෙත විදේශීය තත්ත්ව ආරක්ෂණ විශේෂඥයින් හඳුන්වා දීම.	- උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම් / ඉගෙනුම් පරිසරය / ඉගැන්වීමේ ගුණාත්මකභාවය / උපකාරක සේවා පිළිබඳ ශිෂ්‍ය තෘප්තිමත්බව පිළිබඳ සමීක්ෂණයකින් > 80% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව
			උසස් අධ්‍යාපන ආයතනයන්හි ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා සියලුම ඉගැන්වීම් මොඩියුලවල ගුරු-ශිෂ්‍ය අනුපාතයේ වත්මන් සම්මතයන් සමාලෝචනය කිරීම.	
			විශ්වවිද්‍යාලවල පීඨ හා අධ්‍යයනාංශ තුල දේශන ශාලා/ රසායනාගාර බෙදාගැනීමේ යාන්ත්‍රණය. උදාහරණයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාගාරයේ තාක්ෂණ පීඨය මෙම මූලධර්මය අනුගමනය කළේය.	
			පීඨ/විශ්වවිද්‍යාලවලට වාර්ෂික සිසුන් බඳවා ගැනීම් වැඩි කිරීම.	
		8. තිරසාර විසඳුම් භාවිතා කරන විශ්වවිද්‍යාල ප්‍රජාවන් සමඟ පාරිසරික වශයෙන් සෞඛ්‍ය සම්පන්න සහ හරිත උසස් අධ්‍යාපන ආයතන ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම.	හරිත සංකල්පය ප්‍රවර්ධනය කරන අතරම අනාගත ව්‍යාපෘති ගොඩනැගීමේදී පරිසර හිතකාමී වීමට උපදෙස් නිකුත් කිරීම.	- විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන පරිශ්‍රයන් තුළ නව ගස් 5,000ක් සිටුවීමට සහ ඒවා රැකබලා ගැනීමට සැලසුම් කිරීම.
			හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා UGC ලේකම් කාර්යාලයේ ස්ථාන හඳුනා ගැනීම.	- අවම වශයෙන් තම විදුලි පරිභෝජනයෙන් 25%ක් සඳහා

			තාක්ෂණ පීඨ "සුහුරු පීඨ" ලෙස පරිවර්තනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් පැවැත්වීම.	පුනර්ජනනීය සූර්ය බලශක්තිය භාවිතා කරන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව. - තම පරිශ්‍රය තුළ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් භාවිතා කරන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව. - රාජ්‍ය පද්ධතිය තුළ ඇති කඩදාසි භාවිතය > 50% අඩු කල විශ්වවිද්‍යාල සංඛ්‍යාව - රාජ්‍ය විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් සහභාගිවන්නන් සඳහා UGC විසින් පවත්වනු ලබන වීඩියෝ සම්මන්ත්‍රණ රැස්වීම්වල ප්‍රතිශතය. - සිසුන්ගේ/කාර්ය මණ්ඩලයේ පාරිසරික වගකීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා UGC විසින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්වනු ලබන හරිත සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව. - හිරසාර/හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා UGC හි මුදල් අංශය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග සංඛ්‍යාව.

ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 05 :** ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන් ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.	1. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය වීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මෙන්ම UGC/උසස් අධ්‍යාපන ආයතනවල ආයතනික සංග්‍රහය හා ආයතනික නියමාවලින් සහතික කිරීම.	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය විය යුතු පරිදි පනත සංශෝධනය කිරීම.	- වර්තමාන හා අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතාවන්ට සරිලන පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය සහ ආයතනික නියමාවලීන් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.
			උසස් අධ්‍යාපන පනත නැවත ප්‍රතිශෝධනය කිරීම සහ සංශෝධනය කිරීම.	
			වර්තමාන සහ අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ගැළපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල නියමාවලීන් සංශෝධනය කිරීම.	
		2. UGC හි විනිවිදභාවය වැඩි දියුණු කරන සහ පරිපාලන/නියාමන භූමිකාවට පහසුකම් සපයන පද්ධති, ප්‍රතිපත්ති සහ තාක්ෂණික ආධාර හඳුන්වා දීම.	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය වන පරිදි පනත සංශෝධනය කිරීම.	- සියලුම උසස් අධ්‍යාපන ආයතනවල සජීවී දත්ත සමඟ ඒකාබද්ධ සහ ආරක්ෂිත කළමනාකරණ දත්ත පද්ධති සංවර්ධනය කිරීම. - උසස් අධ්‍යාපන ආයතන සඳහා එම ආයතනවල ප්‍රගතිය සහ අනුකූලතාවය UGC සිට දුරස්ථව නිරීක්ෂණය කළ හැකි පරිදි තොරතුරු තාක්ෂණ පදනම් කරගත් වත්කම් සහ යටිතල පහසුකම් නඩත්තු පද්ධතිය ක්‍රියාත්මක කිරීම. - විශ්වවිද්‍යාල පාලක සභා සඳහා පත් කරන ලද සාමාජිකයින්
			උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය විය යුතු ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම.	
			පරිගණකගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම.	
			විශ්වවිද්‍යාල පාලක සභා සඳහා පත් කරන ලද සාමාජිකයින් සඳහා ඉම් ලකුණු ක්‍රමයක් හෝ සුදුසුකම් නිර්ණායක සකස් කිරීම.	

			විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම	සඳහා ඉම් ලකුණු ක්‍රමයක් හෝ සුදුසුකම් නිර්ණායක සකස් කිරීම.
			තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම	
		3. යහ කළමනාකරණ භාවිතයන් සහ පාලනය ශක්තිමත් කරන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විනිවිදභාවය සහ අධ්‍යයන වගවීම සක්‍රීය කිරීම	අධ්‍යයන වගවීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ සකස් කිරීම.	- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අවම වැඩ සම්මතයන් සහ ආචාර ධර්ම හඳුන්වා දීම සහ ලේඛනගත කිරීම.
		4. UGC හි විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය විසින් සකසන ලද අතිශය රහසිගත දත්තවල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම.	මාර්ගගත යෙදවුම් පද්ධතිය උසස් කිරීම.	- UGC හි විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
			නව මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම.	
			විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය සඳහා නව ආරක්ෂක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.	
		5. යහපාලනය වැඩිදියුණු කිරීම සඳහා අද්විතීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් සහ ක්‍රියා පටිපාටි හඳුන්වා දීම	සම්මත ගිණුම්කරණ සහ වාර්තාකරණ ආකෘතිය - පොදු වැටුප් ගෙවීම් පද්ධතිය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.	- UGC/උසස් අධ්‍යාපන ආයතනයන් හි මූල්‍ය කාර්යයන් සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද සම්මත වාර්තාකරණ ආකෘති (SRFs) ගණන. - UGC/ උසස් අධ්‍යාපන ආයතනයන් හි මූල්‍ය කාර්යයන් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) හඳුන්වාදීම.

		6. 2023 වන විට UGC සහ උසස් අධ්‍යාපන ආයතනයන් සඳහා ප්‍රතිචාරාත්මක මූල්‍ය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම.	UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම.	- පරිගණකගත විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් සහ සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියක වැඩිදියුණු කළ අනුවාදයක් ක්‍රියාත්මක කිරීම. - විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නියමාවලියක් හඳුන්වා දීම.
		7. එක් එක් විශ්වවිද්‍යාලවල පීඨ මට්ටමින් ආදි ශිෂ්‍ය ප්‍රජාවන් සමඟ ජීවිත කාලය පුරාවටම, අර්ථවත් සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සබඳතා ඇති කර ගැනීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ පාර්ශ්වකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායක සබඳතා සමඟ සබඳතා ශක්තිමත් කිරීම.	- ජයග්‍රහණ සහ අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගය දක්වන ආදි ශිෂ්‍ය සංගම් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පීඨ ප්‍රතිශතය.

ඇමුණුම්

ඇමුණුම I

2020 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක

කාර්ය මණ්ඩල කාණ්ඩය		වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම	තුපුහුණු	U-PL 1	44	39	5
	අර්ධ පුහුණු	U-PL 2	3	1	2
	පුහුණු	U-PL 3	18	15	3
ද්විතියික මට්ටම	කළමනාකරණ සහකාර	U-MN 1	154	119	35
	කළමනාකරණ සහකාර (IT)	U-MT 1	4	2	2
	සහකාර නිලධාරී කාණ්ඩය .b	U-MN 2	2	2	0
	සහකාර නිලධාරී කාණ්ඩය .a	U-MN 3	2	1	1
	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර	U-MN 4	25	25	0
තෘතීයික මට්ටම	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය. 2	U-AS 1	3	1	2
	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය. 1	U-AS 2	6	4	2
	විධායක (කණිෂ්ඨ මට්ටම)	U-EX 1	18	10	8
ජ්‍යෙෂ්ඨ මට්ටම	විධායක (මධ්‍යම මට්ටම)	U-EX 2	29	27	2
	විධායක (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-EX 3	8	5	3
	අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 1 සිට U-AC 2	2	0	2
	අධ්‍යයන කාර්ය මණ්ඩලය (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-AC 3සිට U-AC 5	7	4	3
			325	255	70

විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2019/2020

ඇමුණුම II

සාමාන්‍ය ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තේරුණු ශිෂ්‍ය සංඛ්‍යාවන්

දිස්ත්‍රික් සහ අධ්‍යයන පාඨමාලාවන්හි වර්ගීකරණය (නව සහ පැරණි විෂය නිර්දේශය)

අධ්‍යයන පාඨමාලාව	කොළඹ	ගම්පහ	කළුතර	මාතලේ	මහනුවර	නුවර එළිය	ගාල්ල	මාතර	හම්බන්තොට	යාපනය	කිලිනොච්චි	මන්නාරම	මුලතිව්	වවුනියාව	තිකුණාමලය	මඩකලපුව	අම්පාර	පුත්තලම	කුරුණෑගල	අනුරාධපුර	පොළොන්නරුව	බදුල්ල	මොනරාගල	රත්නපුර	කෑගල්ල	එකතුව
වෛද්‍ය විද්‍යාව	298	172	96	34	126	51	120	78	57	102	7	6	6	19	30	39	50	66	124	58	31	58	29	59	108	**1824**
දන්ත ශල්‍ය විද්‍යාව	37	6	5	2	4	3	8	5	3	2	2	2	2	2	2	3	2	3	5	4	2	3	3	3	5	**118**
පශු වෛද්‍ය විද්‍යාව	26	7	5	2	17	3	7	7	3	4	3	2	2	2	2	2	3	3	5	4	3	3	3	5	4	**127**
කෘෂිකර්මය	96	74	44	26	69	34	59	33	22	43	5	5	4	5	13	20	25	26	81	27	14	29	15	42	46	**857**
ආහාර විද්‍යාව හා පෝෂණය	14	16	11	2	7	4	7	10	11	7	2	2	2	2	4	7	6	5	12	5	3	5	3	6	8	**161**
ජෛවීය විද්‍යාව	307	174	96	28	143	39	102	71	41	44	7	7	5	10	22	32	41	52	136	51	23	59	26	60	91	**1667**
ව්‍යවහාරික විද්‍යාව(ජෛවීය විද්‍යාව)	66	36	25	7	51	11	30	28	9	8	3	2	2	2	6	9	11	12	33	13	7	15	7	23	19	**435**
ඉංජිනේරු විද්‍යාව	355	210	104	34	144	57	139	123	73	102	10	9	10	15	36	46	60	68	159	83	32	81	39	82	111	**2182**
ඉංජිනේරු විද්‍යාව (EM)	9	3	2	2	5	2	4	4	2	10	4	2	2	2	2	2	2	2	2	3	2	2	2	2	3	**77**
ඉංජිනේරු විද්‍යාව (TM)	13	5	3	2	4	2	12	10	3	4	2	2	2	2	2	2	3	2	5	2	2	2	2	3	4	**95**
ප්‍රමාණ සමීක්ෂණය	24	10	5	3	6	3	13	6	3	15	2	2	2	3	2	3	3	4	20	4	2	4	2	3	6	**150**
පරිගණක විද්‍යාව	117	53	33	8	34	15	56	51	20	25	2	2	3	4	7	11	14	17	51	19	8	18	9	15	25	**617**
භෞතික විද්‍යාව	423	252	145	33	154	55	156	113	94	73	9	10	7	13	28	43	65	62	201	70	31	81	35	76	97	**2326**
මැනුම් විද්‍යාව	10	11	9	3	8	4	12	12	15	16	2	2	2	2	3	5	4	4	15	5	2	4	2	3	7	**162**
ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව)	105	77	45	13	51	20	67	55	43	22	4	3	2	7	10	18	19	22	64	24	11	26	13	30	37	**788**
කළමනාකරණය	792	606	311	87	323	152	316	231	155	142	30	21	23	37	89	110	150	202	377	228	98	190	113	203	284	**5270**
දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	7	4	3	2	3	3	4	2	4	2	2	2	2	2	3	2	3	3	4	6	2	5	4	5	6	**85**
වාණිජ්‍යය	190	82	42	20	53	22	54	36	25	17	3	3	4	10	13	15	20	23	56	35	15	29	14	41	47	**869**
කලා	339	393	404	159	306	125	495	394	342	280	61	53	77	65	162	189	271	268	601	401	120	292	236	314	473	**6820**
කලා (SP)- ජනමාධ්‍ය	18	13	7	3	8		8	6	1								3	2	13	2	3	10		4	7	**108**

අධ්‍යයන පාඨමාලාව	කොළඹ	ගම්පහ	කළුතර	මහනුවර	මාතලේ	නුවරඑළිය	ගාල්ල	මාතර	හම්බන්තොට	යාපනය	කිලිනොච්චි	මන්නාරම	මුලතිව්	වවුනියාව	පුත්තලම	මඩකලපුව	අම්පාර	ත්‍රිකුණාමලය	මඩුලුසීමා	බදුල්ල	මොණරාගල	රත්නපුර	කෑගල්ල	ධිවෙහිගම
කලා (SAB)	25	29	28	2	10	3	31	54	9	1			1	1		1	3	5	29	12	2	11	9	16	21	**303**
කළමනාකරණ අධ්‍යයන - (TV)	31	30	28	11	19	11	22	32	12	23	4	4	5	4	9	18	22	17	44	19	11	16	19	20	21	**452**
වාස්තු විද්‍යාව	17	12	3	2	9	2	5	5	3	3		1			1	2	3	5	9	4	1	4		4	2	**97**
නිර්මාණවේදය	24	9	4		11	1	4	4			1			1					7	1		2	1	6	8	**84**
නීතිය	61	50	32	8	28	11	26	21	15	12	2	4	2	4	8	13	15	18	32	26	12	26	11	17	37	**491**
තොරතුරු තාක්ෂණය (IT)	40	21	14	3	11	6	24	21	11	16	3	2	2	2	4	5	6	7	12	7	4	6	4	7	10	**248**
කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT) (KLN)	18	15	8	2	5	1	8	10	3	3		1		2	2	3	2	2	12	4	1	4	2	3	5	**116**
කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	15	11	6	2	5	4	5	3	5	4	2	2	2	2	3	2	4	3	7	4	4	6	3	2	5	**111**
සන්නිවේදන අධ්‍යයනය	5	5	9	15	10	3	20	20	11			1			3	2	2	9	24	15	3	13	12	6	9	**197**
නගර හා ග්‍රාම නිර්මාණය	10	9	2	3	3	3	9	3	2	2	2	2	2	2	2	2	2	3	4	2	2	4	2	2	6	**85**
සාමය හා ගැටුම් නිරාකරණය	2		1	3	2	2	2	1	1						2				6			3	2	3	3	**33**
ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	47	38	25	6	23	10	28	28	18					2	5		9	16	31	15	5	19	10	15	29	**379**
යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	4	5	2	2	4	2	4	2	2	2	2	2	2	2	4	10	16	4	3	2	2	2	2	2	2	**86**
විලාසිකා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	24	10	6	1	8		7	4	1	1									6			5			3	**76**
ආහාර විද්‍යාව හා තාක්ෂණය	34	25	19	4	12	5	15	17	6	6	2	2	2	2	4	4	6	6	24	6	3	7	3	10	9	**233**
සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	18	15	8	3	9	6	5	7	3	44	6	3	5	4	6	31	19	8	13	7	4	7	2	7	4	**244**
භෙද	55	54	25	10	27	14	47	27	22	25	4	3	3	3	10	18	17	22	42	17	7	18	19	19	26	**534**
තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	26	14	14	8	21	6	21	9	6	41	1	1	1	3	4	12	14	10	33	7	3	8	1	10	8	**282**
කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය	20	17	12	4	22	5	13	11	7	6	2	2	2	2	3	4	8	8	19	8	4	10	5	12	12	**218**
කලා (sp) / ප්‍රසාංගික කලා	10	4	5	1	6		12	12	5									1	15	6	4	7	1	11	7	**107**
සෞඛ්‍ය ප්‍රවර්ධනය	8	6	4	2	7	3	3	6	3	2	3	2	2	4	2	7	4	3	8	3	2	5	2	5	4	**100**
ඖෂධ විද්‍යාව	20	16	10	4	8	5	13	12	7	24	2	2	3	2	6	7	11	7	22	6	4	7	3	8	15	**224**

අධ්‍යයන පාඨමාලාව	කොළඹ	ගම්පහ	කළුතර	මාතලේ	මහනුවර	නුවර එළිය	ගාල්ල	මාතර	හම්බන්තොට	යාපනය	කිලිනොච්චි	මන්නාරම	මුලතිව්	වවුනියාව	තිකුණාමලය	මඩකලපුව	අම්පාර	පුත්තලම	කුරුණෑගල	අනුරාධපුර	පොළොන්නරුව	බදුල්ල	මොනරාගල	කෑගල්ල	රත්නපුර	එකතුව
වෛද්‍ය රසායනාගාර විද්‍යා	30	16	10	5	14	6	14	16	5	14	2	2	2	2	6	6	6	6	21	6	4	6	3	6	13	**221**
විකිරණ ශිල්පය	3	4	2	2	4	2	2	2	3	4	2	2	2	2	2	2	4	2	5	2	2	2	2	3	3	**65**
භෞත චිකිත්ස	16	5	6	2	5	2	11	4	3	5	2	2	2	2	2	2	2	3	7	3	2	3	2	3	3	**99**
පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	14	8	3	2	5	3	10	7	5	3	2	2	2	2	2	2	2	2	8	4	2	4	3	5	4	**106**
පහසුකම් කළමනාකරණය	7	4	3	2	3	2	6	8	4	2	2	2	2	2	2	2	2	2	3	3	2	4	3	2	4	**78**
ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	17	6	3	2	4	2	9	4	2	2	2	2	2	2	2	2	2	3	5	3	2	2	2	3	3	**88**
අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව	14	3	2	2	7	2	4	4	2	3	2	2	2	2	2	2	2	3	3	2	2	3	2	3	2	**77**
කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	20	11	7	2	6	2	8	6	4	2	2	2	2	2	2	2	3	3	12	3	2	3	3	3	6	**118**
සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	6	5	4	2	8	2	3	2	3	7	2	2	2	2	2	2	2	2	6	2	2	2	2	2	2	**76**
පරිගණනය හා කළමනාකරණය	6	4	4	2	5	2	3	2	3	3	2	2	2	2	2	2	2	4	3	3	2	2	2	3	5	**72**
ධීවර සහ සාගර විද්‍යාව	17	11	6	2	11	4	8	5	3	2	2	2	2	2	2	2	3	3	6	3	3	6	3	3	6	**117**
ඉස්ලාම් අධ්‍යයනය	5	17	17	11	35	2	3	1	1	1		2		2	25	21	49	16	33	16		1	2	10	5	**275**
විද්‍යාව සහ තාක්ෂණය	12	6	7	3	7	2	6	4	4	6	2	2	2	2	2	4	4	3	9	3	2	2	2	4	5	**105**
පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	6	6	3	2	4	2	8	7	4	18	2	2	2	2	2	3	4	2	3	3	1	2	2	3	5	**98**
ව්‍යවසායකත්වය හා කළමනාකරණය	9	9	8	4	6	2	7	6	4	3	1	2	1	2	1	2	2	3	7	4	2	3	2	5	3	**98**
